
කොවිඩ් ව්‍යාප්තිය




★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වෂී 2564ක් වූ බක් අව දොළොස්වක ලත් ශනි දින | කාණ්ඩය 112 | පත්‍රය 121 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මැයි 08 සෙනසුරාදා




යොවුන් පුවත අද පත්‍රය සමඟ



## අධිවේගවල යමින් ඇතැමුන් බැන්නත් අප තැබූ පියවර ගැන අපට සතුටුයි

පිට 6

රුවන්පුර අධිවේගයේ වැඩ අරඹමින් අගමැති කියයි

## ලෝක සංචාරක ව්‍යාපාරය 73%කින් බිඳ වැටෙයි

පිට 6

රැකියා ලක්ෂ 620ක් අහිමියි | ජී 20 සංවිධානය කියයි

# ලෝක සෞඛ්‍ය සංවිධානය ඇස්ට්‍රාසෙනෙකා ඉතිරිය සපයා ගැනීමට උදවු කරයි

ජනපතිගෙන් ට්විටර් සටහනක්

'සයිනොෆාම්' රටවල් 51ක සාර්ථකයි

බස්නාහිරට විශේෂ අවධානයක් දෙන්න

කොවිඩ් කමිටුවට ජනපති කියයි

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකාවේ ජනතාවට ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවැනි මාත්‍රාව දීමට අවශ්‍ය මාත්‍රා ලක්ෂ 6 සපයා ගැනීමට ලෝක සෞඛ්‍ය සංවිධානය උදවු කරනු ඇතැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ට්විටර් පණිවිඩයක් තබමින් ප්‍රකාශ කර සිටී. පිට 6

# යහපාලන ආණ්ඩුව මිල්ලනිය-බිංගිරිය අපනයන කලාපවලට ගිවිසුම් නැතිව කෝටි 248ක් ගෙවලා

ධනුෂ්ක ගොඩකුඹුර

යහපාලන ආණ්ඩුව සමයේ වැඩ ආරම්භ කරන ලද මිල්ලනිය සහ බිංගිරිය අපනයන සැකසුම් කලාප දෙකෙහි යටිතල පහසුකම් සැලසීම සඳහා ලිඛිත ගිවිසුම්වලට එළැඹීමකින් තොරව රුපියල් කෝටි 248ක මුදලක් ගෙවා ඇති බව හෙළිදරවු වී තිබේ.

යටිතල පහසුකම් සැලසීම වෙනුවෙන් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ ලංකා විදුලි බල මණ්ඩලය යන ආයතන වෙත ගිවිසුම්වලින් තොරව මෙසේ මුදල් ගෙවා ඇති බව විගණන වාර්තාවක් මඟින් හෙළිකොට ඇත. පිට 6



## 'සයිනොෆාම්' ලබන සතියේ සිට මෙරට ජනතාවට

පිට 6



අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සුරතින් ඊයේ (7) රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම් කටයුතු ආරම්භ විය. අගමැතිවරයා ඒ අවස්ථාව සඳහා එක් වූයේ අරලියගහ මැඳුරේ සිට වීඩියෝ තාක්ෂණයෙනි. එහිදී අගමැතිවරයාගේ සුරතින් අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ සමරු ඵලකය නිරාවරණය කළ අයුරු.

## ෆේස්බුක් ගිණුම් 17%කට අයිතිකරුවන් නැහැ

ශ්‍රී ලංකාවේ හිමිකරුවන් නොමැති බවට අනාවරණය කර ගෙන තිබෙන සමස්ත ෆේස්බුක් ප්‍රමාණයෙන් සියයට 17ක් පමණ වන ප්‍රමාණය අත්හිටුවීමට රජයේ අවධානය යොමුව තිබේ. පිට 6

## සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට අතිරේක ලේකම්වරු

ධනුෂ්ක ගොඩකුඹුර

සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණයට අමාත්‍යාංශ මට්ටමින් අතිරේක ලේකම් තනතුරු ස්ථාපිත කිරීමට ආණ්ඩුව සැරසෙයි. පිට 6

## කොවිඩ්

පිට 6

ෆයිසර් එන්නතට අනුමැතිය හිමි වෙයි

දින හතරට කොවිඩ් මරණ 49ක්

ලොව පුරා ආසාදිත ගණන කෝටි 15 ඉක්මවයි

ඉදිරි සතිය තීරණාත්මකයි

සෞඛ්‍ය අංශ අනතුරු අඟවයි

## සති 2ක් ඇතුළත ඉන්දියාවේ ගිය සංචාරකයන්ට ශ්‍රී ලංකාවට එම තහනම්

පිට 6

## නීතිපති ගැන ජනපතිගේ යෝජනාව සලකා බලන්න

ව්‍යවස්ථාදායක සභාව 13 දා රැස් වෙයි

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

නීතිපති ධුරය සඳහා ජනාධිපතිවරයා විසින් යෝජනා කරනු ලැබ ඇති නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සංජය රාජරත්නම් මහතා එම තනතුරට පත් කරන්නේ දැයි කරුණු සලකා බැලීම සඳහා ව්‍යවස්ථාදායක සභාව කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් එළඹෙන 13 දා රැස් වන බව පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතා පවසයි. පිට 6

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු ඉලක්කයෙන් 98%ක් සපුරයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2021 පළමු මාස 3 සඳහා දුන් බදු ආදායම් ඉලක්කයෙන් සියයට අනූඅටක් සපුරා අවසන් බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී ඇත. පිට 6

පිට 6

## තවත් විෂ පොල්තෙල් මෙට්‍රික් ටොන් 230ක් ආපසු යවයි

පිට 6

## සාම සාධක හමුදාවට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය අඩු නොකළ යුතුයි

එජාපය කියයි

සියලු අධ්‍යාපන ආයතන තවදුරටත් වැසේ පිට 6

## මුතුරාජවෙල රකින්න මහා සැලැස්මක්

## දියවන්නාවේ ජල දූෂණය පාලනයට කාර්යසාධන බළකායක්



# මන්නාරමේ දේව මැඳුරක වැඩ කරමින් සිටි පිරිසකට අකුණු සැර වැදිලා

**දිනසේන රතුගමගේ**

මන්නාරමේ මාන්තෙයි කුමනාන්කුලම් සාන්ත තෝමස් දේවස්ථානයේ අලුත්වැඩියා කිරීම්වල නිරතව සිටි පිරිසකට පෙරේදා (06) සවස අකුණු සැර වැදීම නිසා එක් අයෙකු පිලිස්සුම් තුවාල ලබා තිබේ.

මඳ වර්ෂාවක් පැවති අවස්ථාවේදී අකුණු සැර වැදී ඇති අතර ඒ අවස්ථාවේදී සේවකයන් තිදෙනකු මේ දේවස්ථානයේ ඉහළ මාලයක අලුත්වැඩියා කටයුතුවල නිරතව සිට ඇත.

අකුණු සැර වැදුණු පුද්ගලයාගේ තත්ත්වය බරපතළ නොවන බව මාන්තෙයි රෝහලේ වෛද්‍යවරු කියති.

අකුණු සැර වැදීම හේතුවෙන් ශාන්ත තෝමස් දේවස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථාන කීපයකට දැඩි අලාභ හානි සිදු වී තිබේ.

# නුගේගොඩ වැලි පාර්ක් හන්දියේ බසයක් ත්‍රිරෝද රථයක ගැටී දෙදෙනෙක් මරුට

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

නුගේගොඩ වැලිපාර්ක් හන්දිය අසලදී පෙරේදා (06) රාත්‍රී පෞද්ගලික බස් රථයක් සහ ත්‍රිරෝද රථයක් මුහුණට මුහුණ ගැටීමෙන් සිදුවූ අනතුරෙන් පුද්ගලයන් දෙදෙනකු මිය ගොස් තවත් අයකු බරපතළ තුවාල ලබා ඇත.

මිරිහාන පොලිස් වසමේ වැලිපාර්ක් හන්දියේදී කොළඹගේ මාවත දෙසට ධාවනය වූ පෞද්ගලික බස් රථයක් සරසවි උද්‍යාන මාවතෙන් පැමිණි මෝටර් රථයක ගැටී ඇත. පසුව බස් රථය මාර්ගයේ විරුද්ධ මංතීරුවට ගොස් ඉදිරියෙන් පැමිණි ත්‍රිරෝද රථයකද ගැටී ඉදිරියට ඇදී ගොස් තාප්පයක ගැටී ඇත.

අනතුරෙන් ත්‍රිරෝද රථයේ රියැදුරු සහ පිටුපස ගමන් කළ දෙදෙනකු තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමෙන් පසු රියැදුරු සහ එක් පුද්ගලයකු මියගොස් ඇත.

මෝටර් රථ රියැදුරු කළුබෝවිල රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටී.

අනතුරෙන් මියගොස් ඇත්තේ වයස අවුරුදු 54ක් සහ 30 වයස්වල පසුවන නුගේගොඩ සහ හපුතලේ පදිංචිකරුවෝ වෙති. මෘත ශරීර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියැදුරා අත්අඩංගුවට ගෙන ඇත. මිරිහාන පොලිසිය වැඩිදුර පරීක්ෂණ සිදුකරයි.

# කොරෝනා ආසාදනය වූවන්ට ප්‍රතිකාර කිරීමට දින දහයකින් ඇඳන් දස දහසක් ලබාදීමට පියවර

ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති **බැසිල් රාජපක්ෂ**

**රක්ෂණ ශ්‍රියන්ත**

කොරෝනා ආසාදනය වූවන්ට ප්‍රතිකාර කිරීමට දින දහයකින් ඇඳන් දස දහසක් ලබාදීමට කටයුතු කරන බව ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පැවසීය.

පෙරේදා (06) අරලියගහ මන්දිරයේ පැවති සාකච්ඡාවකට එක් වෙමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

ඒ අනුව දිස්ත්‍රික්ක 13ක් (කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුර, කෑගල්ල, පුත්තලම හා කුරුණෑගල) මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවද ඒ මහතා පැවසීය.

මෙහිදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ ආණ්ඩුකාරවරුන්ගේ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය මත මේ වැඩපිළිවෙළ සිදුකරන බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය. මේ ඇඳන් දසදහසට අමතරව දිස්ත්‍රික් මට්ටමින් අමතර ප්‍රතිකාර ස්ථාන හඳුනාගෙන ඒවාට අවශ්‍ය ඇඳන් ඇතුළු උපකරණ සැපයීමේ වගකීම දිස්ත්‍රික් සම්බන්ධිකරණ සභාපතිවරුන්ට පවරන ලදි. තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා තරුණ කටයුතු සංවිධාන සම්බන්ධ කරගනිමින් මේ මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නායකත්වය දීමට භාර ගත්තේය.

# පොලිස් වෙස් ගෙන වවුනියාවේ නිවාස දෙකකින් ලක්ෂ 20ක රන්බඩු කොල්ල කාලා

## සැකකරුවෝ තිදෙනා අත්අඩංගුවට

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

පොලිස් නිලධාරීන් ලෙස පෙනී සිට වවුනියාවේ නිවෙස් දෙකකින් රුපියල් ලක්ෂ තිහක් පමණ වටිනා ස්වර්ණාභරණ කොල්ලකෑමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් තිදෙනා වවුනියාව පොලීසිය විසින් පෙරේදා (06) අත්අඩංගුවට ගෙන තිබේ.

මේ සැකකරුවන් තිදෙනාගෙන් ප්‍රධාන මොළකරු හම්බන්තොට වීරකැටිය පොලීසියේ සේවය කොට රැකියාව අහිමි වූ අයෙකි. ඔහු විසින් එම පළාතේ වාහන කුලියට දෙන ස්ථානයකින් මෝටර් රථයක් හා වෑන් රථයක් කුලියට ගෙන වවුනියාවට පැමිණ මේ කොල්ලය සිදු කොට තිබේ.

ලැබුණු තොරතුරුවලට අනුව වවුනියාව පොලීසිය විසින් ඔහු මුලින්ම අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමෙන් පසු අනෙක් දෙදෙනා අත්අඩංගුවට ගෙන තිබේ.

මොවුන් තිදෙනා විසින් වවුනියාව මහ රෝහල අසල නිවෙසකින් හා තේක්කවත්ත ප්‍රදේශයේ නිවෙසකින් මේ කොල්ලය සිදු කොට තිබුණි. වවුනියාව පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# වැස්සට බස් නැවතුමේ ඉන්නෙත් කුඩ ඉහලාගෙන...



**පී.එම්. පත්මසූරිය - අගලවත්ත සමූහ**

බුලත්සිංහල ප්‍රධාන බස් නැවතුම්පොළ වැසි දිනට මගීන්ට රැඳී සිටිය නොහැකි ස්ථානයක් බව මගීහු පවසති. කොරෝනා වසංගතය හමුවේ බස් රථ ධාවනය වීම ඉතා අඩු මට්ටමක පවතින හෙයින් මගීන්ට පැය ගණන් බස් නැවතුමේ වැස්සට තෙමෙමින් හිටගෙන සිටීමට සිදු වී ඇත.

බොහෝ පිරිස් බස් නැවතුමේ කුඩ ඉහලාගෙන සිටින අතර එය සෙසු මගීන්ට හිරිහැරයකි.

මෙහි වහලය ඉතා ඉහළින් පිහිටා ඇති අතර ඒ හරහා බස් නැවතුම්පොළට වැසි ජලය ඇතුළු වේ. මේ ගොඩනැගිල්ලේ ඉහළ කොටස ආවරණය වන පරිදි තහඩු ආවරණයක් යොදා මගීන්ට සිදු වන හිරිහැරය මඟ හරවා දෙන ලෙස මගීහු අදාළ බලධාරීන්ගෙන් ඉල්ලති.

# සියලු ලෝවැසියන්ට සෙත්පතා සර්ව ආගමික ආශීර්වාද පූජාවක් අද

ජනාධිපතිට, අගමැතිට සහ රජයට මෙන්ම සියලු ලෝකවාසීන්ට සෙත්පතා අද (08) සවස 5.46ට සර්ව ආගමික පූජාවන් පැවැත්වීමට සියලු ආගමික නායකයන් අතින් සිදු කෙරේ.

මේ වැඩසටහන අයි.ටී.එන් සහ නේත්‍රා රූපවාහිනී නාළිකා ඔස්සේ සජීව ලෙස විකාශය කිරීමටද කටයුතු යොදා තිබේ. කොළඹ ගංගාරාම විහාරස්ථානය, බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානය, බම්බලපිටිය අලුත් කදිරේෂන් කෝවිල, කොල්ලුපිටිය මුස්ලිම් පල්ලිය යන ස්ථානවලදී මේ ආශිර්වාද පූජා පැවැත්වීම එකම මොහොතේ සිදු කෙරේ.

සියලුම ජනතාව නිවෙසේ සිට තම තමන්ගේ ආගම සිහි කරමින් සියලු ලෝකවාසීන් දුකින් මිදී සුවපත් වේවායි ප්‍රාර්ථනා කරමින් මේ ආශිර්වාද පූජාවට එක්වන ලෙස ආගමින නායකයෝ ඉල්ලා සිටිති.



දුම්රිය ගමන් වාර කීපයක් අත්හිටුවීමෙන් කොටුව දුම්රිය ස්ථානය ඊයේ (07) පාළුවට ගොස් තිබුණු අයුරුයි මේ.

*ඡායාරූපය සුදත් මලවීර*

## ගිනිකාලය

ගගන සරනා රොකට් යානය පිට රටක හැදු - වැඩු
පාලනෙන් ගිලිහිලා වැටිලා වෙන්න ඇහැකිලු - කුඩු
මේක නම් මහ නරක යුගයක් වැටෙන තරමක් - නඩු
අපිත් අවදානම් කලාපෙලු තවත් මොනවද - අඩු

*ගාමිණී ජෝති*

## අද නැත්තා

වැඩි හරියක්ම රට වටටම - ඇරිලාය
සමහර ගම් වහන්නට වැඩ - කෙරිලාය
නරකම අතට අද රෝගය - හැරිලාය
කොවිඩ් ලෙඩුන්ගෙන් රෝහල් - පිරිලාය

වයිරස් මේ රටට හොර පාරෙන් - එයිද?
මුළු රට වසාගෙන රෝගය - පැතිරෙයිද?
පාලනයෙන් මිදී වෙන අතකට - යයිද?
හැම රෝහලම කොවිඩ් රෝහල් - වෙයිද?

රටේමුල්ලේ මුදන්නායක

# ඩ්‍රෝන කැමරා සහායෙන් නව රථවාහන වැඩපිළිවෙළේ නියමු ව්‍යාපෘතිය නුගේගොඩින්

**රක්ෂණ ශ්‍රියන්ත**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත කොළඹ නගරය හා අවට රථවාහන තදබදය අවම කිරීමට ශ්‍රී ලංකා පොලිසිය මගින් ඩ්‍රෝන කැමරා යොදා ගනිමින් නව රථ වාහන හැසිරවීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමේ නියමු ව්‍යාපෘතිය පෙරේදා (06) නුගේගොඩ ගුවන් පාලම අසලින් ආරම්භ කරනු ලැබීය.

මෙය පොලිස් විශේෂ කාර්ය බළකායේ ඩ්‍රෝන කැමරා අංශය විසින් සිදු කළ අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඩ්‍රෝන කැමරා අංශයේද සහාය ගන්නා ලදී.

මේ වැඩසටහන මගින් කොළඹ නගරයේ ඩ්‍රෝන කැමරා ගුවන් ගත කර ඒ මගින් ලබා ගන්නා දර්ශන විශේෂ වෑන් රථයක ස්ථාපිත කර ඇති ජංගම මැදිරි වෙත ක්ෂණිකව ලබා ගැනීමට කටයුතු කර ප්‍රධාන මාර්ගවල රථවාහන තදබදය අධික ලෙස පවතින ස්ථාන හඳුනා ගැනීමට කටයුතු කිරීමයි.

පසුව එම ස්ථානවල රථවාහන තදබදය අවම කිරීමට රථවාහන වාහන නිලධාරීන්ට නිවැරැදි ලෙස කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන අතර මාර්ග නීති උල්ලංඝණය කරන රියැදුරන් සම්බන්ධයෙන් මෙමගින් අධීක්ෂණය කරනු ඇත.



මේ නියමු ව්‍යාපෘතිය ඉදිරියේදී අධික රථ වාහන තදබදයක් පවතින වෙනත් ප්‍රදේශවලද ක්‍රියාත්මක කිරීමට පොලිසිය බලාපොරොත්තු වේ.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ, පොලිස් විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරී නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර, නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුවන් අසංක, පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ නිහාල් තල්දූව, අධ්‍යක්ෂ රථවාහන, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඉන්දික හපුගොඩ, අධ්‍යක්ෂ නාගරික රථවාවහන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රණගල,ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් බුද්ධි අධ්‍යක්ෂ එයාර් කොමදෝර් තුෂාර වීරරත්න මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.

# අවන්හලක ආහාර පිසිමින් සිටි කෝකියා හොද්දට වැටී මරුට

## කොරෝනාදැයි සැක

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ පේදුරුතුඩුව ප්‍රදේශයේ අවන්හලක ආහාර පිසිමින් සිටි කෝකියකු අපස්මාරය රෝගය වැලඳී පිසිමින් සිටි සැමන් හොද්දට වැටී පෙරේදා (06) මියගොස් තිබේ.

මෙසේ මියගොස් ඇත්තේ යාපනය අල්වායි උතුරු ප්‍රදේශයේ පදිංචි 41 හැවිරිදි රාසයියා තීපන්කුමාර් නැමති අයෙකි.

ඔහු සැමන් හොද්ද පිසිමින් තිබූ විශාල තාච්චියට ඇද වැටීමෙන් පසු ඔහු පේදුරුතුඩුව මන්තිහෙයි රෝහලට ඇතුළත් කොට ඇති අතර ප්‍රතිකාර ලබමින් සිටියදී ඔහු මියගොස් තිබේ.

මේ පුද්ගලයාට කොරෝනා රෝගය වැලඳී ඇති බවට සැක කෙරෙන හෙයින් පී.සී.ආර්. පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙනතුරු පශ්චාත් මරණ පරීක්ෂණය කල් දැමීමටත් මළ සිරුර ඥාතීන්ට බාරදීම කල් දැමීමටත් මන්තිහෙයි රෝහලේ වෛද්‍යවරුන් තීරණය කර තිබේ. පේදුරුතුඩුව පොලීසිය සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

## ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



* ලොක්කවුන් එක අරින්න ඇමති මැදිහත් වුණා කියල පිළිගනිද්දිත්, ශවේන්ද්‍ර දැන් කියනව බං එහෙම වුණේ නෑ කියල !
* අපුල්ලන රස්සාව වුණත් හැමෝටම කරන්න බැහැ සර් !

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මැයි 08 සෙනසුරාදා

# රණවිරුවන්ට කළගුණ සැලකීම

දුටුගැමුණු මහ රජතුමා හඳුන්වන්නේ සිංහලේ විමුක්තිදායකයා හැටියටය. වසර හතළිස් හතරක් රජරට යටත් කරගෙන සිටි සොළීන් පරාජය කොට රට ජාතිය හා ශාසනය ආරක්ෂා කළ බැවින් සිංහලේ විමුක්තිදායකයා යන්න දුටුගැමුණු රජුට යෙදී ඇත. මේ රජුගේ එක් විශිෂ්ට ගුණයක් වූයේ රට එක්සේසත් කිරීමට දිවිහිමියෙන් දායක වූ සෙබළ බළමුළුවලට කෘතගුණ සැලකීමය. මේ අනුව දස මහා යෝධයන්ට, කඩොලැතුට, සෙබළ සමූහයාට යුතුකම් ඉටු කැරිණි. ඉන් නොනැවතී රට බේරා ගැනීමට දායක වූ ගම් නියම්ගම්වලට ද යුතුකම් ඉටු කිරීමට රජු නොපසුබට විය. අපේ ඉතිහාසය විමසන විට ඊට අදාළ පුරාවෘත්ත ඕනෑ තරම් සපයා ගත හැකිය. රටක නායකයන් ජාතික ආරක්ෂාව ගැන පමණක් නොව, ආරක්ෂාව සපයන සෙබළ බළමුළු ගැන ද සිය අවධානය යොමු කළ යුතුය.

අමෙරිකන් නායකයෝ සිය ආරක්ෂක අංශ ඉතා හොඳින් නඩත්තු කරති. එලෙසම සෙබළ බළමුළු ආරක්ෂා කරති. ජිනීවා මානවහිමිකම් කොමිසම අමෙරිකානු ආරක්ෂක ප්‍රධානීන්ට චෝදනා ඉදිරිපත් කොට ඔවුන් ජාත්‍යන්තර අධිකරණය වෙත ගෙන යෑම සඳහා අවස්ථා කිහිපයකදීම උත්සාහ දැරීය. එහෙත් අමෙරිකාවේ කිසිදු නායකයෙක් මානවහිමිකම් කොමිසමට අනුව ක්‍රියා කළේ නැත. හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මානව හිමිකම් කොමිසම හැඳින් වූයේ ඌරු කොටුවක් හැටියටය. අමෙරිකාවේ ආක්‍රමණ අනුමත කළ නොහැකි වුව එහි නායකයන් ස්වකීය ආරක්ෂක හමුදා කෙරෙහි දක්වන සැලකිල්ල අගය කළ යුතුය. අමෙරිකාව පමණක් නොව, මහා බ්‍රිතාන්‍යය ක්‍රියා කරන්නේ ද ස්වකීය ආරක්ෂක අංශ ගෞරවයට ලක් කරන ප්‍රතිපත්තියක් මත සිටය.

ශ්‍රී ලංකාව 1970 දශකයේ අග භාගයේ සිට 2009 වනතුරුම පැවතියේ තීරණාත්මක අවස්ථාවකය. එල්ටීටීඊ ත්‍රස්තවාදය රට පුරා ක්‍රියාත්මක වූ අතර, ඒ හා සමග බැඳුණු ජාත්‍යන්තර බලපෑම්වලට ද රජයට මුහුණ දෙන්නට සිදු විය. ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ක්‍රියාත්මක වූ තීරණාත්මක මෙහෙයුම් ගණනාවකදීම පරාජය බාර ගන්නට අපට සිදු විය. දුර්වල දේශපාලන නායකත්වය, ආරක්ෂක අංශවලට ප්‍රමාණවත් භට පිරිස් නොමැතිකම, යුද්ධෝපකරණවල අඩුලුහුඩුකම් හා තවත් කරුණු කාරණා බොහෝමයක් ඒ සඳහා බලපෑවේය. එදා අපේ තරුණ පිරිස් හමුදාවට බැඳීම ප්‍රතික්ෂේප කළහ. මේ තත්ත්වය වෙනස් වූයේ මහින්ද රාජපක්ෂ මහතා රටේ නායකත්වය බාර ගැනීමත් සමගය. එතැන් සිට කෙටි කාලයක් තුළදී ත්‍රස්තවාදය පරාජය කොට රටට නිදහස හා සාමය හිමිකරදීමට මහින්ද මහතා සමත් විය.

2009 මැයි 19දා කොටි ත්‍රස්තවාදය නිමාවට පත් වූයේ රණවිරුවන්ගේ ලෙයින් - කඳුළින් හා මරණයෙන් ලියවුණු වෘත්තාන්තයක් හැටියටය. එදා රණවිරුවකු දුටු තැන මිනිස්සු ඔහුට ආචාර කළහ. රණවිරු පවුල්වලට ද ගෞරව දැක්වූහ. රජය රණවිරුවන්ට උපරිම සහන සලසාදීමට ඉදිරිපත් විය. රට බේරා ගත් විරුවන්ට මල් පොකුරු දීමට බොහෝදෙනා ඉදිරිපත් වූහ. රුසියාවට කඩාවැදුණු ජර්මන් හමුදාව පරාජය කළ රුසියන් භටයන්ට ද එදා මෙවැනි පිළිගැනීමක් තිබිණි. තිස් අවුරුදු යුද්ධය නිසා අපේ රණවිරුවෝ දහස් ගණනක් ජීවිතක්ෂයට පත් වූහ. තවත් දහස් ගණනක් ආබාධිත වූහ. මේ සියල්ලෝම ජාතික වීරයෝය. එය නොසලකා හැරිය හැකි දෙයක් නොවේ.

යහපාලන ආණ්ඩු සමයේ ආබාධිත රණවිරුවන් වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් විය. එනම්, ආබාධිත රණවිරුවකුගේ මරණයෙන් පසු යැපෙන්නන් වෙත අදාළ දීමනා හා සහන දීමට කටයුතු කර දෙන හැටියටය. යහපාලන ආණ්ඩුව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ අතර, ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා පැමිණි ආබාධිත රණවිරුවන්ට බැටන් ප්‍රහාර දී එළවා දැම්මේය. යහපාලන රජයේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ යුද්ධයට විරුද්ධ දේශපාලකයෙකි. ඔහු ත්‍රස්තවාදී ගැටලුව නිරාකරණය කිරීමට උත්සාහ කළේ ප්‍රභාකරන් සමග ගිවිසුම් අස්සන් කිරීමෙන්ය. රණවිරුවන් තොප්පිගල කොටින්ගෙන් මුදාගත් විට රනිල් එදා කියා සිටියේ තොප්පිගල කියන්නේ කැළෑවක්; එය නිදහස් කර ගැනීම නිෂ්ඵල ක්‍රියාවක් යනුවෙන්ය.

යහපාලන ආණ්ඩුව යුද සමයේ අතුරුදහන් වූ පුද්ගලයන් ගැන සොයා බැලීමට කාර්යාල ඇති කළේය. උතුරේ වින්දිතයන් යැයි කියන පිරිසට වන්දි දීම සඳහා වැඩසටහනක් සකස් කළේය. ඒ අතර, ආරක්ෂක නිලධාරීන්ට චෝදනා එල්ලකොට ඔවුන් රිමාන්ඩ් ගත කළේය. බුද්ධි අංශ දුර්වල කළේය. මානුෂීය මෙහෙයුමට නායකත්වය දුන් හමුදා ප්‍රධානීන්ට එළව එළවා පහර දෙන ප්‍රතිපත්තිය යහපාලන ආණ්ඩුව ගෙන ගියේය. ආරක්ෂක අංශවලට සම්බන්ධ ඇතැම්හු ජීවිතාරක්ෂාව සඳහා රටින් පැන ගියහ. යහපාලනය පැවති කෙටි කාල සීමාව වනාහි රණවිරුවන්ට මෙන්ම රණවිරු පවුල්වලට ද කරදරකාරී කාලයක් විය. යහපාලන නායකයන්ගේ ඉලක්කය වූයේ මානවහිමිකම් කොමිසම හා කොටි ඩයස්පෝරාව සතුටු කිරීම යැයි කිව හැකියය.

නොසලකා හරින ලද ආරක්ෂක අංශ වෙත යළිත් යුක්තිය ඉටු වන්නට පටන් ගත්තේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත් වීමත් සමගය. රණවිරුවන් සඳහා යුතුකම් ඉටු කරන අතරම ත්‍රිවිධ හමුදාව හා පොලිසිය රටේ ජාතික සංවර්ධනය සඳහා බද්ධ කර ගැනීමේ වැඩසටහනක් ද ආණ්ඩුව ක්‍රියාත්මක කරයි. ජනාධිපතිවරයාගේ නියමය පරිදි ආරක්ෂක ප්‍රධානීන්ට රටේ ඉහළ තනතුරු දීමට ද රජය පියවර ගෙන ඇත. එය සාර්ථක වැඩසටහනක් බව පෙනී යන්නේ අදාළ අංශ ඉතා හොඳින් ක්‍රියාත්මක වන බැවිනි. ආබාධිත රණවිරුවන්ගේ ඉල්ලීම් මේ වන විට හිමිකරදී ඇත. ජනාධිපතිවරයා කළ ඉල්ලීමකට අනුව කැබිනට් මණ්ඩලය ඊට අනුමැතිය දී ඇත. අප්‍රේල් 27 වන දා සිට ගණන් බලා එම ගෙවීම් හා සහන දීමටත් ජනාධිපතිවරයා උපදෙස් දී ඇත.

ආබාධිත රණවිරුවන්ගේ ඉල්ලීම් ඉටු වීම ගැන රටේ බහුතරය අවංක ලෙස සතුටු වන බව කිව හැකිය. මන්ද යත්, රණවිරුවන් අද අපි ලබා ඇති නිදහසේ අයිතිකරුවන් වන බැවිනි.

### දිල්රූගෙ සීවිද

| | |
|---|---|
| ගෝතමිය අබ සොයා ඇදුනේ නොමළ ගෙපැලක් සොය | සොයා |
| ඈයට කිසිවිට එබඳු නිවසක් සොයන්නට බැරිවී | ගියා |
| තව ටිකක් මේ වගේ තිබුණොත් වයිරසය දුරුවී | නොයා |
| කොවිඩ් නොහැදුනු ගෙයක් බැරිවෙයි හොයන්නට කොතැනද | කියා |

# දේශගුණික ආපදා අවදානම

අමෙරිකා එක්සත් ජනපදයේ, කැලිෆෝනියා ප්‍රාන්තයේ ඉකුත් වසරේදී ඇති වූ දරුණු ලැව්ගිනි හේතුවෙන් පාරිසරිකව සිදු වූ ව්‍යසනය බරපතළය. සියරා, නෙවාඩා හි වර්ග සැතපුම් 270ක් පමණ ගින්නෙන් විනාශයට පත් විය. ඉන් මාස ගණනාවකට පසු තවමත් කැලිෆෝනියාවේ Sequoia ජාතික උද්‍යානයේ අතරින් පතර දුම් රොටු ඉහළට නගිනු දැක්වෙන සේයාරූ නිකුත් වී තිබේ. ඉන් පැහැදිලි වන කාරණයක් වන්නේ වනෝද්‍යානය ආශ්‍රිතව තවමත් දැඩි වියළි තත්ත්වයක් පවතින බවය. ඉකුත් වසරේ අගෝස්තුවේදී හටගත් මෙම දරුණු ලැව්ගිනි තත්ත්වය පාලනය කිරීමට මාස 5ක් පමණ ගත විය. ප්‍රාන්තයේ ජල අවශ්‍යතාව සපුරාගැනීමේදී ඉන් 1/3ක් පමණ සැපයෙන්නේ මෙම කඳුකර බිම් ආශ්‍රිතවය. අප්‍රේල් 1 වැනිදා වන විට එම ප්‍රදේශ විශාල වශයෙන් හිමෙන් වැසී තිබුණු අතර, ජල සම්පත් දෙපාර්තමේන්තුව ගණනය කර තිබුණේ එහි 59%ක් ජලය අන්තර්ගත බවය.



අමෙරිකාවේ වැඩිම ජනගහනය සහිත ප්‍රාන්තය ද වන කැලිෆෝනියාවේ මෙම ලැව්ගිනි හේතුවෙන් විනාශයට පත් බිම් ප්‍රමාණය වර්ග සැතපුම් 6500ක් පමණ වේ. මේ වර්ෂයේදී ද මෙවැනි තත්ත්වයකදී අමෙරිකාවේ බටහිර ප්‍රදේශවල මීටත් වැඩි බිම් ප්‍රමාණයක් ලැව්ගිනිවල බලපෑමට හසුවනු ඇතැයි පුරෝකථනය කර තිබේ. රටෙන් අඩකට වැඩි ප්‍රමාණයක වියළි කාලගුණික තත්ත්වයක් පැවැතීම මඟින් පෙනෙන්නේ ඇති විය හැකි විනාශයක තරමය. මේ දක්වාම එවැනි කාලගුණයක් පැවතීම හේතුවෙන් තණබිම් අලුතෙන් වැවී නොමැත. එය ප්‍රදේශයේ ලැව්ගිනි තත්ත්වයකදී අවදානම යම් ප්‍රමාණයකට අඩු කිරීමට හේතුවන බව උද්‍යාන බලධාරීන් පෙන්වා දී තිබේ.

වායුගෝලයට මුදාහැරෙන කාබන් ප්‍රමාණය සීමා කිරීම සම්බන්ධයෙන් ලෝකයේ රටවල් සහතික කර ඇතත්, එය ගෝලීය උෂ්ණත්වය ඉහළ නැඟීම සෙල්සියස් අංශක 1.5ට අඩුවෙන් පවත්වා ගැනීමට ප්‍රමාණවත් නොවන බව නවතම වාර්තාවකින් හෙළිදරවු කර තිබේ. The Climate Action Tracker නම් ස්වාධීන විද්‍යාඥයන් සමූහයක් මඟින් එම වාර්තාව සම්පාදනය කෙරිණි. ඉකුත් සඳුදා මේ වාර්තාව නිකුත්වූයේ, අමෙරිකා ජනාධිපති ජෝ බයිඩන් ලෝක නායකයන් සමග පරිසර සමුළුවකට එක් වී සතියක් ගත වූ තැනය. ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් යම් වර්ධනයක් පෙන්නුම් කර ඇතත් අවශ්‍ය මට්ටමට ළඟා වීමට තවමත් ලෝකයට හැකි වී නොමැති බව ඉන් පැහැදිලි වේ.

## කාලගුණ වාර්තාව

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC) මඟින් 2018 පැරිස් සමුළුවේදී එකඟ වූ මට්ටම සෙල්සියස් අංශක 1.5ය. එම එකඟතාව ඇති කර ගැනුණේ කාර්මික විප්ලවයට පෙර ලෝකයේ තත්ත්වය ගැන සැලකිල්ලට ගනිමිනි. දැනටමත් එම මට්ටමට වඩා සෙල්සියස් අංශක 1.2කින් උෂ්ණත්වය ඉහළ ගොස් තිබේ. එක්සත් ජාතීන්ගේ ලෝක කාලගුණ සංවිධානය ඉකුත් මාසයේදී නිකුත් කළ වාර්තාවක් මඟින් මේ තත්ත්වය පිළිබඳ අවධානය යොමුකර ඇත. මිහිතලයේ මතුපිට උෂ්ණත්වය ඉහළයාම සෙල්සියස් අංශක 1.5ට අඩුවෙන් තබාගැනීම තවමත් කළ හැකි දෙයක් බව Climate Action Tracker වාර්තාව මඟින් පෙන්වා දේ. එහෙත් එය කළ හැකි වන්නේ ලොව සෑම රාජ්‍යයක්ම ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නේ නම් පමණි. එම වාර්තාව වැඩිදුරටත් පෙන්වා දෙන පරිදි ලොව ඇතැම් රටවල සිදු වන යටිතල පහසුකම් නැංවීමේ ව්‍යාපෘති පැරිස් ඉලක්ක සපුරා ගැනීමට බාධාවකි. නව ගල් අඟුරු බලාගාර ස්වභාවික ගෑස් විදුලි උත්පාදනය සඳහා යොදාගැනීම ඉහළ යාම සහ කාර්යක්ෂමතාව අඩු රථවාහන ඇතැම් රටවල තවමත් ධාවනය වෙමින් තිබීම වැනි කාරණා නිදසුන් ලෙස දැක්විය හැකිය.

ගෝලීය උෂ්ණත්වය ඉහළ නැඟීම දැනටමත් ඇතිකර ඇති අහිතකර බලපෑම් විද්‍යාඥයන්ගේ අවධානයට ලක් වී තිබේ. දැඩි නියඟය, දරුණු ලැව්ගිනි ආදිය එම බලපෑම් සඳහා නිදසුන්ය. ඇරිසෝනා විශ්වවිද්‍යාලය 2020 දී සිදු කළ අධ්‍යයනයකින් පැහැදිලි වූ පරිදි, මේ මට්ටමෙන් උෂ්ණත්වය ඉහළ නැඟීම සිදු වුව හොත් ඉදිරි වසර 50 ඇතුළත මිහිතලයේ ඇති සියලු ගස් වැල් සහ සතුන්ගෙන් 1/3ක් වඳ වී යාමේ තර්ජනයට ලක් වනු ඇත.

වර්ෂ 2018 දී IPCC ය නිකුත් කළ වාර්තාවකට අනුව ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් 1.5 කින් ඉහළ යාම යනු දරුණු මට්ටමින් සාගර ජල මට්ටම ඉහළ යාමට හේතුවකි. එය වෙරළබඩ ප්‍රදේශ මෙන්ම ඇතැම් රාජ්‍ය ද දැඩි අනතුරකට මුහුණපාන තත්ත්වයකි. උෂ්ණත්වය සෙල්සියස් 2 කින් ඉහළ ගිය හොත් ලොව ඇති කොරල්වලින් 99%ක්ම මිය යාමට එය හේතුවකි. ගොඩබිම ඇති පරිසර පද්ධති අතරින් 13%ක්ම අනතුරට මුහුණපෑම ද ඉන් සිදු වනු ඇත.

දශක 2ක් තුළ අයිස් නොමැති ආක්ටික් කලාපයක් නිර්මාණය වීම ද එවැනි පරිසරයක සිදු වෙතැයි විද්‍යාඥයෝ පෙන්වා දෙති.

ඇන්ටාක්ටිකා ප්‍රදේශයේ දැවැන්ත හිමකඳු හා හිමපර දිය වීම ශීඝ්‍රයෙන් හා නැවැත්විය නොහැකි අන්දමින් සිදු වීම, දැනට ගෝලීය උෂ්ණත්වය වැඩි වී ඇති මට්ටම අනුව දැකිය හැකි වෙතැයි Nature සඟරාව මඟින් මෑතදී ප්‍රකාශයට පත් කළ නවතම පර්යේෂණ වාර්තාවක් මඟින් ද අනතුරු අඟවා ඇත. පැරිස් සමුළුවේදී එකඟ වූ මට්ටම කරා ළඟාවීමට නොහැකි වුව හොත් වසර 2060 වන විට ඇන්ටාක්ටික් හිමවලින් තොර තත්ත්වයක් ඇති වීමට තරම් බලපෑ හැකි බව ඉන් පෙන්වාදී තිබේ. ප්‍රතිඵලය වෙරළාසන්න ප්‍රදේශ මෙන්ම ඇතැම් රටවලට දැඩි බලපෑම් ඇතිවීමය. ධ්‍රැව ප්‍රදේශවල දේශගුණික වෙනස්කම් පිළිබඳ විශේෂඥයකු වන මැසචුසෙට්ස් සරසවියේ පර්යේෂක රොබර්ට් ඩිකොන්ටෝ ද එම පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයෙකි. ඔහු පෙන්වා දෙන්නේ, ධ්‍රැව ප්‍රදේශවල හිම වැස්ම දියවී යාම පාලනය කර ගත නොහැකි නම්, එමඟින් ඇති විය හැකි බලපෑම් ආපසු හැරවීමට ද අප අපොහොසත් වනු ඇත. එම කලාපවල හිම තැන්පත් වීම දීර්ඝ කාලයක් මුළුල්ලේ සිදු වූ ක්‍රියාවලියක් වන අතර, මිහිතලය උණුසුම් වීම පාලනය කරගත හැකි නම් ක්‍රමයෙන් එය යළිත් යථා තත්ත්වයට පත් වනු ඇත.

> වර්ෂ 2018 දී IPCC ය නිකුත් කළ වාර්තාවකට අනුව ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් 1.5 කින් ඉහළ යාම යනු දරුණු මට්ටමින් සාගර ජල මට්ටම ඉහළ යාමට හේතුවකි. එය වෙරළබඩ ප්‍රදේශ මෙන්ම ඇතැම් රාජ්‍ය ද දැඩි අනතුරකට මුහුණපාන තත්ත්වයකි. උෂ්ණත්වය සෙල්සියස් 2 කින් ඉහළ ගිය හොත් ලොව ඇති කොරල්වලින් 99%ක්ම මිය යාමට එය හේතුවකි.

## අනාගත ලෝකය

ඒ සඳහා කාර්මීකරණයට පෙර පැවති මට්ටම කරා ළඟාවීමට ලෝකය සමත් විය යුතුය. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි එම මට්ටම කරා වර්තමානයේ රටවල් අනුගමනය කරමින් ඇති ප්‍රතිපත්ති යටතේ නම්, ළඟාවිය හැකි වනු ඇත්තේ වසර 2100 දීය. මේ සියවස අග වන විට සාගර මට්ටම සෙ. මී. 17 - සෙ. මී. 21ත් අතර ප්‍රමාණයකින් ඉහළ නැඟීමට මේ තත්ත්වය හේතුවනු ඇත. පැරිස් සමුළුවේදී එකඟ වූ මට්ටමට මේ තත්ත්වය පාලනය කරගත හැකි නම් සියවස අග වන විට සාගර මට්ටම ඉහළ නඟිනු ඇත්තේ සෙ. මී. 6 - සෙ. මී. 11ත් අතර ප්‍රමාණයකිනි. කාර්මික විප්ලවයට පෙර පැවති තත්ත්වයට වඩා සෙල්සියස් 2ක් අඩු මට්ටමක් කරා ළඟාවීම පැරිස් සමුළුවේදී ඇතිකරගත් එකඟතාවයේ අපේක්ෂාවය.

Thawaites ග්ලැසියරය හෙවත් ලෝක විනාශ ග්ලැසියරය යනුවෙන් ප්‍රකට ග්ලැසියරය බ්‍රිතාන්‍ය තරම් විශාල වන අතර, සාගරයේ කි. මී. 1ක් තරම් ගැඹුරකට විහිදී ඇත. විද්‍යාඥයන් පෙන්වා දෙන පරිදි එය දිය වීම සිදු වුව හොත් මුහුදු මට්ටම සෙ. මී. 65 කින් ඉහළ නඟිනු ඇත.

ඒසා විශාල ප්‍රමාණයකින් ධ්‍රැව ප්‍රදේශවල අයිස් දිය වීමේ ප්‍රතිඵල ශතවර්ෂ ගණනාවක් පුරා දැනෙනු ඇතැයි ඔවුහු පවසති. ඩිකොන්ටෝ පවසන පරිදි වසර 2100ට පසු එය මහා විනාශකාරී විය හැකිය.

කාබන් විමෝචනය පාලනය කර ගැනීමට අප අසමත් වන්නේ නම්, එහි ප්‍රතිඵලයක් ලෙස වසර 2200 වන විට සාගර මට්ටම මීටර් 5 කින් පමණ ඉහළ නැඟීම සිදු වනු ඇත.

ලන්ඩනයේ කිංග්ස් කොලීජියේ පර්යේෂකයන් කණ්ඩායමක් සිදු කළ අධ්‍යයනයක ප්‍රතිඵල ද ඉකුත් බදාදා Nature සඟරාවේ පළ විය. ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 3 කින් ඉහළ ගිය හොත් වසර 2100 දක්වා සාගර මට්ටම සෑම වර්ෂයකදීම සෙ.මී. 0.5 බැගින් ඉහළ නඟිනු ඇති බව ඉන් දැක් වේ.



මේ කිසිදු වාර්තාවක් අවසන් නිගමන හෝ අවසානාත්මක වාක්‍ය ලෙස සැලකීමට වඩා එළැඹිය හැකි අන්තරාය පිළිබඳ කෙරෙන සහේතුක අනතුරු ඇඟවීම් ලෙස සැලකීම සුදුසුය. පර්යේෂණ තවදුරටත් සිදු වෙමින් පවතී. දැනට ප්‍රකාශ වී ඇති කාරණා අනුව එතරම් ව්‍යසනයක් සිදු වනු ඇති සිතා ගැනීමට අපොහොසත්ව එය අමතක කිරීම නොව නොපමාව ක්‍රියාත්මක විය යුතු තැනකට ලෝකය ගමන් කර ඇති බව පැහැදිලි වේ. සාගර මට්ටම ඉහළ යා හැකි සෙන්ටිමීටර හෝ මීටර් ගණන එහා මෙහා වීම විය හැකිය. ලෝකය කළ යුතු වන්නේ ඒ ගැන ප්‍රශ්න කරමින් සිටීම හෝ ඒ කවර ප්‍රමාණයකින් දැයි වාද විවාද කරගැනීම නොව. කිසියම් අන්තරාදායක මට්ටමකින් එම ඉහළ යාම සිදු වනු හොඳාකාර පැහැදිලි පසුබිමක එය වළක්වා ගැනීමට පෙළගැසීමය. එහිදී දැනටමත් කර ඇති කැපකිරීම් අවතක්සේරු කිරීමක් සිදු නොවිය යුතුය. ඒ සමගම මීට වඩා වේගයෙන් හා ජවයෙන් ක්‍රියාත්මක විය යුතු බව වටහා ගැනීම ද විය යුතුය.

පසුගිය කාලයේදී අමෙරිකාව පැරිස් සම්මුතියෙන් ඉවත් විය. බලවත් ජාතීන් කර අරින්නේ නම් ලෝකයට මෙම ඉලක්ක සපුරා ගැනීම දුෂ්කරය. අනාගත ලෝකයේ පැවැත්ම වෙනුවෙන් වර්තමාන පරම්පරා ඉටු කළ යුතු මෙහෙවරක් තිබේ. වසංගතයකින් දැඩි ලෙස පීඩා විඳිමින් සිටින අතර, මෙතෙක් ගිය අති ධාවනකාරී මෙන්ම මිහිතලයට දරාගත නොහැකි ගමන දැන්වත් නතර කළ යුතු නැති දැයි මේ කවුරුත් කල්පනා කළ යුතුය.

**ධම්මික සෙනෙවිරත්න**



# ලෝකයම නිහඬ කළ නොනවතින කොරෝනා

කොරෝනා වසංගතය නිසා බොහෝ රටවල ජන ජීවිතය අවුල් වියවුල් තත්ත්වයකට පත්ව ඇත. අසල්වැසි ඉන්දියාව එහිලා කැපී පෙනෙයි. පැය විසි හතරකට ආසාදිතයන් ලක්ෂ හතරකට අධික සංඛ්‍යාවක් ඉන්දියාවෙන් මේ වන විට වාර්තා වෙයි. කොරෝනා ආසාදනය හේතුවෙන් දිනකට එහි මියයන සංඛ්‍යාව තුන් දහස් නවසියය ඉක්මවන බව වාර්තාවල සඳහන් වේ. උත්තර් ප්‍රදේශ්, හරියානා, පන්ජාබ්, තමිල්නාඩු සහ කර්ණාටක යන ප්‍රාන්තවලින් ද කොරෝනා මරණ සංඛ්‍යාව වැඩිවීමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙයි. මෙවන් පසුබිමක් පැවැතිය ද ඉන්දීය රජය පසුගිය දා කියා සිටියේ ඉන්දියාවට මේ වනවිට බලපා තිබෙන වසංගතයේ දෙවන රැල්ල ඉතා සෙමින් අඩුවන ලකුණු පළ වෙමින් ඇති බවයි. කොරෝනා ආසාදිතයන් හඳුනා ගැනීම සඳහා දිනකට එහි පරීක්ෂාවන් මිලියන 2ට ආසන්න සංඛ්‍යාවක් සිදු කෙරේ. ඒ සඳහා පී.සී.ආර්. සහ රැපිඩ් ඇන්ටිජන් යන පරීක්ෂණ වර්ග දෙකම භාවිතයට ගැනේ. දැනට පවත්නා රැල්ල මන්දගාමී වන ලකුණු පළව ඇති බව ඉන්දීය රජයේ බලධාරීන් සඳහන් කරන්නේ කොරෝනා පරීක්ෂණවලින් ලැබෙන දත්ත පදනම් කරගෙන ය. එසේ වුවත් තෙවන කොරෝනා රැල්ලක් ද තම රටෙහි ඇතිවනු ඇතැයි ඉන්දියාවේ වසංගත රෝග පාලන මධ්‍යස්ථානයේ බලධාරීහු සඳහන් කරති.

පසුගිය මාර්තු මාසයේදී ඉන්දියාවෙන් නව කොරෝනා වයිරස ප්‍රභේදයක් වාර්තා වුණු බව විශේෂඥයෝ පවසති. එම නව ප්‍රභේදය "ද්විත්ව විකෘතිය" (double mutant) හෙවත් බී.1.617 ප්‍රභේදය (B.1.617 variant) ලෙස නම් කර ඇත. එය විකෘති දෙකක් සහිත කොරෝනා වයිරස ප්‍රභේදයක් බව විශේෂඥයෝ පෙන්වා දෙති. එම නව ප්‍රභේදය ඉන්දියාවේ ප්‍රාන්ත කිහිපයක මේ වන විට ව්‍යාප්තව තිබේ. නව ප්‍රභේදය මහාරාෂ්ට්‍ර, කර්ණාටක, බටහිර බෙංගාලය, ගුජරාත් සහ චත්තිස්ගාර් යන ප්‍රාන්තවල සුලබව දක්නට ලැබෙන බව සඳහන් වේ. කෙසේ වුවත් දිල්ලි නගරයේ කොරෝනා ව්‍යාප්ත වී යෑම කෙරෙහි මෙම නව කොරෝනා ප්‍රභේදයෙන් බලපෑමක් එල්ල වී නොමැති බව විශේෂඥයන්ගේ මතයයි.

## එන්නත් ලබාදීම

කොරෝනා වසංගතය මධ්‍යයේම ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යංශයේ දූත පිරිසක් ජී - 7 විදේශ අමාත්‍යවරුන්ගේ සැසියට සහභාගි වීමට ලන්ඩනය බලා පසුගිය දා පිටත්ව ගියහ. එම පිරිසෙන් දෙදෙනෙකුට කොරෝනා ආසාදනය වී ඇති බව අනාවරණය වීමත් සමඟම දූත පිරිසට ස්වයං නිරෝධායනය වීමට සිදුව ඇත. කෙසේ වුවත් ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය සුබ්‍රමනියම් ජායිශංකර් එම සැසියට සහභාගි වූ බව සඳහන් වෙයි.

ඉන්දියාවේ කොරෝනා එන්නත ලබාදීමේ වැඩපිළිවෙළ මගින් ලබන ජූලි මාසය වන විට පුද්ගලයන් මිලියන 300කට එන්නත් දීමට සැලසුම් කෙරිණ. එහෙත් එම ඉලක්කය සපුරා ගැනීම අසීරු වනු ඇති බව එහි බලධාරීහු පවසති. එන්නත් මාත්‍රා හිඟවීම එයට හේතුවයි. බිලියන 1.4ක් වන ඉන්දීය ජනගහනයෙන් මිලියන 26කට පමණක් මේ වන විට එන්නත් මාත්‍රා දෙකම දී තිබේ. මිලියන 129කට එන්නත් මාත්‍රා එකක් පමණක් දීමට ඉන්දීය බලධාරීහු සමත්ව සිටිති.

පසුගිය කාලයේදී බ්‍රසීලයේ ජනයා ද කොරෝනා වසංගතය නිසා මහත් පීඩාවකට පත්ව සිටියහ. ඉන්දියාවේ දිල්ලි නුවර කොරෝනා වසංගත තත්ත්වය ඉතා දරුණු අතට හැරීමත් සමඟම බ්‍රසීලය ගැන කතා කිරීම බොහෝ මාධ්‍ය සේවාවලින් ගිලිහී ගියේය. බ්‍රසීලයේ කොරෝනා වසංගතය පැතිරයාම තවමත් අයහපත් මට්ටමක පවතී.

අප්‍රේල් මස 22 වැනිදා සිට මැයි 5 වැනිදා දක්වා වූ කාල පරාසයේදී එරටින් කොරෝනා ආසාදිතයන් 807 388දෙනෙකු වාර්තා වූ බව දැක් වේ. කොරෝනා මරණ 471,176කට අධික සංඛ්‍යාවක් එහි මේ වන විට සිදුව ඇති බව වාර්තා වෙයි. බ්‍රසීලයේ ජනගහනය මිලියන 211කට අධික ය. එසේ වුවත් කොරෝනා එන්නත් මාත්‍රා දෙකම ලබාදීමට බ්‍රසීල බලධාරීන් සමත්ව තිබෙන්නේ මිලියන 14.9කට පමණි. තවත් මිලියන 31කට ආසන්න සංඛ්‍යාවකට කොරෝනා එන්නත් මාත්‍රා එකක් පමණක් දී ඇත. එරටට තවත් කොරෝනා එන්නත් මාත්‍රා මිලියන ගණනක් අවශ්‍යව තිබේ.

කොරෝනා එන්නත් ලොව ඇතැම් රටවලට හිඟ වී තිබුණ ද අප්‍රිකා මහාද්වීපයේ රාජ්‍ය රැසකට දී ඇති එන්නත් භාවිතයට නොගෙන විනාශ මුඛයට යවා තිබෙන බව බී.බී.සී. ප්‍රවෘත්ති සේවය පළ කළ වාර්තාවකින් කියැවිණ. එයින් ඇතැම් එන්නත් තොගවල කාලය ද ඉකුත් වී ඇති බව එහි සඳහන් වේ. මලාවි රාජ්‍යයේ බලධාරීන් ඔක්ස්ෆර්ඩ් - ඇස්ට්‍රසෙනෙකා එන්නතෙන් මාත්‍රා 16 400ක් පමණ භාවිතයෙන් තොරව ඉවත් කර ඇත.

## ඖෂධ තොග

දකුණු සුඩානය එන්නත් මාත්‍රා 59 000ක් භාවිතයෙන් තොරව බැහැර කර තිබේ. එම ඖෂධ මාත්‍රාවල කල් ඉකුත්වීමේ දිනය පසුගිය අප්‍රේල් 13 වැනිදා බව සඳහන් වේ. එකී ඖෂධ තොග විනාශ කරන්නට මලාවි රාජ්‍යයේත්, දකුණු සුඩානයේත් බලධාරීන් තීරණය කර ඇත. එම රාජ්‍යවල සෞඛ්‍ය බලධාරීන්ට එන්නත්වල කල් ඉකුත්වීමේ දිනය පිළිබඳව වැටහීමක් නැතිව ක්‍රියාකර තිබුණු බැවින් එම එන්නත් මේ අන්දමට ඉවත හෙළීමට සිදුව තිබේ.

> ඉන්දියාවේ කොරෝනා එන්නත ලබාදීමේ වැඩපිළිවෙළ මගින් ලබන ජූලි මාසය වනවිට පුද්ගලයන් මිලියන 300කට එන්නත් ලබාදීමට සැලසුම් කෙරිණ. එහෙත් එම ඉලක්කය සපුරා ගැනීම අසීරු වනු ඇති බව එහි බලධාරීහු පවසති. එන්නත් මාත්‍රා හිඟවීම එයට හේතුවයි. බිලියන 1.4ක් වන ඉන්දීය ජනගහනයෙන් මිලියන 26කට පමණක් මේ වන විට එන්නත් මාත්‍රා දෙකම දී තිබේ.





මේ අතර, කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ බලධාරීහු ද ඔක්ස්ෆර්ඩ් - ඇස්ට්‍රසෙනෙකා එන්නතේ මාත්‍රා මිලියන 1.7ක් පමණ භාවිතයට ගත නොහැකි බව පවසති. එම එන්නත් තොගය කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයට ලැබී තිබෙන්නේ දරිද්‍රතාවයෙන් පෙළෙන රටවල කොරෝනා එන්නත් දීමේ කොවැක්ස් වැඩපිළිවෙළ යටතේ ය. එරටට ලැබුණු එන්නත් තොගයෙන් 1000ක ප්‍රමාණයක් පමණක් භාවිතයට ගත් බව සඳහන් වේ.

එම එන්නත් තොගයේ කල් ඉකුත් වන්නේ ලබන ජූනි මාසයේදී බව එරට බලධාරීහු පවසති. එන්නත් තොගය ඉතා ඉක්මනින්ම ටොගෝ සහ ඝානා රාජ්‍ය වෙත යැවීමට කොංගෝ ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ නිලධාරීහු ක්‍රියාකරමින් සිටිති.

දකුණු අප්‍රිකා බලධාරීන් ද තම රටට ලැබුණු කොරෝනා එන්නත් භාවිත නොකිරීමට තීරණය කර ඇත. එයට හේතුව හැටියට ඔවුන් දක්වන්නේ තම රටට බලපා ඇති කොරෝනා වයිරස ප්‍රභේදයට එම එන්නත්වලින් බලපෑමක් සිදු නොවන බව ය. එසේම එන්නත හේතුවෙන් රුධිරය කැටි ගැසීමේ අතුරු ආබාධ තත්ත්වයක් මතුවන්නේ යැයි ජනතාව බිය වීම ද එන්නත්කරණ වැඩසටහනට බාධාවක් වී ඇත. කල් ඉකුත්වීමේ දිනයට පළමුව එන්නත් මාත්‍රා භාවිතයට ගැනීමට වැඩපිළිවෙළක් සකසා ගැනීමට නොහැකි වීම නිසා නයිජීරියා බලධාරීහු ද සිය රටට ලැබුණු එන්නත් ටෝගෝ, ඝානා සහ ජැමෙයිකා රාජ්‍යවලට දීමට ක්‍රියාකරමින් සිටිති.

කොරෝනා එන්නත් මාත්‍රා ලැබුණ ද ඒවා නිසි වෙලාවට එන්නත් කිරීමට අප්‍රිකා රටවල් විශාල සංඛ්‍යාවකට නොහැකි වී තිබෙන්නේ ඒ සඳහා නිසි වැඩපිළිවෙළක් සංවිධානය කර ගැනීමට ඒ රටවල බලධාරීන්ට නොහැකි වීම නිසයි. එහිලා ඔවුන්ට ආර්ථිකමය ශක්තියක් නොමැතිවීම ද බලපා තිබේ. ඒ හැරුණුවිට සෞඛ්‍ය කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම, එන්නත් පිළිබඳ දැනුමක් නොමැතිවීම, නිලධාරීන්ගේ මන්දෝත්සාහී බව, දුර්වල ප්‍රවාහන ජාලයක් තිබීම වැනි කාරණා ද කොරෝනා එන්නත ලබාදීමේ වැඩපිළිවෙළට අයහපත් ලෙස බලපා ඇත.

**මංජුලා විජයරත්න**




# දරුවන්ටත් තනිව ඉන්න වෙලාවක්

කොරෝනා වසංගතය විසින් දරුවන්ව තම නිවෙසටම කර තැබීම විශාල ආශිර්වාදයක් සේ මවුපියන් සැලකුවත් දරුවන්ට වුවමනා තම පවුලේ ඇසුර පමණක්ම නොවන බව පැවසේ. මවුපියන් සහ සහෝදර, සහෝදරියන්ගේ ඇසුර ඕනෑවට වැඩි වූ පසු එතැන ද යම් කළු කුහරයක් සෑදෙන බව පවසන්නේ 11 වියැති දරුවෙකි. සාරා ඇන්ඩර්සන්ගේ 11 වියැති පුත්‍රයා ස්වභාවයෙන්ම හුදෙකලාව ප්‍රිය කරන්නෙකි. පසුගිය වසරේ නිවෙසේ සිට අධ්‍යයන කටයුතු කරන කාලයේ දී හෙතෙම තම සහෝදරයාගෙන් සහ මවුපියන්ගේ ඇසුරෙන් මිදී ගෙවත්තේ පසුපස නිදහස් තැනක සැඟවී ඔහුගේ මනසේ ගොඩනැඟුණ කතාන්දර ගොතමින් ඒවා රඟ දක්වන්නට පටන් ගනී. තම සහෝදරයා සමඟ ආරවුල් ඇති කරගත් විට මේ හැසිරීම හෙතෙම වැඩිපුරම ප්‍රකට කරයි.

"එයා කියන්නේ එහෙම ගෙවත්තට යන්නෙ 'බ්‍රේන් ඇප්' එකට ලොග් වෙන්න කියලා." ඇන්ඩර්සන් මවුපියන් පවසන්නේ එලෙසිනි. මේ දරුවාගේ මොළය නමැති වැඩසටහන ඔහුගේම මනඃකල්පිත ලෝකයක සැඳුණු කදිම වැඩසටහනක් විය යුතුය. එමෙන්ම ඔහුගේ සිතුවිලි පරම්පරාව ද පවුලේ සෙසු අයගෙන් වෙන් කර දක්වන තරම් විශේෂ බවත් සිතිය හැකිය. ඇන්ඩර්සන් මවුපියන්ට අනුව හෙතෙම විනාඩි 20ට පසුව යළිත් ගෙතුළට පැමිණෙයි. එවිට ඔහු පෙරට වඩා අතිශය සන්සුන් ස්වභාවයක් පෙන්වන අතර, වැඩිපුර කතාබහ කිරීමටත් ප්‍රිය කරයි. ඔහු යළිත් පවුලේ සාමාජිකයන් සමඟ පුරුදු සුහදතාවයෙන් යුක්තව හැසිරෙන්නට පටන් ගනී.

එහෙත් වඩාත් වැදගත් වන්නේ කුඩා දරුවාට තම මොළය නමැති වැඩසටහනට පිවිසීමට ඇති කරවන වුවමනාව කුමක්ද කියාය. ඔහුට අනුව ඕනෑවට වඩා පවුලේ සාමාජිකයන් සමඟ ආශ්‍රයේ සිටීම ගැටලුවකි. ඔහුට මේ යථාර්ථයෙන් සුළු මොහොතක් මිදී තමන්ගේම කල්පනා ලෝකයකට පිවිසීමට ඇවැසිය. එසේ නොවුණහොත් කලබලයෙන්, කේන්තියෙන් සහ පීඩනයෙන් පසු වීමට සිදු වේ. මේ තත්ත්වය එතරම් සතුටුදායක නොවන්නේ යැයි ඕනෑම කෙනකුට සිතිය හැකිය. එහෙත් ඕනෑම පුද්ගලයකුට හුදෙකලාව විසීමට ඇති වුවමනාව ඉන් නිශේධනය කළ නොහැකිය. තමන්ගේ කාලයක් ලොකු, කුඩා ඕනෑම අයකු ඉල්ලා සිටීමේ කිසිදු අගතියක් ඇත්තේ නැත. යම් පුද්ගලයකුව බලෙන් සමාජශීලී කරවීම හෝ පිරිසක් අතරට ඇද දැමීමේ අර්ථයක් නැත. ලොකු, කුඩා ඕනෑම අයකුගේ පෞරුෂත්ව ලක්ෂණ සමඟ ඔහුගේ හෝ ඇයගේ හැසිරීම තීරණය වේ. වසංගතයට ප්‍රථම ජීවිතය සහ වසංගතයෙන් පසු ජීවිතය අතර ඇති නොගැලපීම බොහෝ දෙනා නොසන්සුන් කරන්නකි. කාලාන්තරයක් මුළුල්ලේ පුරුදු, පුහුණු කළ ජීවන රටාව ඇතුළට ඕනෑවට වඩා ගෙතුළට වී සිටින්නට වීම සුළුවෙන් තැකිය යුත්තක් නොවේ.

එමෙන්ම දරුවන් ඇතුළු හදට නැවී කටයුතු කිරීම මවුපියන් විසින් අනුමත කරන්නක් හෝ අගය කරන්නක් නොවේ. එහෙත් ඒ, වසංගතයට පළමු ජීවිතයේ අංගයක් ලෙස ගත හොත් වසංගතයෙන් පසුව උදා වූ නව ජීවිතයට එය එසේ නොවේ. මෑතකදී කරන ලද පර්යේෂණයකට අනුව දරුවන්ගේ ඇතුළු හදට නැවීමට ඉඩ දිය යුතුය. ඒ ගැන දෙවරක් සිතා බැලිය යුතුය. වසංගතයට පෙර දරුවන් තමන්ගේ පාසලේ වැඩකටයුතු ආදිය සමඟ අතිශය කාර්යබහුල ජීවිත ගත කළ ඇත්තෝය. විෂය බාහිර ක්‍රියාකාරකම් ද බොහෝය. මේ සියල්ල අතර යම් විවේක කාලයක් තිබේ නම් මවුපියන් විසින් ක්‍රීඩා කිරීමට දින වෙන් කිරීමත්, පවුලේ අය සමඟ චාරිකා ආදියට සහභාගි වීමත් දරුවන්ගේ කාලසටහන අතිශය කාර්යබහුල එකක් විය.

එහෙත් දැන් වසංගතයෙන් පසුව එළැඹි මේ යුගයේ ඒ සියල්ල බිඳ වැටී ඇත. මවුපියන් රැකියා කටයුතු කරන්නේ ද නිවෙසේ සිටය. කිසිවකු නිවෙසින් එළිමහනට නොයන සැටියකි. අතොරක් පවුල්වල නෑදෑ, හිතමිතුරන් අවුරුද්දකින්වත් හමුව නැත.

ළමුන්ගේ හැසිරීම පිළිබඳ නිරීක්ෂණය කරන විශේෂඥයන්ට අනුව ළමයින්ට තනිව සිටීමට ලොකු කාලයක් ලබා දිය යුතුය. එය ඔවුන් හඳුන්වා දෙන්නේ 'නිශ්ශබ්ද කාලය' නමිනි. මවුපියන් මේ දරුවන්ගේ නිශ්ශබ්ද කාලය ගැන ළතැවිල්ලෙන් පසුවීම අනෙකකි.

"ළමයින් තනිව සිටින්නට ප්‍රිය කිරීම වැඩිහිටියන්ගේ සිතට කරදර බව සැබෑවකි. එහෙත් මනෝවිද්‍යාත්මකව බැලූ විට එහි කිසිදු වරදක් නැත. ළමයින්ගේ ශක්තිය යාවත්කාලීන කිරීමට තනිව සිටීම වඩා වැදගත්ය."

යැයි අයෝවා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජාකොබ් ප්‍රිස්ට් පවසයි. ඔහු කුටුම්භ සබඳතා පිළිබඳ පර්යේෂණවල නිරත වන්නෙකි. "දරුවන්ට නිතිපතාම එකම පුද්ගලයන් කණ්ඩායමක් සමඟ ගනුදෙනු කරන්නට සිදු වන විට එවැනි තත්ත්ව ඇතිවිය හැකිය." යැයි ජාකොබ් තවදුරටත් පැහැදිලි කරයි.

තනිව එහෙත් එකමුතුව විසීමේ වැදගත්කම ද ඒ සමඟම මතුව එයි. වසංගත කාලයේ පැය 24 පුරාම පවුලේ සාමාජිකයන් සමඟ විසීමෙන් දරුවන්ගේ මනසට තනිව කුඩා කාලයක් විසීමේ වුවමනාව ඇති වීම වැළැක්විය නොහැකි බව තව දුරටත් පෙන්වා දෙයි. මෙය දරුවන් සම්බන්ධයෙන් පමණක් බලපාන්නක් නොවේ. මවුපියන් සම්බන්ධයෙන් ද මේ තත්ත්වය එසේමය. දරුවන්ගෙන් ගැලවී තනිව සිටීමට මෝටර් රථය තුළට වැදී කාලය ගත කිරීම සහ ඇඳුම් අල්මාරිය ඇතුළට වැදී සැඟවී සිටීම මවුපිය පාර්ශ්වයෙන් සිදුවන ඒවාය. දරුවන් ද තමන්ගේ සහෝදර, සහෝදරියන්ගේ සහ වැඩිහිටියන්ගේ ඇසුර ඕනෑවට වැඩි වූ පසු මේ ආකාරයෙන්ම හුදෙකලා කෙටි නිවාඩුවක් බලාපොරොත්තු වේ. එහෙත් වැඩිහිටියන්ට සාපේක්ෂව බැලූ විට වසංගත කාලය මුළුල්ලේම වඩාත් තනිව සහ අසරණ වී ඇත්තේ දරුවන්ය.

තවත් දරුවන්ට ඕනෑවට වඩා මවුපියන් ඇසුරේ විසීම ගැටලු ඇති කරන්නකි. මෙය වඩාත් උත්සන්න යොවුන් වියේ පසුවන දරුවන් සම්බන්ධයෙනි. ඔවුන් තමන්ගේ ජීවිතය පවත්වා ගන්නේ තමන්ම සකසාගත් නීතිරීති පද්ධතියක් පදනම් කරගෙනය. ඔවුන් තීරණ ගන්නේ මේ පදනම මත පිහිටාය. බොස්ටන් විශ්වවිද්‍යාලයේ ළමා මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය නිකලස් වැග්නර්ට අනුව මේ යොවුන් වියේ දරුවන්ගේ ජීවන රිද්මයට බාධා කිරීමට වැඩිහිටියන් සහ සහෝදර, සහෝදරියන් කටයුතු කරන්නේ නොදැනුවත්වමය. පෙර සූදානමක් නැති මේ නොදැනුවත් ක්‍රියා යොවුන් වියේ දරුවන්ගේ මනසේ දුම් බෝම්බ පුපුරවාලයි.

"යොවුන් වියේ බොහෝ දරුවන්ට දැන් තම සහෝදර, සහෝදරියන් සමඟ වැඩ කිරීමට ඉඩ බෙදා ගැනීමට සිදුව ඇත. කුඩා සහෝදර, සහෝදරියන් බලාගැනීමට සිදුව ඇත. තම කාමරය බෙදා ගැනීමට සිදුව ඇත. මන්දයත් මවුපියන් වෙනදාට වඩා කාර්යබහුල වී ඇත." යැයි සැන්ටා කෲස් විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරියක වන මාගරීටා අස්මිටියා පවසයි. ඇයට අනුව මේ තත්ත්වය දීර්ඝකාලීනව යහපත ඇති කරන්නක් නොවේ. මේ වාතාවරණය මත යොවුන් දරුවන්ට හැඟෙන්නේ අන් කවරදාටත් වඩා තමන් එක රාමුවක හිරවී ඇති බවකි. ඒ තත්ත්වය ඔවුන්ව නොසන්සුන් කරවයි. තනිව තීරණ ගැනීමේ වුවමනාවෙන් පීඩිතව සිටින මොවුන් කලහකාරී හැසිරීම් ප්‍රකට කරන්නට ගනී.

2019 දී සැන්ටා කෲස් විශ්වවිද්‍යාලයේ කළ සමීක්ෂණයකට අනුව යොවුන් වියේ වෙසෙන දරුවන්ට හුදෙකලාව විසීමට කාලයක් දීමෙන් ඔවුන් තුළ නිර්මාණාත්මක හැකියාව, ස්වයං ඇගයීම සහ අධ්‍යාත්මික නැවුම් බවක් වර්ධනය වේ. එමෙන්ම අමාරු අවස්ථාවල තීරණ ගැනීමේ හැකියාව සහ ආත්ම විශ්වාසය වර්ධනය වේ. දරුවන් යනු තමන්ගේම නීති-රීති සහ කල්පනා ලෝකවල ජීවත් වන්නන්ය. මේ කල්පනා ලෝක කඩා බිඳ දමනවා වෙනුවට ඒවා ශක්තිමත් කිරීම මවුපියන් සතු වගකීමකි.

තනිව සිටීමට ප්‍රිය කරන්නේ දුකෙන් සිටින අයය යන සංකල්පය සමාජගතව පැවතීම වඩාත් හානිකර මෙවැනි කාලයකය. ආතතිය සහ වේදනව නිසා තනිව සිටීමත්, තමන්ගේම කාලයක් අවශ්‍ය නිසා තම කල්පනා ලෝකයේ සැරිසැරීමත් යනු එකක් නොව දෙකකි. සෑම වචනයකටම එකම තේරුමක් මේ අලුත් ලෝකයේ නැත. වසංගතයෙන් පසුව මිනිසුන්ගේ කල්පනා ලෝකය සහ සිතීමේ පිළිවෙළ පවා වෙනස්ව ඇත. කලින් අයහපත් යැයි සිතූ බොහෝ දේ දැන් යහපත් බවට පරිවර්තනය වී ඇත.

ඒ අනුව ළමයින්ට ඔවුන්ටම වෙන් වූ තනිව සිටීමේ කාලයක් දීම දැන් මවුපියන්ගේ වගකීමකි. පාසලේ ගෙදර වැඩ අතරතුර විනාඩි 10-15 විවේක කාලයක් දී තමන් කැමති දෙයක් කරන්නට කීම එක් විකල්පයකි. යොවුන් වියේ දරුවන්ට හුදෙකලාව වාඩි වී සිටීමට හැකි විශේෂ තැන් සැකසීම තවත් විකල්පයකි. තනිව ක්‍රීඩා කිරීමට පෙලඹවීමත් තවත් පිළිතුරකි. එහෙත් තනිව සිටීමේ කාලය මොබයිල් ස්ක්‍රීනය හෝ පරිගණක ස්ක්‍රීනය මත ගත කරන කාලය යැයි කිසිම විට පටලවා ගත යුතු නැත.

දරුවන් ඉල්ලා සිටින නව සාමාන්‍යයේ පහසු, ලිහිල් ජීවිතය හිමිකර දීම මවුපියන් සහ වැඩිහිටියන් සතු ප්‍රමුඛ කාරියකි. වසංගතයෙන් පසු ජීවිතය උගත යුත්තේ ජීවත් වීමෙන්ම මිස අනෙකකින් නොවේ. මන්දයත් අපට ආදර්ශ හමුනොවන බැවිනි. ආදර්ශ සැපයිය යුත්තේ ද අප විසින්ම බැවිනි.

නැෂනල් ජියොග්‍රැෆික් ඇසුරෙනි

**කාංචනා අම්ලානි**

# දියවන්නාවේ ජල දූෂණය පාලනයට කාර්යසාධන බළකායක්

**ධනුෂ්ක ගොඩකුඹුර**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි පාර්ලිමේන්තුව අසලින් ගලා යන දියවන්නා ඔයේ ජල දූෂණය පාලනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කාර්යසාධන බළකායක් ස්ථාපිත කිරීමට රජයේ අවධානය යොමුව තිබේ.

වසර කිහිපයක කාලයක් තිස්සේ දියවන්නා ඔය ජලයේ දුර්වර්ණ වීමක් නිරීක්ෂණය වී ඇති අතර, පසුගිය සති කිහිපය තුළ එම තත්ත්වය තීව්‍ර වී ඇති බවක් පෙනෙන්නට තිබේ.

ජලාශයේ ඇල්ගී වර්ධනය වැඩි වීම මීට හේතු වී ඇති බවත් ඔය අවට ප්‍රදේශයේ ශීඝ්‍රයෙන් වන නාගරීකරණ තත්ත්වය නිසා මෙය වර්ධනය වෙතැයි විශේෂඥයන්ගේ අදහස වී ඇත.

මේ ගැටලු සාකච්ඡා කිරීම සඳහා කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවකදී අවධානය යොමු වූ ආකාරයට කාර්යසාධක බළකාය පිහිටුවීමට අදාළ යෝජනාව කැබිනට් මණ්ඩලය හමුවට මේ සතියේ ඉදිරිපත් කෙරෙනු ඇතැයි වාර්තා වේ.

# ෆයිසර් එන්නතට අනුමැතිය හිමි වෙයි

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය මර්දනය සඳහා ෆයිසර් එන්නත රට තුළ භාවිත කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය හිමිව තිබේ.

ෆයිසර් එන්නත් මාත්‍රා මිලියන 5ක් මෙරටට ගෙන්වීමට සැලසුම් කරමින් සිටින බව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ප්‍රකාශ කළාය.

මේ වසර අවසන් වන විට මෙරට ජනගහනයෙන් සියයට 63ක් එන්නත්කරණයට ලක් කිරීමට රජය සැලසුම් කර තිබේ.

කොවිඩ් වයිරසය මර්දන ස්පුට්නික් එන්නතෙහි මාත්‍රා 15,000ක් මෙරටට ගෙන්වා එම එන්නතද ජනතාවට දීමට රජය පියවර ගෙන ඇත.

කොවිඩ් මර්දන එන්නතෙහි පළමු මාත්‍රාව මෙරට ජනගහනයෙන් 928,776කට දී ඇති අතර, දෙවැනි මාත්‍රාව 177,235කට දී ඇති බව වසංගත රෝග විද්‍යා අංශය පවසයි.

# ඉදිරි සතිය තීරණාත්මකයි

## සෞඛ්‍ය අංශ අනතුරු අඟවයි

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

මේ වන විට රට තුළ කොරෝනා රෝගය ව්‍යාප්ත වීම ශීඝ්‍රයෙන් සිදු වෙමින් පවතින අවස්ථාවක ජනතාව අදාළ සෞඛ්‍ය රීතීන් නොතකමින් සංචරණ සීමා උල්ලංඝනය කරමින් කටයුතු කිරීම හේතුවෙන් ඉදිරි සතිය තීරණාත්මක සතියක් වනු ඇතැයි සෞඛ්‍ය අංශ අවධාරණය කරයි.

කොරෝනා ආසාදිතයන් දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් අලුතින් හඳුනා ගැනීම මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රයට දරා ගත නොහැකි තත්ත්වයකට පත්ව ඇතැයි කොළඹ වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පවසයි.

මේ තත්ත්වය හේතුවෙන් රට පුරා සෑම රෝහලකම කොරෝනා රෝගීන් වෙනුවෙන් විශේෂ වාට්ටු ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇතැයිද සමරවීර මහතා කියයි.

රෝහල් සහ ප්‍රතිකාර මධ්‍යස්ථානවල සිටින රෝගීන් සංඛ්‍යාව 17,000කට අධික බවත් එය කිසි සේත් මෙරට රෝහල් පද්ධතියට දරාගත නොහැකි තත්ත්වයක් බවද වෛද්‍ය සුදත් සමරවීර මහතා පෙන්වා දෙයි.

# අධිවේගවල යමින් ඇතැමුන් බැන්නත් අප තැබූ පියවර ගැන අපට සතුටුයි

## රුවන්පුර අධිවේගයේ වැඩ අරඹමින් අගමැති කියයි

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

අදත් අප හැදූ අධිවේගී මාර්ගයේ ගමන් කරමින් අපට බනින පුද්ගලයන් එම මාර්ගයන්ගේ යමින් එමින් අපව විවේචනය කළද රටක් ලෙස අප තැබූ මහගු පියවර ගැන තමන් සතුටු වන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

අධිවේගී මාර්ග මෙරටේ සෑදීම ආරම්භ කළ අවධියේ සිට සබරගමුවේ ජනතාව රත්නපුරයට අධිවේගී මාර්ගයක් දෙන්න යැයි කළ ඉල්ලීම තමා ඉටු කළ බව අග්‍රාමාත්‍යවරයා කියා සිටියේය.

ඔහු මේ බව පැවසුවේ ඊයේ (7) කහතුඩුවෙන් ඇරඹෙන රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියරේ කටයුතු තාක්ෂණික උපක්‍රම භාවිතයෙන් අරලියගහ මන්දිරයේ සිට ආරම්භ කරමිනි.

කොවිඩ් 19 වයිරසයට එරෙහිව සටන් කරමින් රටේ ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට ආණ්ඩුව ක්‍රියා කරනවා සේම ජනතාව නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදින්නේ නම් මෙය පාලනය කිරීමට කිසිදු අපහසුතාවක් නැති බවද අගමැතිවරයා එහිදී පෙන්වා දුන්නේය. ඒ සඳහා රටක් ලෙස එකට අත්වැල් බැඳගෙන මේ අභියෝගාත්මක කාලයට මුහුණ දෙමු යැයි අගමැතිවරයා ඉල්ලා සිටී.

කිලෝමීටර් 73.09ක දිගින් යුතු අගනගරයත් මිණිපුරයත් යා කෙරෙන මේ රුවන්පුර අධිවේගී මාර්ගය කහතුඩුවේ සිට පැල්මඩුල්ල දක්වා සම්පූර්ණ දුර කිලෝමීටර් 73.9ක් වන අතර, පළමු අදියර ලෙස කහතුඩුව සිට ඉංගිරිය දක්වා කිලෝමීටර් 24.3ක දුර ප්‍රමාණයක් ඉදි කිරීමට නියමිතය. දේශීය ඉදි කිරීම් සමාගමක් විසින් මෙහි ඉදි කිරීම් කටයුතු කරන අතර, ඒ සඳහා රුපියල් බිලියන 54.7ක මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබේ. මේ අධිවේගී මාර්ගයේ පළමු අදියරේ ඉදි කිරීම් කටයුතු 2024 වසර වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

# තවත් විෂ පොල්තෙල් මෙට්‍රික් ටොන් 230ක් ආපසු යවයි

**සුභාෂිණී සේනානායක**

ආන්දෝලනාත්මක ඇෆ්ලටොක්සින් අඩංගු බවට තහවුරු කරන ලද එදිරිසිංහ එඩිබල් ඔයිල් සමාගම අයත් විෂ පොල් තෙල් පරීක්ෂාවෙන් තහවුරු වූ තවත් පොල්තෙල් මෙට්‍රික් ටොන් 230ක් මැලේසියාවට ප්‍රතිඅපනයනය කිරීමට නියමිතව තිබිණි. ඉකුත් 4 වැනිදා රේගු හා විගණන පරීක්ෂණ අවසර වූ මේ තෙල් තොගය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත භාර දීමට රේගුව පියවර ගනු ලැබීය.

මේ අනුව අදාළ පොල්තෙල් බහාලුම් තොගය රැගෙන යෑමට පැමිණෙන නෞකාව පස්වරුවේදී කොළඹ වරායට පැමිණීමට නියමිත බව රේගු මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ සුදත්ත සිල්වා මහතා පැවසීය.

# සයිනොෆාම් ලබන සතියේ සිට මෙරට ජනතාවට

## රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන

**රක්ෂණ ශ්‍රියන්ත සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

චීනයේ නිෂ්පාදිත සයිනොෆාම් කොවිඩ් එන්නත ලබන සතියේ සිට මෙරට ජනතාවට දීමට රජය තීරණය කර ඇති බව රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා ඊයේ (7) දිනමිණට පැවසීය.

කොවිඩ් රෝගීන් බහුලව වාර්තා වන ග්‍රාම සේවා වසම්වලට අනුපිළිවෙළට මේ එන්නත දීමට කටයුතු කරන බවද හෙතෙම අවධාරණය කළේය. සාමාන්‍ය ජනතාවට මේ එන්නත දීමට කටයුතු කරන බවත් චීන රජය විසින් මෙරටට මේ එන්නත ලක්ෂ හයක ප්‍රමාණයක් දී ඇති බවත් ඉන් මෙරට සිටින චීන ජාතිකයන් 2,000කට අධික පිරිසකට මාත්‍රා දෙකම දී ඇති බවද ඇමැතිවරයා සඳහන් කළේය.

# දින හතරට කොවිඩ් මරණ 49ක්

**නුවන් කොඩිකාර**

කොරෝනා වයිරසය ආසාදනය වීමෙන් මෙරට දී දින හතරක් තුළ මරණ 49ක් සිදුව ඇතැයි සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

ඒ ඉකුත් 3 වැනිදා මරණ 13ක්, 4 වැනිදා 11ක්, 5 වැනිදා 14ක් සහ 6 වැනිදා මරණ 11ක් වර්තා වූ බව අමාත්‍යාංශය සඳහන් කරයි. මේ වන විට මෙරටින් වාර්තා වූ කොවිඩ් මරණ සංඛ්‍යාව 745ක් දක්වා ඉහළ ගොස් තිබේ.

# සියලු අධ්‍යාපන ආයතන තව දුරටත් වැසේ

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ විශ්වවිද්‍යාල, පාසල්, පිරිවෙන්, උපකාරක පන්ති, පෙරපාසල් නැවත දැනුම් දෙන තුරු වසා දැමීමට තීරණය කළ බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා 'දිනමිණ'ට ඊයේ (07) පැවසීය.

ආණ්ඩුවක් විසින් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට දැඩි උනන්දුවක් දක්වන බවත්, දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන සිතා මේ තීරණය ගත් බවත් ඇමැතිවරයා අවධාරණය කළේය.

විශ්වවිද්‍යාල, පාසල්, පෙරපාසල්, පිරිවෙන්, උපකාරක පන්ති ආරම්භ කිරීමේදී දින 3කට පෙර දැනුම් දීමට පියවර ගන්නා බවද අධ්‍යාපන ඇමැතිවරයා පැවසීය.

# ලෝක සංචාරක ව්‍යාපාරය 73%කින් බිඳ වැටෙයි

## රැකියා ලක්ෂ 620ක් අහිමියි

### ජී 20 සංවිධානය කියයි

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පසුගිය වසරේ (2020) දී ලෝක සංචාරක ව්‍යාපාරය සියයට 73 කින් බිඳ වැටී තිබේ.

ඒ අනුව අන්තර්ජාතික මට්ටමින් අහිමිවූ රැකියා සංඛ්‍යාව මිලියන 62 ක් පමණ වන බවට ගණන් බලා තිබෙන බව ජී 20 සංවිධානය පෙන්වා දෙයි.

ඉතාලියේ පැවැති ජී 20 රටවල සංචාරක ඇමැතිවරුන්ගේ සමුළුවෙන් පසු නිකුත් වී ඇති නිවේදනයක මේ බව දක්වා තිබෙන අතර සමුළුව වීඩියෝ තාක්ෂණය ඔස්සේ පැවතිණි.

රසායනික හා යන්ත්‍රසූත්‍ර යන කර්මාන්ත අංශ දෙකට පසුව ලෝක ආර්ථිකයේ තුන්වන ස්ථානය හිමිව ඇත්තේ සංචාරක කර්මාන්තයට වන අතර පසුගිය දශක කිහිපය තුළ සංචාරක ව්‍යාපාරය අඛණ්ඩ වර්ධනයක් අත්කර ගෙන තිබිණි. ගෝලීය වශයෙන් වේගයෙන් වර්ධනය වන ආර්ථික අංශයක් බවට පත්වූ සංචාරක ව්‍යාපාරය 2009 දී මිලියන 880 ට සාපේක්ෂව 2019 දී බිලියන 1.5 සිට අන්තර්ජාතික සංචාරකයින්ගේ පැමිණීම සියයට 59 ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

සංචාරක කර්මාන්තය ද සමාජ හා ආර්ථික ප්‍රගතිය සඳහා ප්‍රධාන ගාමක බලවේගයක් වී තිබෙන අතර ගෝලීය වශයෙන්, සංචාරක කර්මාන්තය 2019 දී ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයට ඩොලර් ට්‍රිලියන 8.9 ක් සඳහා දායක වී ඇති අතර එය සියයට 10.3 ක දායකත්වයක් සපයයි. ලොව පුරා රැකියා 10 න් 1 ක්ම සංචාරක කර්මාන්තයේ යෙදී සිටින අතර රැකියා මිලියන 330 කට සමාන වේ.කෙසේ වෙතත්, ගෝලීය කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ 2020 දී ශක්තිමත් ඓතිහාසික වර්ධනය නවතා දමා තිබෙන අතර ගුවන් යානා භූමියේ, හෝටල් වසා දමා සංචාරක සීමාවන් ක්‍රියාත්මක කිරීමත් සමඟ, සංචාරක හා සංචාරක ව්‍යාපාරය වෛරසය පැතිරීම ආරම්භයේ සිටම වඩාත්ම බලපෑමට ලක් වූ අංශයක් බවට පත් විය.

# සාමසාධක හමුදාවට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය අඩු නොකළ යුතුයි

## එජාපය කියයි

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සහ සාමය බලාත්මක කිරීමේ මෙහෙයුම්වලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය දුර්වල නොකළ යුතු බව එක්සත් ජාතික පක්ෂය සඳහන් කරයි.

ඉහළ මට්ටමේ විදේශ ප්‍රතිපත්තියේ කොටසක් ලෙස එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා සහ සාමය බලාත්මක කිරීමේ මෙහෙයුම් සඳහා සහභාගි වීමට 2015 සිට 2019 දක්වා පැවති ආණ්ඩුව තීරණය කළ බවත් අල්කයිඩාවට අනුබද්ධ ත්‍රස්තවාදීන්ට මුහුණ දීමට එක්සත් ජාතීන්ගේ කණ්ඩායමේ කොටසක් ලෙස එම්අයි 17 හෙලිකොප්ටර් යානා සහිත හමුදා බළ ඇණියක් මාලි වෙත පිටත් කර හරින ලද බවත් එම පක්ෂය පවසයි.

එම නිසා එක්සත් ජාතික පක්ෂයේ අදහස වන්නේ අනාගත මෙහෙයුම් සඳහා තවදුරටත් සම්බන්ධ වීමට ඉඩ ඇති බැවින් මේ මෙහෙයුම් කෙසේවත් දුර්වල නොවිය යුතු බවයි.

# මුතුරාජවෙල රකින්න මහා සැලැස්මක්

**ධනුෂ්ක ගොඩකුඹුර**

නීතිවිරෝධි ක්‍රියාකාරකම් හේතුවෙන් තර්ජනයට ලක්ව ඇති මුතුරාජවෙල තෙත්බිම සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා මහා සැලැස්මක් (Master Plan) සැකසේ.

මේ සැලැස්ම සැකසීමට ක්‍රියාකාරී කමිටුවක් පත් කෙරෙන අතර, ඒ කමිටුවෙන් හඳුනා ගන්නා බිම් ප්‍රදේශය වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ජාතික රක්ෂිතයක් ලෙස පත් කිරීමට නියමිත බව රජයේ ආරංචි මාර්ග දිනමිණට හෙළි කළේය.

මුතුරාජවෙල තෙත්බිම සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා සැකසෙන මේ මහා සැලැස්ම ක්‍රියාත්මක කරමින් ඉදිරියේදී එම භූමිය රැම්සා තෙත්බිමක් ලෙස ප්‍රකාශයට පත් කිරීම දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත් රජය අදහස් කොට තිබේ.

නාගරික සංවර්ධන හා නිවාස, වනජීවි හා වන සංරක්ෂණ සහ පරිසර අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ සම සභාපතිත්වයෙන් යුත් ක්‍රියාකාරී කමිටුව පත් කිරීමට අදාළ ඒකාබද්ධ යෝජනාව කැබිනට් මණ්ඩලයට යොමු කොට ඇති බවත් එම ආරංචි මාර්ගය අනාවරණය කළේය.

# සති 2ක් ඇතුළත ඉන්දියාවේ ගිය සංචාරකයන්ට ශ්‍රී ලංකාවට ඒම තහනම්

**මහින්ද අලුත්ගෙදර**

සති දෙකක් ඇතුළත ඉන්දියාවේ සංචාරය කළ කිසිදු ගුවන් මගියකුට ශ්‍රී ලංකාවට ගොඩබැසීමට ඉඩ නොදීමට තීරණය කළ බව සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තේමිය අබේවික්‍රම මහතා කියා සිටී.

සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මෙරටට පැමිණෙන ගුවන් සමාගම්වලට ඒ බව දැනුම් දී තිබෙන බවද හෙතෙම වැඩි දුරටත් කියයි.

එම තීරණය ඊයේ (7) සිට ක්‍රියාත්මක කෙරේ. මේ අතර ඉන්දියාවේ සිට පැමිණෙන ගුවන් මගීන්ට මෙරටට පැමිණීම තහනම් කිරීමට සිවිල් ගුවන් සේවා අධිකාරිය ඊයේ තීරණය කළ අතර, ඒ සමඟම ඉකුත් සති 2ක් එරට සංචාරය කළ අයට ද මෙරටට ගොඩබැසීමට අවසර නොදීමට එම අධිකාරිය පියවර ගෙන ඇත.

# 01 වැනි පිටුවෙන්...

## යහපාලන ආණ්ඩුව...

යහපාලන රජයේ සැලැස්මක් අනුව නව අපනයන සැකසුම් කලාප ස්ථාපිත කිරීම සඳහා යෝජනාවක් 2017 වසරේදී අයවැය මඟින් ඉදිරිපත් කොට ඇති අතර, ඒ යටතේ 2020 වර්ෂය අවසන් වන විට නව අපනයන කලාප හයක් ස්ථාපිත කිරීමට නියමිතව තිබුණි.

අධිවේගී මාර්ග කොරිඩෝ ඔස්සේ නව අපනයන සැකසුම් කලාප ඉදි කිරීමට යෝජනා කර තිබූ අතර, ඒ කලාපවල යටිතල පහසුකම් සැලසීම සඳහා 2017 වසරේ කෝටි 100ක්, 2018 වසරේ කෝටි 250ක් සහ 2019 වසරේදී කෝටි 100ක් වශයෙන් රුපියල් කෝටි 450ක් වෙන් කර ඇත.

එහෙත් යෝජිත කලාප හය අතරින් 2020 වර්ෂය වන විටත් වැඩ ආරම්භ කොට තිබුණේ බිංගිරිය සහ මිල්ලනිය අපනයන සැකසුම් කලාප දෙකෙහි පමණක් බවත් ඒ අතරින් මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ වැඩ කටයුතු මේ වන විටත් අත්හිටුවා ඇති බවත් මේ වාර්තාවෙන් හෙළිදරවු කොට ඇත.

ශඛ්‍යතා අධ්‍යනවලදී අභියෝගාත්මක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු නොවීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමට විරුද්ධව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග නිසා මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ ඉදි කිරීම් මෙසේ අත්හිටුවා ඇති අතර, එම කලාපයේ ඉදි කිරීම් සඳහා මේ වන විට රුපියල් කෝටි 208කට වැඩි මුදල් වැය කර තිබේ. බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මාර්ග ඉදි කිරීම් කටයුතු අනුමත ප්‍රමාණ බිල්පත් රහිතව ආරම්භ කොට ඇති අතර, ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු සහ බිල්පත් නියමිත ප්‍රමාණ ඉක්මවා සකස් කර තිබූ බවත් ඉදි කිරීම්වල ප්‍රමිතිය සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බවත් නිරීක්ෂණය වී තිබේ.

මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා ප්‍රවේශ මාර්ග ඉදි කිරීම සඳහා රුපියල් කෝටි 390ක ඇස්තමේන්තුගත වියදමක් දැරීමට සැලසුම් කර ඇති අතර, එම ඉදි කිරීම් 2020 වසරේ අවසන් කිරීමට යෝජිතව තිබිණි.

2017 සහ 2019 වර්ෂවල කෝටි 20.5ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඇති නමුත් 2019 වසරේ නොවැම්බර් මස 7 වැනි දින වන විටත් ප්‍රවේශ මාර්ග සම්බන්ධ ඉදි කිරීම් කිසිවක් ආරම්භ වී නැති බවත් හෙළිව තිබේ.

බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ ප්‍රවේශ මාර්ග ඉදි කිරීමට රුපියල් කෝටි 90.2ක් වැය වන බවට ඇස්තමේන්තු කොට ඇති අතර, 2018 සහ 2019 වර්ෂවලදී රුපියල් කෝටි 35ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබේ. එහෙත් එම මාර්ගවල ඉදි කිරීම්ද නියමිත කාලය තුළ අවසන් කොට නැති බව වාර්තාවේ දැක්වේ.

ජල සම්පාදනය, විදුලිය සැපයීම, අපජලය බැහැර කිරීම වැනි යටිතල පහසුකම් සැලසීම සම්බන්ධයෙන්ද අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කර ගැනීමට අසමත්වී ඇති බව මේ විගණන වාර්තාවෙන් වැඩි දුරටත් පෙන්වා දී තිබේ.

ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් සංවර්ධන උපායමාර්ග සහ අන්තර්ජාතික වෙළෙඳ අමාත්‍යාංශය වෙත දීමට යෝජනා කර තිබුණි.

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ...

නව බදු සංශෝධනය සමඟ මුදල් අමාත්‍යාංශය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මේ වසරේ පළමු මාස තුන සඳහා බදු ආදායම් ඉලක්කය ලෙස රුපියල් මිලියන575.5ක් දී ඇති අතර, ඉන් 98%ක් මේ වන විට සපුරා ඇති බවද අනුර ප්‍රියදර්ශන මහතාගේ සභාපතිත්වයෙන් පැවති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.

පාර්ලිමේන්තුව වෙත කැඳවා තිබුණු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගෝලීය කොවිඩ් අර්බුදය හමුවේ සිය ඉලක්ක සම්පූර්ණ කිරීම අගය කළ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් මෙරට බදු ගෙවන්නන් සංඛ්‍යාත්මකව වැඩි කර ගත යුතු බවද මෙහිදී අවධාරණය කරන ලදි.

2018 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත සඳහා හඳුන්වා දෙන ලද සංශෝධන රැසක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවට ගත් අවස්ථාවේදී මේ කරුණු අනාවරණය විය. වසර 5ක් සඳහා හඳුන්වා දුන් එම නව බදු සංශෝධන අනුව බදු ගෙවිය යුතු තනි පුද්ගලයකුගේ ආදායම් සීමාව රුපියල් ලක්ෂ 5සිට මිලියන 3ක් දක්වා ඉහළ නංවා ඇත.

එසේම, ජාතිය ගොඩනැඟීමේ බද්ද වැනි සමහර බදුවලින් බදු ගෙවන්නන් සම්පූර්ණයෙන් නිදහස් කිරීමද මේ අනුමත නව බදු සංශෝධනවල විශේෂත්වයකි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒ අවස්ථාවේදී පෙන්වා දුන්නේ නිලධාරින් පවසන ලෙස අය නොවන බදු ආදායම් ඉතුරු කිරීම් ලෙස පරිවර්තනය වීමට හැකියාවක් තිබුණද එයින් දිරිගැන්වීමට ලක් වෙන අංශ සහ කර්මාන්ත සම්බන්ධව දෙපාර්තමේන්තුව අවධානයෙන් සිටිය යුතු බවයි.

දේශීය කර්මාන්ත සහ ආයෝජන වැඩි දියුණු කිරීමට මෙන්ම චිත්‍රපට සංස්ථාව වැනි ආයතනවල ඩිජිටල්කරණය සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව දක්වන උනන්දුව අගයන බවද මේ අවස්ථාවේදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන මහතා විශේෂයෙන් පැවසීය.

## ෆේස්බුක් ගිණුම් ...

මේ සම්බන්ධයෙන් ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගන්නා බව ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසයි.

එවැනි ගිණුම් නියාමනය සහ පාලනය කිරීම සඳහා රාජ්‍ය ව්‍යුහයේ පවතින ආයතන ඔස්සේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පවතින නීති මත වැඩපිළිවෙළක් සැකසීම සම්බන්ධයෙන් අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ එම්.යූ.එම් අලී සබ්රි මහතා සහ තමා එක්ව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවද ඊට අනුමැතිය ලැබුණු වහාම අවශ්‍ය පියවර ගැනීමට නියමිත බවද ඇමැතිවරයා සඳහන් කරයි.

එවැනි හිමිකරුවන් නොමැති ගිණුම් ඔස්සේ ත්‍රස්තවාදයට, අන්තවාදයට, ජාතිවාදයට අනුබල දෙන ක්‍රියා, තරුණ පරපුර නොමඟ යවන විෂමාචාර සහ හොරකම් වැනි සමාජ විරෝධි ක්‍රියාවන්ට ආධාර අනුබල දීම් වන බවට ආරක්ෂක අංශවල නිරීක්ෂණයන්ට ලක්ව ඇති බවද රටේ ජාතික ආරක්ෂාවට සහ යහපත් සමාජ පැවැත්ම උදෙසා මෙවැනි පියවරක් ගන්නා බවද ඒ මහතා පෙන්වා දෙයි.

## ලෝක සෞඛ්‍ය ...

ශ්‍රී ලංකාවේ ජනතාවට ඇස්ට්‍රාසෙනෙකා එන්නතේ දෙවැනි මාත්‍රාව ගැනීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානි ටෙඩ්රෝස් මහතා සමඟ වීඩියෝ තාක්ෂණය ඔස්සේ කළ සාකච්ඡාවකදී මේ අදහස් පළ කළ බව ජනාධිපති කාර්යාලය කියයි.

ඇස්ට්‍රාසෙනෙකා දෙවැනි මාත්‍රාව දීමට ලොව පුරා ඇස්ට්‍රාසෙනෙකා එන්නත් මාත්‍රා මිලියන 20ක අවශ්‍යතාවක් ඇති බවද ජනාධිපතිවරයා පවසා ඇත.

මේ අතර කොවිඩ් එන්නත ජනතාවට දීම සහ ගෙන්වීම යන පියවර දෙකම වේගවත් කරන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

කෙටි කාලයක් තුළ හැකි උපරිමයෙන් එන්නත් දීම කළ යුතු බව දෛනිකව රැස් වෙන කොවිඩ් කමිටුව සමඟ අද ජනාධිපති කාර්යාලයේදී ඊයේ (7) පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා අවධාරණය කළේය.

රෝගය පැතිර යෑමට බොහෝ සෙයින් පාදක වන බස්නාහිර පළාත කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම වැදගත් වෙයි. රුසියාවේ නිෂ්පාදිත 'ස්පුට්නික්' එන්නත දීම පෙරේදා (6) සිට ආරම්භ කෙරිණ. චීනයෙන් ලැබුණු 'සයිනොෆාම්' එන්නත් ලක්ෂ 6ක් සෞඛ්‍ය අංශ සතුව ඇත. රටවල් 51ක මිලියන 55කට අධික පිරිසකට 'සයිනොෆාම්' එන්නත සාර්ථකව දී තිබේ. එම රටවල සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කර එම එන්නත කඩිනමින් දීමට ඇති හැකියාව සොයා බලන්නැයි ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය. පළමු එන්නත ගත් පිරිසට 'ඇස්ට්‍රාසෙනෙකා' එන්නතෙහි දෙවැනි මාත්‍රාව දීම කෙරෙමින් පවතී.

# ලොව පුරා ආසාදිත ගණන කෝටි 15 ඉක්මවයි

**මහින්ද අලුත්ගෙදර**

ලොව පුරා රටවලින් වාර්තා වන කොවිඩ් -19 ආසාදිතයන් ගණන 15 කෝටි 60 ලක්ෂය ඉක්මවා ගොස් තිබේ.

ඒ අනුව ලෝකයේ රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 218 කින් වාර්තා වන කොවිඩ් 19 වයිරසය ආසාදනය වූවන්ගේ සංඛ්‍යාව 156,725,630 දක්වා ඉහළ ගොස් තිබෙන අතර, එම වයිරසය ආසාදනය වීම හේතුවෙන් මියගිය සංඛ්‍යාව 3,270,472 දක්වා ඉහළ ගොස් තිබේ. කෙසේ වුවද ඒ අතරින් 134,122,995 දෙනකු පූර්ණ සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර, එම සංඛ්‍යාව කෝටි තුන ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව අමෙරිකාවේ ආසාදිතයන් සංඛ්‍යාව 33,369,192ක් වන අතර, එරට මරණ සංඛ්‍යාව 590,000 ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව එරට මියගිය සංඛ්‍යාව 594,006ක් වෙති. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 21,491,598ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 15,009,023ක් ලෙස වාර්තා වන අතර, ප්‍රංශයේ ආසාදිතයන් 5,728,090ක් සහ තුර්කියේ ආසාදිතයන් 4,977,982ක් ලෙස වාර්තා වෙයි.

# 01 වැනි පිටුවෙන්...

## සංවර්ධන ව්‍යාපෘති ...

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශ විෂය පථයන්ට අනුකූලව හඳුන්වා දුන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටලුවලට විසඳුම් ලෙසින් මේ තනතුරු ස්ථාපිත කිරීමට නියමිතය.

ප්‍රසම්පාදන සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණ හා පසුවිපරම සඳහා ඉංජිනේරු සේවයේ අත්දැකීම් සහිත පුද්ගලයන් යොදා ගැනීමටත් ඔවුන් මඟින් අමාත්‍යාංශ ලේකම්වරුන්ට අවශ්‍ය අධීක්ෂණ සහාය ගැනීමටත් ආණ්ඩුව අදහස් කර ඇති බව රජයේ ආරංචි මාර්ග දිනමිණට පැවසීය.

## නීතිපති ගැන...

අනතුරුව ව්‍යවස්ථාදායක සභාවේ තීරණය ජනාධිපතිවරයාට දැනුම් දෙනු ඇත. නීතිපති ධුරය සඳහා ජනාධිපතිවරයා යෝජනා කර ඇති සංජය රාජරත්නම් මහතාගේ නාමය ජනාධිපති කාර්යාලය විසින් කථානායකවරයාට පෙරේදා (6) බාර දෙනු ලැබීය. නීතිපති ධුරයේ කටයුතු කරන දප්පුල ද ලිවේරා මහතා ලබන 20 වැනිදා විශ්‍රාම යෑමට නියමිත අතර, ඒ අනුව පුරප්පාඩු වන නීතිපති ධුරය සඳහා ජනාධිපතිවරයා විසින් රාජරත්නම් මහතාගේ නම යෝජනා කර ඇත.

# නයිට්‍රජන් අපද්‍රව්‍ය පිළිබඳ ගැටලුවට මුහුණ දීමට ශ්‍රී ලංකාව හා බ්‍රිතාන්‍යය පෙරමුණ ගනී

**මහින්ද අලුත්ගෙදර**

එක්සත් රාජධානිය සහ ශ්‍රී ලංකාව 'දේශගුණය සහ හරිත ප්‍රකෘතිය සඳහා නයිට්‍රජන්' වෙනුවෙන් පෙරමුණ ගෙන ක්‍රියා කිරීමට පියවර ගෙන තිබේ.

නයිට්‍රජන් අපද්‍රව්‍ය පිළිබඳ ගැටලුවට මුහුණ දීම සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ අඛණ්ඩ කතිකාව පුළුල් කිරීම වැදගත් බව විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා රජය "දේශගුණය සහ හරිත ප්‍රකෘතිය සඳහා නයිට්‍රජන්" යන තේමාව යටතේ පවත්වන ලද අතථ්‍ය රැස්වීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නියෝජනය කරමින් සහභාගී වූ ඇමැතිවරයා මේ බව සඳහන් කෙළේය. දේශගුණික ක්‍රියාකාරකම් සඳහා තීරණාත්මක වන තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ කටයුතු පුළුල් කිරීම සඳහා මෙම රැස්වීම පැවැති අතර දේශගුණ විද්‍යාඥයන් දශක ගණනාවක් තිස්සේ වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් විමෝචනය ඉහළ යාමේ බලපෑම පිළිබඳ අධ්‍යයනය කරමින් සිටී. නයිට්‍රජන් අපද්‍රව්‍ය පිළිබඳ ගැටලුව ඒ හා සමාන හදිසි ආකාරයකින් විසඳිය යුතුව ඇති බවද මෙහිදී ඒ මහතා කීවේය.

නයිට්‍රජන් නෙට්සීරෝ යනු කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා රජය අතර හවුල්කාරිත්වයෙන් යුතුව දියත් කරන ලද, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් පෙරමුණ ගන්නා ලද වැඩසටහනකි. මෙමගින් දෙන ප්‍රධාන පණිවුඩ දෙක නම්, නයිට්‍රජන් පිළිබඳව ක්‍රියා නොකොට ශුද්ධ ශුන්‍යය සාක්ෂාත් කරගත නොහැකි වනු ඇති අතර, නයිට්‍රජන් මත ක්‍රියාකිරීම මගින් සෞඛ්‍යය, සොබාදහම සහ ආර්ථිකය සඳහා බහුවිධ සම-ප්‍රතිලාභ ලබාදෙනු ඇති බවය.

පසුගිය වසරේ දී අදහස් දක්වමින්, COP26 සඳහා නම්කළ සභාපති ආලෝක් ෂර්මා මහතා මේ වසරේ දේශගුණික විපර්යාස පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාමාර්ගයේ පවතින වැදගත්කම අවධාරණය කර ඇත.



"දේශගුණික විපර්යාසයන් මැඩ පැවැත්වීම අපගේ ජීවිත කාලය තුළ වඩාත්ම හදිසි හවුල් ප්‍රයත්නයක් වන අතර, විනාශකාරී ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වැළැක්වීම සඳහා සෑම ජාතියකින්ම නිර්භීත පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියි." 2021 නියත වශයෙන්ම දේශගුණය සඳහා තීරණාත්මක වසරක් වනු ඇති අතර ග්ලාස්ගෝ වෙත යන මාර්ගයේ සෑම අන්තර්ජාතික ඉසව්වකින්ම වියන ලද දේශගුණික ක්‍රියාකාරිත්වය පිළිබඳ රන් නූල් දැකීමට මට අවශ්‍යය."

එක්සත් රාජධානිය මේ වසර අගදී ග්ලාස්ගෝ හි COP26 සඳහා සත්කාරකත්වය දරනු ඇති අතර, ඉදිරියේ දී ලැබෙන සභාපති ධුරය සමඟ 2020 සහ 2021 දී දේශගුණික අභිලාෂයන් වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව සමඟ කටයුතු කිරීමට කැපවී සිටී. COP26 දී, එක්සත් රාජධානිය ශූන්‍ය කාබන් ආර්ථිකයක් කරා යන ගමනේ හදිසිභාවය සහ අවස්ථාවන් සහ ලෝකය මුහුණ දෙන බරපතල අභියෝගයන්ට මුහුණ දීම සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවයේ බලය පෙන්නුම් කරයි. සාර්ථකත්වය සහතික කිරීම සඳහා හැකි ඉක්මනින් ශුද්ධ ශුන්‍ය කාබන් විමෝචනය කරා ළඟාවීම පිණිස රටවල් කැපවිය යුතුය.

කෙසේ වෙතත්, ශුද්ධ ශූන්‍ය විමෝචනයට මාරුවීම පිණිස, කාබන් ඩයොක්සයිඩ් මෙන් 300 ගුණයකින් ගෝලීය උණුසුම ඇති කිරීමේ හැකියාව ඇති කාබන් මොනොක්සයිඩ් අවම කිරීම සඳහා ද නයිට්‍රජන් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍ය වනු ඇත. නයිට්‍රජන් දූෂණය අඩු කිරීම කෙරෙහි යොමු වීමෙන් වාතය, ජලය, ජෛව විවිධත්වය, ස්තර ගෝලයේ ඕසෝන් ක්ෂය වීම, පස, ආහාර සහ ආර්ථිකය සඳහා තිරසාර සංවර්ධනයක් හරහා බහුවිධ ජයග්‍රහණ ලබාගත හැකිය. මෙම කරුණු ඉන්දියාවේ නායකත්වයෙන් යුත් 'තිරසර නයිට්‍රජන් කළමනාකරණය' (UNEP/EA.4/Res.14) පිළිබඳ එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ යෝජනා සම්මුතිය සහ 2030 වන විට සියලු ප්‍රභවයන්ගෙන් නයිට්‍රජන් අපද්‍රව්‍ය අඩකින් අඩු කිරීමේ අභිලාෂයට එකඟ වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛ කොළඹ ප්‍රකාශනය මගින් පිළිගෙන ඇති අතර, එමඟින් වාර්ෂිකව ඩොලර් බිලියන 100 ක් ඉතිරි කර ගැනීමේ හැකියාව ලබාදෙයි.

දේශගුණික ක්‍රියාකාරකම් සඳහා තීරණාත්මක වන මෙම වර්ෂයේ දී, දකුණු ආසියානු සහයෝගිතා පරිසර වැඩසටහනේ (SACEP) සාමාජික රටවල් සමඟ නයිට්‍රජන් නෙට්සීරෝ මුලපිරීම කටයුතු පුළුල් කිරීම සඳහා මග සලසයි. ගෝලීය අභියෝගතා පර්යේෂණ අරමුදල හරහා එක්සත් රාජධානියේ පර්යේෂණ හා නවෝත්පාදනවල සහාය ඇතිව "GCRF දකුණු ආසියානු නයිට්‍රජන් කේන්ද්‍රස්ථානයේ" හි විද්‍යාත්මක සහාය ඇතිව මෙම වැඩසටහන සකස් කෙරෙමින් පවතී.

මෙම කේන්ද්‍රස්ථානය, එක්සත් රාජධානියේ පරිසර විද්‍යාව හා ජල විද්‍යාව පිළිබඳ කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන අන්තර්ජාතික නයිට්‍රජන් කළමනාකරණ පද්ධතිය හරහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන හා ගෝලීය පරිසර පහසුකම සමඟ සහයෝගයෙන් කටයුතු කරන ගෝලීය ප්‍රයත්නයේ කොටසක් වෙයි.

# රසායනික අවි භාවිතයට තිත තැබීමට අන්තර්ජාතික කැප වීමක් අවශ්‍යයි

## ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත අරුණි රණරාජා

**මහින්ද අලුත්ගෙදර**




නෙදර්ලන්තයේ හේග්හි පිහිටි රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතවරිය වශයෙන් පත් කළ ශ්‍රී ලංකා තානාපතිනී අරුණි රණරාජා මහත්මිය එම සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සිය අක්තපත්‍ර පිළිගන්වා තිබේ.

රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ, අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රනාන්දු ආරියාස් මහතා විසින් හේග් හි පිහිටි එම සංවිධාන මූලස්ථානයේ පැවති උත්සවයක දී, එම සංවිධානය සඳහා ශ්‍රී ලංකාවේ ස්ථිර නියෝජිතවරිය ලෙස අක්ත ගන්වන ලද තානාපති අරුණි රණරාජා මහත්මියගේ අක්තපත්‍ර පිළිගෙන තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

ශ්‍රී ලාංකිකයන් කිහිප දෙනෙකු රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ තනතුරු හොබවා ඇති බව සිහිපත් කළ තානාපති අරුණි රණරාජා මහත්මිය, ශ්‍රී ලංකාවේ පොහොසත් මානව සම්පත් සංචිතය තුළින් සංවිධානය වෙත සිය දායකත්වය තවදුරටත් ඉහළ නැංවීම සඳහා උනන්දු වන බවද පවසා ඇත. 2019 දෙසැම්බර් මාසයේ දී පැවති ආසියානු කලාපයේ එම සංවිධානයේ සාමාජික රටවල් සඳහා වන "රසායනික අවි සම්මුතිය සහ රසායනික ආරක්ෂාව සහ ආරක්ෂක කළමනාකරණය" පිළිබඳ සම්මන්ත්‍රණය හා අන්තර්ජාතිකව හා කලාපීයව පැවැත්වීමට ශ්‍රී ලංකාව නිත්‍ය සත්කාරක රටක් ලෙස සලකන ලෙස තානාපතිවරිය දන්වා ඇත.

රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් රසායනික අවි භාවිතය වැළැක්වීම සඳහා ශක්තිමත් අන්තර්ජාතික සහයෝගිතාවයක් සහ කැපවීමක් තිබිය යුතු බවත්, දේශපාලනික වශයෙන් පොලඹවන ලද න්‍යායපත්‍රවලට යටත් නොවිය යුතු බවත් අධ්‍යක්ෂ ජනරාල් සහ තානාපතිවරිය අවධාරණය කර ඇති අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තානාපති ඔඩෙට් මෙලෝනෝ මහතා, විදේශ සම්බන්ධතා අංශයේ අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝජ්‍ය කැබිනට් ප්‍රධානී යන අය ද මෙම සාකච්ඡාවට සම්බන්ධ වී ඇත.

# මම කවදාවත් පන්තියේ දෙවැනියා වෙලා නැහැ

## මාතලේ දිස්ත්‍රික්කයේ වාණිජ අංශයෙන් පළමු වැනියා වූ උකුවෙල සිද්ධාර්ථ මධ්‍ය විදුහලේ බුද්ධිමා ලසන්ති

**උකුවෙල සංවාරක - ප්‍රියන්ත සුමනසේන**

මම එක ශ්‍රේණියේ සිට ගත්තේ උකුවෙල නාගොල්ල සිද්ධාර්ථ මධ්‍ය මහ විදුහලේ. මාතලේ දිස්ත්‍රික්කයේ වාණිජ අංශයෙන් පළමු වැනියා වීමට හැකි වීම ගැන මට හරිම ආඩම්බරයි. අනාගතයේදි රටේ ආර්ථිකයට විශාල සේවයක් කරන්න බලාපොරොත්තු වනවා යැයි ටී. ජී. බුද්ධිමා ලසන්ති කුලරත්න සිසුවිය පැවසුවාය.

පළමු වැනි ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පාසල් ජීවිතයේ කිසිම දවසක මම පන්තියේ දෙවැනියා වෙලා නැහැ. පළමු වැනි ස්ථානය රැක ගෙන ඉගෙනීමේ කටයුතු ඉතාම සාර්ථකව කළා. මව්පියන්ට ගුරුවරුන්ට අවනතව පාසලේ ශිෂ්‍යනායිකාවක් වශයෙන් කටයුතු කළා.

මුලින් කලල්පිටිය ශ්‍රී ධර්මේශ්වර විහාරස්ථ දහම් පාසලට ඉහා පසුව පාසලට ඇතුළත් වුණා. එදා සිට අද වන තෙක් ඉගෙනිමේ කටයුතු සාර්ථකව කරගෙන ගියා. පාසලේ බාහිර කටයුතුවලටත් ඇල්මෙන් සම්බන්ධ වුණා. ක්‍රීඩා අංශයට හා ඉංග්‍රීසි, දෙමළ විෂයන්ට මෙන්ම පාසල් තරගවලටත් සහභාගි වුණා. සංගිත අංශයෙන් රාජ්‍ය සම්මාන ලැබුවා. සංගිතයට හ නිවේදන කටයුතුවලටත් ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක ලෙසත් කටයුතු කළා.



පන්තිභාර ගුරුතුමිය විජේසුරිය මැඩම් සහ යමුනා, පත්මා ගුරුවරියන් ද මේ වෙලාවේ මතක් කළ යුතුයි.

මගේ අධ්‍යපන කටයුතු දියුණු කර ගන්න උපකාර පන්තියේ මාරපන සර් ඇතුළු ගුරු මණ්ඩලයටත් මට බාහිරව උපකාර කළ සියලුම දෙනාටත් ස්තුති කරනවා යැයි පැවසිය.

ඡායාරූපය - උකුවෙල සංචාරක

# මගේ ජීවිතයට ඉලක්කයක් දුන්නේ දුයිෂෙන් වගේ ගුරුවරයෙක්

## ගණිත අංශයෙන් දිවයිනේ දෙවැනි තැන දිනූ මාතර රාහුල විද්‍යාලයේ යොෂාන් චමිඳු



**ජයසිරි ජේදුරුආරච්චි - ගන්දර සමූහ**

මෙවර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව ගණිත අංශයෙන් දිවයිනේ දෙවැනි ස්ථානය දිනා ගැනීමට මාතර රාහුල විද්‍යාලයේ යොෂාන් චමිඳු සංජන ශිෂ්‍යයා සමත්ව ඇත.

පළමු ශ්‍රේණියේ සිට රාහුල විද්‍යාලයේ ඉගෙනුම ලබා ඇති ඔහු අපොස (සා/පෙළ) විභාගයෙන් සියලු විෂයන් සඳහා "ඒ" සාමර්ථ්‍ය ලබා සමත් වී ඇත. ඉගෙනුම් ක්‍රියාවලිය හා ක්‍රීඩාව සමබරව ක්‍රියාත්මක කර ගෙන ගිය යොෂාන් ජවන හා පිටිය මලල ක්‍රීඩා ශූරයකු මෙන්ම ක්‍රිකට් හා පාපන්දු ක්‍රීඩාවෙන් ද දක්ෂතා දක්වන්නෙකි.

යොෂාන්ගේ මව මාතර ජනාධිපති විද්‍යාලයේ ගුරුවරියක ලෙස සේවය කරන අතර පියා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරියකු ලෙස සේවය කරයි. එකම නැගණිය මාතර සුජාතා විද්‍යාලයේ 12 වැනි ශ්‍රේණිය ඉගෙනුම ලබන්නීය.

"මට මුල් අවස්ථාවේදිම නිර්මල ඉලංගම්ගේ සර් ඉලක්කයක් දුන්නා. සර්, මට දවසක් කිව්වා ඔයාට ලංකාවෙන්ම පළමුවැනියා වෙන්න පුළුවන්. ඒ අනුව වැඩකරන්න කියල කිව්වා. විෂයයන් තුනටම සර් පස්සෙන් ඉඳන් අවශ්‍ය සහාය දුන්නා. ඒදා සිටම මම එම ඉලක්කය හිතේ තියාගෙන වැඩ කළා. මම ඉන් ජය ලැබුවා. හරිම සතුටුයි" පරිගණක මෘදුකාංග ඉංජිනේරුවකු වන්න සිහින දකින යොෂාන් සිනාමුසුව පැවසුවේය.

රාහුල විද්‍යාලයේදී එක ශ්‍රේණියේ සිට උසස්පෙළ දක්වාම තමන්ට අකුරු කළ සියලු ගුරු මව් පියවරුන් හා විදුහල්පතිවරයා ද ආදරයෙන් සිහි කළ යොෂාන් තමන්ට හැමදාමත් ශක්තිය දුන් මාපියන් හා දයාබර නංගී ද ආදරයෙන් සිහිපත් කළේය.

ඡායාරූපය - ගන්දර සමූහ

# පෘතුගාලයේ පැවැත්වෙන මීළඟ ඔලිම්පියාඩ් තරගාවලියෙන් ශ්‍රී ලංකාව දිනවනවා

## ජීව විද්‍යා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය කෑගල්ල, සාන්ත ජෝසප් බාලිකාවේ ඩී. සුමුදු ධනංජී

**සබරගමුව සමූහ**

මෙවර අපොස උ/පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව ජීව විද්‍යා (නව විෂය ධාරාවේ) අංශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය කෑගල්ල සාන්ත ජෝසප් බාලිකා විද්‍යාලයේ ඩී. සුමුදු ධනංජී සේනාධීර ශිෂ්‍යාව හිමි කර ගෙන ඇත.

සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි උපදේශකවරයකු වන කෑගල්ල බෙලිගල පදිංචි ඩී. සේනාධීර මහතාගේ සහ කෑගල්ල මහ රෝහලේ වෛද්‍යවරියක වන කේ. එම්. ධනෝජා පුණ්‍යසෝම මහත්මියගේ එකම දරුවා ධනංජී සේනාධීර ශිෂ්‍යාවයි. පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඇය කෑගල්ල සාන්ත ජෝශප් බාලිකා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබුවාය. ඇය පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 173ක් ගෙන ඇත.

සුමුදු අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී විෂයන් නවයටම ඒ සාමර්ථ්‍ය ලබා කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් ඇත. උසස් පෙළ විභාගයට ජීව විද්‍යා නව විෂය ධාරාවෙන් පෙනී සිට ඇති ධනංජී සේනාධීර ශිෂ්‍යාව පසුගිය 04 දා නිකුත් කළ ප්‍රතිඵලවලට අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයත් දිවයිනේම 21 වැනි ස්ථානය හිමි කර ගෙන තිබුණි.

සිය ජයග්‍රහණය පිළිබඳ අදහස් දැක් වු ධනංජී සේනාධීර ශිෂ්‍යාව පැවසුවේ, විභාගය සමත් වන බව මම දැන ගෙන හිටියා. ලංකාවේන්ම 50 වැනියා හෝ 60 වැනියා පමණ වෙයි කියලා අපේක්ෂා කළා. නමුත් 21 වැනියා වෙයි කියලා හිතුවේ නෑ. කෑගල්ල හා මහනුවර පැවැති අමතර පන්තිවලට ගියා. පාසලෙන් හොඳ සහයෝගයක් ලැබුණා. පාසල් ගුරුවරුන්ගෙන් මෙන්ම අම්මා සහ තාත්තාගෙන් ද ලැබු සහයෝගය අති විශාලයි.



මම ජීව විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියෙන් ශ්‍රී ලංකාවෙන්ම ප්‍රථමයා වුණා. ලෝක ඔලිම්පියාඩ් තරගාවලිය ඉදිරියේ දී පෘතුගාලයේ දී පැවැත්වීමට නියමිතව තියෙනවා. ශ්‍රී ලංකාවෙන්ම සිව් දෙනකු තෝරා ගෙන තිබෙනවා. ඒ සිව් දෙනා අතර මම පළමු තැන ඉන්නවා. එහිදී පදක්කමක් දිනා ගන්න මම බලාපොරොත්තු වෙනවා. විද්‍යාලයේ පන්ති නායිකාවක් හැටියටත් කටයුතු කර තියෙනවා. විදුහල්පතිනී මල්ලිකා රණසිංහ මහත්මිය ඇතුළු ආචාර්ය මණ්ඩලය මව්පියන් සියලු දෙනා දැක්වූ සහයෝගය පිළිබඳ ස්තුති වෙනවා. අනාගතයේදී වෛද්‍යවරියක් වීමට බලාපොරොත්තුවෙන් සිටිනවා යැයි ද ධනංජී සේනාධීර ශිෂ්‍යාව පැවසුවාය.

# උපකාරක පන්ති යෑමට තරම්වත් වත්කමක් අපට තිබුණේ නැහැ

## කලා අංශයෙන් මාතර දිස්ත්‍රික්කයේ පළමු වැනියා වූ දෙණියාය මධ්‍ය විද්‍යාලයේ ප්‍රභාෂිණී සෙව්වන්දි

**ටී.කේ. මහින්ද - වැලිගම සමූහ**

උසස් පෙළ කලා අංශයෙන් මාතර දිස්ත්‍රික්කයේ පළමුවැනියා බවට පත්වන්නට දෙණියාය මධ්‍ය විද්‍යාලයේ ප්‍රභාෂිණී සෙව්වන්දි ශිෂ්‍යාව සමත්ව ඇත.

දුෂ්කර ගම්මානයක් වන කොටපොල, ගොඩකුඹුර පදිංචි ඇය පවුලේ එකම දරුවාය. කුඩා කාලයේ සිටම මව හා මිත්තණියගේ සෙවණේ හැදී වැඩුණු සෙව්වන්දි අනේකවිධ බාධක මධ්‍යයේ දිවිය ජය ගත් දියණියකි. ඇයගේ මවගේ ජීවිකාව වන්නේ තේ දලු නෙළීමයි. ගොඩකුඹුර කනිෂ්ඨ විද්‍යාලයෙන් ශිෂ්‍යත්ව විභාගයට මුහුණදෙමින් ලකුණු 151ක් ගත්තද සමත් වෙන්න හැකියාව ලැබුණේ නැහැ. ඉන්පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා දෙණියාය මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වුණා. අපොස (සා/පෙළ) විභාගයෙන් ඒ සමාර්ථ 8ක් හා සී සමාර්ථයක් ගනිමින් තවත් ජීවන කඩඉමක් ජය ගැනීමට ඇය සමත් වූවාය. දෙනෙතට නැගෙන සතුටු කඳුළු පිස දමමින් අය මෙසේ හඬ අවදි කළාය.

'පොඩි කාලේ සිට මට ලොකු බලාපොරොත්තු තිබුණේ නෑ. මේ වගේ ජයග්‍රහණයක් ගැන අදහසක් තිබුණේ නැහැ. ඒත් පොඩි කාලේ සිටම අම්මා මා උනන්දු කළා. දෙණියාය මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වුණාට පස්සේ අරමුණක් කියලා දෙයක් මගේ හිතට දැනුණා. ගුරුභවතුන් නිරන්තරයෙන් මට ඔවදන් දෙමින් දිරිමත් කළා. මං ඒ දේවල් හිතට අරගෙන නිරන්තරයෙන් අධ්‍යාපන කටයුතු ආසාවෙන් කළ නමුත් මේ වගේ ප්‍රතිඵලයක් ලැබෙයි කියලා හිතුවේ නෑ.



### මා සහ ආච්චි ජීවත් කරන්න අම්මා තේ දලු කැඩුවා

මට ආර්ථික දුෂ්කරතා රැසක් තිබුණා. ඒ හැම දෙයක්ම විඳ දරාගෙන විභාගයට මුහුණ දුන්නා. උපකාරක පන්තිවලට වියදම් කරන්න තරම් වත්කමක් අපට තිබුණේ නැහැ. එවකට දෙණියාය මධ්‍ය විද්‍යාලයේ සිටි විදුහල්පති වික්‍රමසිංහ මහතා නිරන්තරයෙන් මා දිරිමත් කළා. ඉන් පසු මම උසස් පෙළ විෂයධාරාව යටතේ සිංහල, භූගෝල විද්‍යාව, බෞද්ධ ශිෂ්ටාචාරය යන විෂයයන් තෝරා ගෙන උසස් පෙළ විභාගයට පෙනී සිටියා.

උසස් පෙළ විෂය ධාරාව ඉගැන්වූ පාසැල් ගුරුවරුන්, උපකාරක පන්ති ගුරුවරුන් මට විශාල ලෙස ඉගැන්වීම් කටයුතුවලදී උදව් කළා. විශේෂයෙන්ම පන්තිභාර සුගත් ගුරු පියාණන් සිංහල විෂයය ඉතා පහසු විෂයයක් බවට පත් කළා. දියදාව ශ්‍රී චන්ද්‍රවිමල දහම් පාසලේ ලොකු හාමුදුරුවන් මේ සෑම දේකටම රුකුලක් වුණා. මම දහම් පාසලේ 3 ශ්‍රේණියේ සිට ධර්මාචාර්ය විභාගය දක්වා ඉගෙනීම් කටයුතු කළා. වෘත්තියෙන් නීතිඥයකු බවට පත්වීම මගේ අනාගත සිහිනයක් බවට පත්ව ඇත.

ඉගෙනීම් කටයුතුවලදී මෙන්ම බාහිර කටයුතුවලදී දහම් පාසලෙන් ලත් දැනුම මගේ ජීවිතයේ විශාල පන්නරයක් බවට පත් වුණා. මට ඉගැන්වූ සියලුම ගුරුභවතුන්ට, විද්‍යාලයේ වත්මන් විදුහල්පති එච්. ජී. දයාරත්න සර්ට වගේම මගේ මේ ජයග්‍රහණය පසු පස සිටි හැමෝටම අනේක වාරයක් ස්තුතිවන්ත වන බව සෙව්වන්දි සමුගන්නා මොහොතේ පැවසුවාය.

ඡායාරූපය - වැලිගම සමූහ



# කුමන බාධක ආවත් රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීමට කැප වෙනවා

## රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියරේ වැඩ අරඹමින් අගමැති කියයි

**රක්ෂණ ශ්‍රියන්ත, භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

රටේ ජනතාවට සෑම විටම හොඳම දේ ලබාදීම අපේක්ෂාව බවත් රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කිරීම කුමන බාධක හෝ දුෂ්කරතා හමුවේ වුවත් කැප වීමෙන් ඉටු කරන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ රුවන්පුර අධිවේගී මාර්ගයේ පළමු අදියරේ වැඩ ඊයේ (7) උදේ ආරම්භ කරමින්, අරලියගහ මන්දිරයේ සිට සූම් තාක්ෂණයෙන් ජනතාව අමතමිනි.

එම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කහතුඩුවේ සිට ආරම්භ කිරීම සනිටහන් වූයේ ද සූම් තාක්ෂණය ඔස්සේ අගමැතිවරයාගේ සුරතිනි.

රුවන්පුර අධිවේගී මාර්ගය කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා සම්පූර්ණ දුර කිලෝමීටර 73.9ක් වන අතර පළමු අදියර ලෙස කහතුඩුව සිට ඉංගිරිය දක්වා කිලෝමීටර 24.3ක දුර ප්‍රමාණයක් ඉදිකිරීමට නියමිතය. දේශීය ඉදිකිරීම් සමාගමක් මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරන අතර ඒ සඳහා රුපියල් බිලියන 54.7ක මුදලක් වැය වෙතැයි ඇස්තමේන්තු කර තිබේ. මෙම අධිවේග මාර්ගයේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු 2024 වසර වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

එහිදී වැඩිදුරටත් කථා කළ අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙසේද පැවසීය.

අපි මේ ආරම්භ කරන්නේ ලංකාවේ හත්වැනි අධිවේගී මාර්ගයයි. මට මතකයි අධිවේගී මාර්ග හදන්න පටන් ගත්ත කාලයේ, මුල් කාලයේ ඉඳලම සබරගමුවේ අපේ ආදරණීය ජනතාව රත්නපුරයට අධිවේගී මාර්ගයක් හදන්නේ කවද ද කියලා අපෙන් ඇහුව්වා. ඒ අය ගැන අවධානය යොමු කරලා රුවන්පුර අධිවේගී මාර්ගයේ වැඩ ආරම්භ කරන්න අපි සැලසුම් කරලා තිබුණේ 2014 වර්ෂයේදී. එදා අපි ඒ වෙනුවෙන් සියලු සැලසුම් සකස් කරලා අවසන් කරලා තිබුණේ. නමුත් වැඩ ආරම්භ කරන්න කලින් මැතිවරණය පරාජය වෙලා අපිට ගෙදර යන්න වුණා. හැබැයි අපි හිතුවා බලයට ආපු ඒ ආණ්ඩුව රටේ සංවර්ධනය අපි නවත්තපු තැනැන් පටන් ගනියි කියලා. ඒ අයට තිබුණේ බලය උදුරා ගැනීමේ වුවමනාව මිසක් රට සංවර්ධනය කිරීමේ වුවමාවක් ඔවුන්ට තිබුණේ නැහැ. ඒ නිසා අපි පටන් ගත්ත හැමදේම පසුගිය ආණ්ඩුවෙන් නතර කළා. ඒ විතරක් නොවෙයි ඒ නිසා අපෙන් පළිගැනීම් කළා. අධිකරණය ඉදිරියට කොමිෂන් ඉදිරියට අපි ගෙන ගියා. අපි ආපසු භාර ගනිද්දී ජාතික ආරක්ෂාවත් ආර්ථිකයත් බින්දුවට දාලා සංවර්ධනය නැවතිලා තිබුණු රටක්. නමුත් අපි ඒ අභියෝගය සතුටින් භාර ගත්තා. අපට අවශ්‍ය වුණේ හැමදාම මේ රටටත් ජනතාවටත් හොඳම දේ දෙන්න. රට දියුණු කරන්න. රටේ ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න. ඒ නිසා මොනතරම් බාධක ආවත් දුෂ්කරතා හමුවේ වුවත් අපි ආණ්ඩුවක් විදියට අපි ඉදිරිපත් කළ ප්‍රතිපත්ති යථාර්ථයක් වන තුරු ඒ වෙනුවෙක් කැප වී කටයුතු කරනවා කියන එක ඔබ දන්නවා. අද ආරම්භ වන රුවන්පුර අධිවේගී මාර්ගයේ කහතුඩුවේ සිට ඉංගිරිය දක්වා පළමු අදියර වසර දෙකහමාරක් ඇතුළත අවසන් කරනවා කියල අපේ ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමැතිතුමා කිව්වා. රාජ්‍ය ඇමැතිතුමාත් ඒක ප්‍රකාශය කළා. අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු මාර්ග සංවර්ධන අධිකාරිය ඒ වෙනුවෙන් විශාල කැපකිරීමක් කරනවා කියලා අපි දන්නවා. මේ මාර්ගයේ කිලෝමීටර් විසි හතරක් වන පළමු කොටස සඳහා දේශීය අරමුදල් රුපියල් බිලියන 54.7ක් ආණ්ඩුව වැය කරනවා. මෙහි ඉදිකිරීම් භාරව කටයුතු කරන්නේ දේශිය සමාගමක්. පළමු අදියරේ කටයුතු අවසන් වූ වහාම දෙවැනි අදියර ද ඉංගිරියේ සිට රත්නපුරයටත් තුන්වෙන් අදියර රත්නපුරයේ සිට පැල්මඩුල්ල දක්වාත් ඉදි කරන්න අපට ශක්තිය තිබෙනවා. අධිවේගී මාර්ගය තමයි මේ රටේ වැඩිම විවේචනය වූ ව්‍යාපෘතිය. හැබැයි අපිව විවේචනය කරපු උදවිය අද ඒ අධිවේගී මාර්ගවල සුව පහසුවෙන් එහාට මෙහාට යනවා. අපිට ඒ ගැන ආඩම්බරයක් තිබෙනවා. මොකද ඒ පාරෙම ගිහිල්ලා ඒ අධිවේගී මාර්ගයටම බැනලා ඔවුන් ඒ අධිවේගී මාර්ගයෙන්ම එනවා. මේ මොහොත වෙන විටත් මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සිදු වෙනවා. මීරිගම සිට පොතුහැර දක්වා කොටස ළඟදීම ජනතා අයිතියට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාලා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වගේම පොතුහැර සිට ගලගෙදර දක්වා කොටසත් මග නැඟුමෙන් වැඩ ආරම්භ කර තිබෙනවා කියලයි අපි දන්නේ. 2006 වර්ෂයේ දී ලංකාවේ පළමුවැනි අධිවේගී මාර්ගය විදියට දක්ෂිණ අධිවේගී මාර්ගයට අපි මුල පුරන්නේ රටේ යුද්ධයක් තියා ගෙන. අද අපි රුවන්පුර අධිවේගී මාර්ගයට මුල පුරන්නේ රට පමණක් නොවෙයි මුළු ලෝකයම කොවිඩ් වසංගතයෙන් වේලාගත් අභියෝගාත්මක අවස්ථාවක. ඔබ දන්නවා කොවිඩ් 19 වසංගතයෙන් ජනතාව ආරක්ෂා කර ගැනීමට ආණ්ඩුවක් විදියට අපි ප්‍රමුඛත්වය දී කටයුතු කරනවා. ඒ වගේම දුෂ්කරතා හමුවේ වුවත් රට සංවර්ධනය කිරීමේ මාවතෙන් අපි බැහැර වෙලා නැහැ. බැහැර වෙන්නෙත් නැහැ. හොඳ මාර්ග පද්ධතියක් කියන්නේ රටක දියුණුව මනින සාධකයක් කියලයි මම විශ්වාස කරන්නේ. මහින්ද චින්තනය වගේම සෞභාග්‍යයේ දැක්මෙන් අපි ඒ ගැන පැහැදිලිව පෙන්වා දී තිබෙනවා. මේ වන විට මුළු ලෝකයම කොවිඩ් වසංගතයට එරෙහිව සටන් කරනවා. කොවිඩ් කියලා අපිට රට වහගෙන ඉන්න හැකියාවක් නැහැ. වයිරසයට එරෙහිව සටන් කරන ගමන් රටේ ජනතාවගේ ආර්ථික තත්ත්වය ගැනත් අපි හිතන්න ඕනෑ. ජනතාව නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදිනවා නම් අපිට මේ තත්ත්වය පාලනය කරන්න එතරම් අපහසු වෙන්නේ නැහැ කියන එක ඔබ දන්නවා. ඒ නිසා මම ජනතාවගෙන් ඉල්ලා සිටිනවා හැම විටම සෞඛ්‍ය අංශ ලබා දෙන උපදෙස් පිළිපදින්න. අපි රටක් ලෙස එකට අත්වැල් බැදගෙන මෙම අභියෝගාත්මක කාලයට මුහුණ දෙමු.

**මහා මාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා -**

අගමැතිවරයා අද අපේ ආරාධනය පිළිගෙන සහභාගි වෙනවා. මේ උත්සවය කළුතර දිස්ත්‍රික්කයේ පවත්වන්න තමයි අදහස් කළේ. නමුත් කොවිඩ් ප්‍රශ්නය නිසා මෙය අන්තර්ජාලය භාවිතා කරමින් විවෘත කරන්න අපි තීරණය කළා. පසුගිය ජනාධිපතිවරණයට පෙර සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළා. එයින් අපි කිව්වා රුවන්පුර අධිවේගයේ වැඩ ආරම්භ කරනවා කියලා. ඒ නිසා පසුගිය කාලයේ අපේ නිලධාරීන් කැපවීමෙන් මේ වෙනුවෙන් කටයුතු කළා. මේ සඳහා අපේ ජනාධිපතිතුමා දැවැන්ත ශක්තියත් ලබා දුන්නා. මෙය කඩිනම් කරන්න ඒ මහතා මඟ පෙන්නුවා. මේ සඳහා අවශ්‍ය මුදල් අනුමත කර ගන්න අගමැති මහින්ද රාජපක්ෂ මහතා දැවැන්ත සහායක් දුන්නා. අපි හැම අයෙක්ම මේ වේලාවේ පරිස්සමින් ඉන්න ඕනෑ. අපි අභියෝග රැසකට මුහුණ දෙනවා. විපක්ෂය හිතන්නේ කොවිඩ් 19 වසංගතය තිබෙන්නේ ශ්‍රී ලංකාවට විතරයි කියලයි. ලංකාවට කෝවිඩ් හැදුණොත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නිසා කියලයි ඔවුන් හිතන්නේ.

ඒත් සමස්ත ලෝකයම කොවිඩ් 19 හේතුවෙන් අභියෝගයට ලක්ව තිබෙනවා. අපි පළමු රැල්ලේදී හා දෙවැනි රැල්ලේදී හොඳින් කටයුතු කළා. දක්ෂ ලෙස ජනාධිපතිවරයා, අගමැතිවරයා සහ ආණ්ඩුව මෙන්ම සෞඛ්‍ය හා ආරක්ෂක අංශ ඒ වෙනුවෙන් මුහුණ දුන්නා. ඒ වගේම අපි තීන්දු කළා රට වහන්න. වහන්න ගිය පසුව එය විවෘත කරන්න කියා බලපෑම් කරමින් උද්ඝෝෂණ කළ විපක්ෂයක් තමයි අද මේ රටේ ඉන්නේ. ඒ නිසා අපි මොන අභියෝග පැමිණියත් සංවර්ධනය නතර කරන්නේ නැහැ. රට සංවර්ධනයෙන් ඉදිරියට යන්න ඕනෑ. සංවර්ධන කටයුතු එක් දිනකින් නවතිනවා කියන්නේ අපේ රටේ ජනතාවගේ අනාගතය ආපස්සට යනවා. ඒ නිසා අපි ඉදිරියට යනවා. සංවර්ධන කටයුතු නවත්වන ප්‍රතිපත්තියේ නොවන ඉදිරියට ගෙනයන ප්‍රතිපත්තියේ සිට අපි කටයුතු කරගෙන යනවා. අපි කිව්වා වැඩ බිමක්ව පැවැති රටක් පසුගිය කාලයේ මුඩු බිමක් බවට පත්වුණා කියලා. ඒ මුඩු බිමක් වූ රට නැවත වැඩ බිමක් බවට පත් කරනවා කිව්වා. ඔවුන්ට තිබුණ අභියෝග නොවෙයි අපිට තිබුණේ. අපිට තිබුණේ වැටුණු ආර්ථිකය නැවත නගාසිටුවන්නයි. හැම අතින්ම වැටුණු රටක් අපිට තිබුණේ. රාජ්‍ය ආරක්ෂාව විනාශ වුණා.

ඒ නිසා අද වනවිට මේ හැම අභියෝගයක්ම අද අපි ජයග්‍රහණය කර තිබෙනවා. ජනාධිපතිවරයා ජයගත් විගස මේ රටේ ජාතික ආරක්ෂාව සහතික කළා. වැටුණු ආර්ථිකය නගාසිටුවන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. අපේ රට සෑම අතින්ම විනාශ කරලයි අපිට පසුගිය කාලයේ බාර දුන්නේ. එම ආර්ථිකය කොවිඩ් අර්බුදය මැද වුවත් නගාසිටුවන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ආර්ථිකය ස්ථාවර කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ මෙවැනි වැඩසටහන් ආරම්භ කර ගන්න හැකිව තිබෙනවා. අද කිලෝ මීටර් 15000ට වඩා ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා. මේ වැඩ කරන්න එපා ආණ්ඩුවට මුදල් නැහැ කිව්වා. ආණ්ඩුව සහ ජනාධිපතිතුමා මුදල් හිගා කනවා කිව්වා. නමුත් අපි අද නිසි කළමනාකරණයකින් ආර්ථිකය හසුරුවාගෙන යනවා. වැව් හදනවා. තරුණයන්ට රැකියා දෙනවා. දැවැන්ත සංවර්ධනයකට මේ ආණ්ඩුව අත ගසා තිබෙනවා. අගමැතිතුමාට මීට වඩා අභියෝග තිබුණා. එවැනි අභියෝග මැද දැවැන්ත සංවර්ධනයක් ආරම්භ කළා. එවැනි තත්ත්වයක් තුළ අගමැතිතුමාට සහ ඒ පවුලට ඇතැමුන් විශාල වශයෙන් කීර්තිනාමයට හානිකර වැඩ කළා.

ඒත් ජනතාව නිවැරැදිව සිට ගෙන වැඩි ඡන්ද ලක්ෂ 15ක් ලබා දෙන්න පියවර ගත්තා. ඒ විශ්වාසය පළුදු වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ හැම සංවර්ධනයක්ම කරන්නේ අපේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්. මේ අධිවේගී මාර්ගය අගමැතිතුමා අද පටන් ගන්නවා. පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ මහතාට චෝදනා එල්ල කළා අධිවේගී මාර්ග කළුගල්වලින් නොව රනින් සාදන්න ඇස්තමේන්තු සකස් කළා කියලා. නමුත් මහින්ද රාජපක්ෂ මහතා දුන්න වට රවුම පාර කළේ රුපියල් බිලියන 66කටයි. ඒ මුදලට ම ඒ මාර්ගයේ තීරු දෙකක් අඩුකර පසුගිය කාලයේ විපක්ෂය ඇස්තමේන්තු සකස් කළා. නමුත් මේ අධිවේගී මාර්ගය බිලියන 2.6 - 2.5ක් වැනි අවම මුදලකට ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. අපිට විරුද්ධ පක්ෂය පහර දෙනවා. ඔවුන්ට මුදල් ගලාගෙන එනවා. ඒවායින් වැඩකරන ආණ්ඩුවට සහ රාජ්‍ය නිලධාරීන්ට මඩ ගසනවා. රටේ ජනතාව බලාගෙන ඉන්නේ ඔවුන්ට කුමක් ද සිදුවන්නේ කියලා. ඒ නිසා අධිවේගය රත්නපුරයට එනවා කියන්නේ දේශීය සහ විදේශීය ව්‍යාපාරිකයන්ට හොඳ අවස්ථාවක් වෙනවා.

පසුගිය කාලයේ හාමුදුරුවරුන්ටත් බොරු කිව්වා. අපිට ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ඉක්මණින් මේ වැඩ කරන්න කියා කියනවා. මේ රුවන්පුර මාර්ගයට මාස 30ක් පමණ දී තිබෙනවා. ඒ කටයුතු ඉතා වේගයෙන් කරගෙන යන්න සිදු වෙනවා. අපි මෙය ඉතා ඉක්මනින් අවසන් කරනවා. මේ තුළින් ගොවිජනතාවගේ නිෂ්පාදන ඉක්මනින් වෙළෙඳ පොළට ගේන්නත් පුළුවන් වෙනවා. මේ වෙනුවෙන් ලබාදෙන ශක්තියට ජනාධිපතිතුමාට සහ අගමැතිතුමාට අපේ ස්තුතිය පිරිනමනවා.

**ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා-**

අද ශ්‍රී ලංකා වාසී ජනතාවට ඉතාමත් සුවිශේෂී දිනයක්. අවුරුදු ගණනක් කතා කරපු මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් හිටපු රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පළමු අදියර අද සුභ මොහොතින් ආරම්භ කළා. මේක 2014ට කලින් පටන් ගන්න ඔන්න මෙන්න තිබුණු අධිවේගී මාර්ගයක්. නමුත් අවාසනාවකට ඒ වේලාවේ අපේ ආණ්ඩුව පැරදිලා, යහපාලන ආණ්ඩුව ඇවිල්ලා පසුගිය අවුරුදු පහක කාලය තුළ ඒ මාර්ගයේ කිසිම කටයුත්තක් කළේ නැහැ. නැවත ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට ඇවිල්ලා එතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉතාමත් පැහැදිලිව සඳහන් වූ දෙයක් තමයි රුවන්පුර අධිවේගී මාර්ගය, මධ්‍යම අධිවේගී මාර්ගය සහ මේ රටේ මාර්ග පද්ධතිය ඉතා ඉක්මනින් අවසන් කරනවා කියන එක. ඒ අනුව එතුමා බලයට පත්වෙලා අවුරුද්දකට වැඩි කාලයක්. මේ ලෝකය කොරෝනා වසංගතයට මුහුණ දෙද්දී, ඒ වසංගතයේ බලපෑමට අපිත් මුහුණ දෙද්දී, එතුමා මේ රටේ ජනතාවට දුන් ඒ පොරොන්දුව ඉටු කිරීමට කැප වෙනවා. එසේම අගමැතිතුමා ප්‍රධානත්වයෙන් කැබිනට් මණ්ඩලයේ අපි සියලු දෙනාට උපදෙස් සපයමින් මේ කිසිම කාර්යයක් නවතන්නේ නැතිව කරන්න කියලා අපිට ජනාධිපතිතුමා උපදෙස් දී තිබෙනවා.

මේ රටේ අපි විශාල කොරෝනා උවදුරකට මුහුණ දී තිබෙද්දීත් මේ සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය දෙන්නේ මේවා නොකොළොත් අපි ගිවිසුම් ගත වෙච්ච ඒ කාරණා අනුව අපි වැඩිපුර මුදල් ගෙවන්න වෙනවා,ඒ කොන්ත්‍රාත් කාර සමාගම් වලට. ඒ නිසා මේ වැඩ පරක්කු වෙනවා කියන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල් තමයි වැඩිපුර ගෙවන්න වෙන්නේ. ඒ නිසා තමයි මගේ ඇමැතිවරයාත් අපි තීන්දු කළේ අපි මේ මාර්ගය ඉතා ඉක්මනින් පටන් ගත්තොත් අපිට පුළුවන් වෙයි ජනතාවගේ මුදල් ටික ඉතුරු කරලා දෙන්න. ඒ අනුව තමයි අද අපි මේ ව්‍යාපෘතිය පටන් ගන්නේ අගමැතිතුමාගේ අතින්. අපි බලාපොරොත්තු වෙනවා මේ අවුරුදු හතරක කාලය තුළ මධ්‍යම අධිවේගී මාර්ගය ඉතා ඉක්මනින් ඉවර කරන්න, රාජගිරිය සිට ඔරුගොඩවත්ත දක්වා එලිවේටඩ් මාර්ගය ඉතා ඉක්මනින් ඉවර කරන්න, කැලණි පාලම දැන් බොහෝ දුරට ඉවරයි. ඒ ටික ඉතා ඉක්මනින් මේ රටට දායාද කරනවා. මේ මාර්ග හැදීම තුළ විශාල ප්‍රතිලාභ සංඛ්‍යාවක් මේ රටේ ජනතාවට ලැබෙනවා. ආර්ථික, ප්‍රවාහන මෙන්ම කාලය ඉතුරු කිරීම වගේ විශාල ප්‍රතිලාභ සංඛ්‍යාවක් මේ රටේ ජනතාවට ලැබෙනවා. විපක්ෂ නායක තුමා පාර්ලිමේන්තුවේ ඇහුවා මේ සියලුම සල්ලි කොරෝනා වසංගතය සඳහා යොමු කරන්න කියලා.

මෙම අවස්ථාවට විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන, සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි, වරාය කටයුතු ඇමැති රෝහිත අබේගුණවර්ධන, වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන යන මහත්ම මහත්මීන්, රාජ්‍ය ඇමැතිවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.



**අද විපක්ෂය හිතන්නේ කොවිඩ් තිබෙන්නේ ලංකාවේ විතරයි කියල**

ඇමැති ජොන්ස්ටන්



**යහපාලනය ඇවිල්ලා රටට ජනතාවට කරපු දෙයක් නෑ**

රාජ්‍ය ඇමැති ලාන්සා





sports.dinamina@lakehouse.lk

# ටෝකියෝ ඔලිම්පික් සිහිනය සැබෑ කර ගැනීමට නිලූක කරුණාරත්නට තවත් තරගයක්



ෆවුස් මොහොමඩ්

ජාතික බැඩ්මින්ටන් ශූර නිලූක කරුණාරත්න ටෝකියෝ ඔලිම්පික් උලෙළට සුදුසුකම් ලැබීමේ අදිටනින් පෘතුගාලයේ අන්තර්ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියට සහභාගි වෙමින් සිටී. මෙවර ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ බැඩ්මින්ටන් ඉසවුව නියෝජනය කිරීමේ අවස්ථාව ඔලිම්පික් සුදුසුකම් හිමි වන ලැයිස්තුවේ පළමු 40 දෙනාට ලැබෙන අතර, නිලූක එහි 41 වැනි ස්ථානයේ පසු විය. ඒ අනුව අනුව 56 වැනි පෘතුගාල අන්තර්ජාතික බැඩ්මින්ටන් ශූරතාවලිය යටතේ ඊයේ ශ්‍රී ලංකා වේලාවෙන් රාත්‍රී 8.38ට පැවැත්වීමට නියමිතව තිබූ තරගයෙන් ජයග්‍රහණය අත් කර ගැනීම ඔහුගේ බලාපොරොත්තුව වී තිබිණි. මේ තරගයේ නිලූකගේ ප්‍රතිවාදියා බවට පත්ව සිටියේ අයිස්ලන්තයේ ක්‍රීඩක කාරි ගනර්සන් ය.

මෙරට බැඩ්මින්ටන් ක්‍රීඩාවේ විශිෂ්ටතම ක්‍රීඩකයා බවට පත්වෙමින් වසර 17ක් ජාතික ශූරතාව දිනා ගැනීමට සමත් වූ 36 හැවිරිදි නිලූක කරුණාරත්න පසුගියදා නිමාවට පත් වූ 68 වැනි ජාතික බැඩ්මින්ටන් ශූරතාව දිනා ගැනීමෙන් පසු දේශීය ක්‍රීඩාවට සමු දුන්නේය. මෙරට බැඩ්මින්ටන් ඉතිහාසයේ වැඩිම අන්තර්ජාතික පදක්කම් සංඛ්‍යාවක් දිනූ එකම ක්‍රීඩකයා වන ඔහු අන්තර්ජාතික බැඩ්මින්ටන් තරග බිමේ රන් පදක්කම් 9ක්, රිදී පදක්කම් 8ක් සහ ලෝකඩ පදක්කම් 4ක් සමඟ අත් කර ගත් සමස්ත පදක්කම් ප්‍රමාණය 21කි.

මීට අමතරව ඕනෑම ක්‍රීඩාවකින් මහාද්වීප 5දීම රන් පදක්කම් දිනූ එකම ශ්‍රී ලාංකික ක්‍රීඩකයා ද වන නිලූක සාග් තරග බිමේ රිදී පදක්කම් 2ක් සහ ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

ලෝක බැඩ්මින්ටන් ශ්‍රේණිගත කිරීම්වල 2012 සැප්තැම්බර් මාසයේ සිට 2014 අප්‍රේල් මාසය දක්වා අඛණ්ඩව 34 වැනි ස්ථානය රැකගත් හෙතෙම එවැනි ගෞරවයක් දිනූ එකම ශ්‍රී ලාංකික ක්‍රීඩකයා ද වේ. වසර 4ක් පුරා ලොව බැඩ්මින්ටන් ක්‍රීඩකයන් අතර, පළමු සියදෙනා අතර සිටි එකම ශ්‍රී ලාංකික ක්‍රීඩකයා ලෙසත් ඔහු වාර්තා පොතට එක්ව සිටී.

මීට පෙර 2012 ලන්ඩන් සහ 2016 රියෝ ද ජැනයිරෝ ඔලිම්පික් උලෙළ නියෝජනය කළ නිලූක කරුණාරත්න අඛණ්ඩව තුන්වැනි වරටත් ඔලිම්පික් තරග වරම් දිනා ගැනීමට සමත් වූයේ නම් එය එවැනි දස්කමක් පෑ එකම ශ්‍රී ලාංකිකයා ලෙස තවත් වාර්තාවක් තැබීමට සමත් වනු ඇත. ටෝකියෝ ඔලිම්පික් සිහිනය සැබෑ කර ගැනීමේ අභිලාෂයෙන් පෘතුගාල අන්තර්ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියෙන් පසු ඔහු තවත් තරගාවලියකට සහභාගි වීමට නියමිතය.

## මහේලත් මාලදිවයිනේ



කොරෝනා වසංගතය හේතුවෙන් අයිපීඑල් තරගාවලිය අතරමඟ නතර කිරීමත් සමඟ තරගාවලියට එක්ව සිටින විදෙස් ක්‍රීඩකයන්, පුහුණුකරුවන් සහ නිලධාරීන් ඇතුළු සියලු දෙනා සිය රටවල් බලා පිටත්ව යෑමට කටයුතු කර තිබේ.

එහෙත් ඔස්ට්‍රේලියාව පනවා ඇති තහනම් හේතුවෙන් ඔස්ට්‍රේලියානු ක්‍රීඩකයන් නිරෝධායනය සඳහා මාලදිවයිනට ගෙන ගොස් ඇති අතර, ඉන්දියාවේ සිට පැමිණෙන ගුවන් යානාවලට මෙරටට ඇතුළු වීම තහනම් කිරීම හේතුවෙන් මුම්බායි ඉන්දියන්ස් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස කටයුතු කරන මහේල ජයවර්ධනට ද මාලදිවයිනේ රැඳී සිටිමින් නිරෝධායනයට ලක් වීමට සිදු වනු ඇතැයි මුම්බායි ඉන්දියන්ස් බලධාරීන් පවසා තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ තහනම ඉවත් වන තෙක් ඔහුට මාලදිවයිනේ රැඳී සිටීමට සිදු වන අතර, අනතුරුව ඔහු ශ්‍රී ලංකාව බලා පිටත්ව යනු ඇතැයි මුම්බායි කණ්ඩායමේ නිවේදනයක සඳහන් වී තිබිණි.

අයිපීඑල් තරගාවලියට එක්ව සිටින ඔස්ට්‍රේලියානු ජාතිකයන්ට රටට ඇතුළු වීම තහනම් කරමින් පනවා ඇති සංචරණ සීමා හේතුවෙන් එම ක්‍රීඩකයන් පුහුණුකරුවන්, නිලධාරීන් සහ විස්තර විචාරයකයන් ද විශේෂ ගුවන් යානා මඟින් මාලදිවයින බලා පිටත් කර යැවීමට අදාළ කණ්ඩායම් කටයුතු කළේය. මේ මස 15 වැනිදා ඔස්ට්‍රේලියානු සංචරණ සීමා අවසන් වීමට නියමිත අතර, මාලදිවයිනේ දින 14ක නිරෝධායන කාලසීමාව ගත කිරීමෙන් පසුව ඔස්ට්‍රේලියානුවන් යළි සිය රට බලා පිටත්ව යෑමට නියමිතය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව පනවා ඇති තහනම ඉවත් කරන දිනයක් මේ වන තෙක් සඳහන් කර නැත.

මුම්බායි කණ්ඩායම නියෝජනය කළ නවසීලන්ත, දකුණු අප්‍රිකා සහ කොදෙව් ක්‍රීඩකයන් හා සහාය කාර්ය මණ්ඩල සාමාජිකයන් විශේෂ ගුවන් යානා මඟින් පිටත් කර හැරීමට මුම්බායි ඉන්දියන්ස් බලධාරීන් සැලසුම් කර තිබේ.

රාජස්ථාන් රෝයල්ස් කණ්ඩායමේ ක්‍රීඩා අධ්‍යක්ෂ ලෙස කුමාර් සංගක්කාර ද මෙවර අයිපීඑල් තරගාවලියට එක්ව සිටියේය.

## අයිපීඑල් ඉතිරි තරග එංගලන්තය ඉල්ලයි

කොරෝනා වසංගතය හේතුවෙන් අතරමඟ නවතා දැමූ ඉන්දීය ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ ඉතිරි තරග එංගලන්තයේදී පැවැත්වීමට ඉල්ලීම් ඉදිරිපත් වෙයි.

මේ තරගාවලියේ එළැඹෙන සැප්තැම්බර් මාසයේ පැවැත්වීම සම්බන්ධයෙන් එංගලන්තයේ ප්‍රාන්ත කණ්ඩායම් කිහිපයක අවධානය යොමු කර ඇති අතර, ඒ අනුව වර්වික්ෂෙයාර්, සරේ, ලැන්කෂයර් සහ මාරිලිබෝන් ක්‍රිකට් සමාජය මේ සම්බන්ධයෙන් එංගලන්ත සහ වේල්ස් ක්‍රිකට් ආයතනයට ලිපි යොමු කර ඇතැයි ද වාර්තා වේ.

කෙසේ වෙතත්, ඉන්දීය ක්‍රිකට් ආයතනය මේ තරගාවලිය වෙනත් රටක පැවැත්වීම සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් ගෙන නැති අතර, එහි ඉතිරි තරග 31 එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී පැවැත්වීම කෙරෙහි ඉන්දිය ක්‍රිකට් බලධාරීන්ගේ අවධානය යොමු වීමට ඉඩ ඇතැයි වාර්තා වේ. එහෙත් මේ සඳහා සංචරණ සීමා බලපාන අතර, එංගලන්තයේ අවධානය මේ සඳහා යොමු වී ඇත්තේ සැප්තැම්බර් මාසයේ ඉන්දීය කණ්ඩායම එංගලන්තයේ ටෙස්ට් තරගාවලියට එක්වීමට නියමිතව තිබීමය. එම තරගාවලිය සැප්තැම්බර් මස 14 වැනිදා නිමාවට පත් වීමට නියමිතය. එහෙත් ලොව පුරා ක්‍රීඩකයන් එංගලන්තයට ගෙන ඒමේදී නිරෝධායන ගැටලු රැසක් පැන නගිනු ඇතැයි ද වාර්තා වේ.

## කොරෝනා සටනට කෝලිගෙන් කෝටි 2ක්



ඉන්දීය ක්‍රිකට් නායක විරාට් කෝලි සහ ඔහුගේ බිරිය අනුෂ්කා ශර්මා එක්ව කොරෝනා වසංගතයට එරෙහි සටන සඳහා ඉන්දීය රුපියල් කෝටි 2ක මුදලක් පරිත්‍යාග කර තිබේ.

ඉන්දියාවේ කොරෝනා වයිසරය මේ වන විට ඉතා දරුණු තත්ත්වය පවතින අතර, ඉන්දියාවට මෙය ඉතා අසීරු බවත්, තම රට මේ අයුරින් දුක් විඳීම දැකීම ගැන ඇත්තේ වේදනාවක් බවත් කෝලි සහ අනුෂ්කා පවසා ඇත.

ඔවුන් මෙලෙස අමෙරිකානු ඩොලර් 270,000ක් පරිත්‍යාග කර ඇත්තේ කොරෝනා සහන සඳහා අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාරයක් සඳහායි.

“දැන් ඔවුන්ට අපගේ සහයෝගය අවශ්‍යයි. අප ඔවුන්ගේ පැත්තේ සිටගෙන සිටිය යුතුයි. එබැවින් අනුෂ්කා සහ මම මේ සඳහා අරමුදල් සම්පාදයනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත්තෙමු. තවද අප ඔබ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ මේ වැඩසටහනට සම්බන්ධ වී පරිත්‍යාග කරන ලෙසයි” කෝලි පවසා තිබේ.

## අබුඩාබි ‘ටී ටෙන්’ නොවැම්බර් 19 සිට



එමිරේට්ස් ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අබුඩාබි ‘ටී ටෙන්’ ඕවර 10 ක්‍රිකට් තරගාවලිය මේ වසරේ නොවැම්බර් මස 19 වැනිදා සිට පැවැත්වීමට සැලසුම් කර තිබේ. පස්වැනි වරට පැවැත්වෙන මේ තරගාවලිය දෙසැම්බර් මස 4 වැනිදා නිමාවට පත් වීමට නියමිත අතර, දෙසැම්බර් මස 2 වැනිදා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 50 වැනි ජාතික දිනය සැමරීම යේදී ඇති බැවින් තරගාවලිය දින 15කට වඩා දිගු වනු ඇතැයි සංවිධායකයෝ පවසති. එලෙස වුව හොත් මෙය දීර්ඝතම ටී ටෙන් තරගාවලිය වනු ඇත.

“ලොව ජනප්‍රියම ක්‍රිකට් ක්‍රීඩකයන් මේ අතිවිශාල ජනප්‍රිය ආකෘතියෙන් දැකීම වඩාත් සතුටට කරුණක් වන අතර, ඉදිරියට එන ක්‍රිකට් ක්‍රීඩකයන්ට ජ්‍යෙෂ්ඨයන් සමඟ ක්‍රීඩා කිරීමට ලැබීම මේ තරගාවලියේදී කදිම අවස්ථාවක් බවත් ටී ටෙන් ක්‍රීඩා කළමනාකරණ සභාපති ෂජී උල් මුල්ක් පවසයි.

මේ වසරේ පැවැත්වෙන ලෝක කුසලාන විස්සයි20 තරගාවලිය නොවැම්බර් මස 15 වැනිදා නිමාවට පත් වීමට නියමිත අතර, ඉන්දියාවේ පවතින කොරෝනා තත්ත්වය හේතුවෙන් එම තරගාවලිය සත්කාරකත්වය සැපයීමට එමීර් රාජ්‍යයද බලාපොරොත්තුවෙන් සිටී.

එසේ වුව හොත් ලෝක කුසලානයෙන් පසුව එම රටේදීම ටී ටෙන් තරගාවලිය පැවැත්වීමෙන් ඊට එක්වන ක්‍රීඩකයන්ට ගමන් බිමන් සහ නිරෝධායන නීතිවල ගැටලුවක් ඇති නොවනු ඇත.

අබුඩාබි ටී ටෙන් අවසන් තරගාවලිය මේ වසරේ ජනවාරි 28 වැනිදා සිට පෙබරවාරි 6 වැනිදා දක්වා පැවැති අතර, එහි ශූරතාව දිනා ගැනීමට නොදර්න් වොරියර්ස් කණ්ඩායම සමත් විය. එම තරගාවලිය පැවැතියේ කොරෝනා වසංගතය පැවැති පසුබිමක වුවද තරගාවලිය සාර්ථකව නිමාවට පත් විය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එම තරගාවලියට එක් වූ මහේෂ් තීක්ෂණ සහ ධනංජය ලක්ෂාන් විශිෂ්ට දස්කම් දැක්වීමට සමත් වූහ.

## විලියම්සන් ඇතුළු පිරිසක් දිල්ලියේ ජෛව බුබුළක



නවසීලන්ත ක්‍රිකට් කණ්ඩායමෙන් මෙවර අයිපීඑල් තරගාවලියට එක් වූ ක්‍රීඩකයෝ ඊයේ යළි සිය රට බලා යෑමට කටයුතු කළහ.

එහෙත් නවසීලන්ත ක්‍රිකට් නායක කේන් විලියම්සන් ඇතුළු ක්‍රීඩකයන් තිදෙනකු සහ භෞත චිකිත්සකවරයා ලෙස කටයුතු කරන ටොමී සිම්සෙක් ඉන්දියාවේ දිල්ලි නුවර ජෛව ආරක්ෂිත බුබුළක රැඳී සිටින බව නවසීලන්ත ක්‍රිකට් ආයතනය පවසයි.

ඒ ලබන සතියේ ආරම්භ වීමට නියමිත නවසීලන්ත ක්‍රිකට් කණ්ඩායමේ එංගලන්ත සංචාරය හේතුවෙනි. තරග දෙකකින් සමන්විත ටෙස්ට් තරගාවලියකට සහ අයිසීසී ලෝක ටෙස්ට් ශූරතාවලියේ අවසන් මහා තරගයට එක් වීම සඳහා මෙලෙස නවසීලන්ත පිල එංගලන්තය බලා පිටත්ව යෑමට නියමිතය.

විලියම්සන් ඇතුළු පිරිසට එංගලන්තය බලා යෑමට 11 වැනිදා තෙක් බලා සිටීමට සිදු වීමෙන් මෙලෙස දිල්ලි නුවර රැඳෙන අතර, පසුව එංගලන්තයේදී කණ්ඩායමට එක් වනු ඇත.

කෙසේ වෙතත් කණ්ඩායමේ ප්‍රධාන වේග පන්දු යවන්නකු වන ට්‍රෙන්ට් බෝල්ට් අද (8) නවසීලන්තය බලා පිටත්ව යන අතර, ඔහුට එංගලන්තය සමඟ තරගාවලියේ පළමු තරගය අහිමි වන අතර, දෙවැනි තරගයට ක්‍රීඩා කිරීමේ අවස්ථාවක් පවතී. ඔහු ජූනි මස මුලදී ටෙස්ට් කණ්ඩායම සමඟ එක්වන බවත් ඉන් පෙර පවුලේ සාමාජිකයන් සමඟ කාලය ගත කිරීම සඳහා නවසීලන්තයට පැමිණෙන බවත් ක්‍රිකට් ආයතනය සඳහන් කර තිබිණි.

කෙසේ වෙතත් ඔහු අනිවාර්යයෙන්ම ලෝක ටෙස්ට් ශූරතාවලියේ අවසන් මහා තරගයට ක්‍රීඩා කරන බව නවසීලන්ත ක්‍රිකට් ආයතනය පවසයි.

ටෙස්ට් සංචිතයේ නවසීලන්තයේ සිටින සාමාජිකයන් මේ 16 සහ 17 දිනවල එංගලන්තය බලා පිටත්ව යනු ඇත.

නවසීලන්ත - එංගලන්ත ටෙස්ට් තරගාවලිය ජූනි 2 වැනිදා ආරම්භ වන අතර, දෙවැනි තරගය 10 වැනිදා සිට පැවැත්වේ. ලෝක ශූරතාවලියේ අවසන් මහා තරගය ඉන්දියාව සහ නවසීලන්තය අතර, ජූනි 18 වැනිදා පැවැත්වීමට නියමිතය.

## ඈෂ්ලෙයි බාර්ටි අවසන් තරගයට



ලොව අංක එකේ ටෙනිස් ක්‍රීඩිකාව වන ඔස්ට්‍රේලියාවේ ඈෂ්ලෙයි බාර්ටි ස්පාඤ්ඤයේ පැවැත්වෙන මැඩ්රිඩ් විවෘත ටෙනිස් තරගාවලියේ කාන්තා කේවල අවසන් තරගයට සුදුසුකම් ලබයි.

අවසන් පූර්ව වටයේදී ස්පාඤ්ඤයේ වයිල් කාඩ් ක්‍රීඩිකා පෝලා බඩෝසා වට 2-0කින් පරාජය කිරීමට 25 හැවිරිදි බාර්ටි සමත් වූවාය. එම තරගයේ ලකුණු තත්ත්වය වූයේ 6-4ක් සහ 6-3කි.

බාර්ටි අද (8) තරගාවලියේ අවසන් තරගයේදී 23 හැවිරිදි බෙලරූස් ක්‍රීඩිකා ආර්යානා සබලෙන්කා සමඟින් තරග වැදීමට නියමිතය. සබලෙන්කා අවසන් පූර්ව වටයේදී රුසියාවේ ඇනස්ටේෂියා පව්ලියුචෙන්කෝවා (6-2ක් සහ 6-3) පරාජය කරමින් අවසන් තරගයට එක් වූවාය.

## තරුණ සේවා - රූපවාහිනී වොලිබෝල් මූලික වටයේ ජාතික තරග ගම්පහදී අවසන්

ගම්පහ දිස්ත්‍රික් විශේෂ
සිසිල ගුණතිලක



ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය සහ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව සංවිධාන කරන 34 වැනි “තරුණ සේවා-රූපවාහිනී” අභියෝග ශූරතා වොලිබෝල් තරගාවලියේ ජාතික මට්ටමේ මූලික තරග පසුගියදා ගම්පහ මහා නගර සභා ක්‍රීඩාංගණය ඇතුළු ක්‍රීඩාංගණ 3කදී සාර්ථකව නිමාවට පත් විය.

තරගාවලියේ සමාරම්භක උත්සවය නාගරික සංවර්ධන රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කෝකිලා ගුණවර්ධන, ජාතික තරුණ සේවා සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් දමිත වික්‍රමසිංහ හා ගම්පහ පුරපති ඒරංග සේනානායක යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මේ තරගාවලියට දිවයිනේ සියලු දිස්ත්‍රික්ක නියෝජනය කරමින් කාන්තා හා පිරිමි කණ්ඩායම් 26 බැගින් සහභාගී විය. එහිදී මූලික වටය ජය ගනිමින් පිරිමි අවසන් පූර්ව තරග සදහා කොළඹ, කෑගල්ල, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික් කණ්ඩායම්ද, කාන්තා තරග සඳහා කොළඹ, පුත්තලම, හම්බන්තොට සහ අම්පාර යන දිස්ත්‍රික් කණාඩායම් ද තේරී පත් විය.

ඡායාරූප - ගම්පහ දිස්ත්‍රික් විශේෂ



# හඳට පොලු ගහන්න එන්න



දේශ ගවේෂකයකු වූ වස්කෝද ගාමා ක්‍රි.ව. 1498දී වනමලින් සැරසීගෙන ලෝකයට ප්‍රවහන් වී සිටි "ඉන්දීය යුවතිය" සොයාගත් තැන් පටන් ඇගේ පරිණාමය හරි අපූරුය...

කැලිකට් නගරය මුවදොර කොටගෙන සමස්ත ලෝකයේ ම ඇසට නිරාවරණ වූ ඉන්දියාව පසු කලකදී පෘතුගීසි - ඉංග්‍රීසි ආගමනයන් ඔස්සේ ගත කළ කාල පරිච්ඡේදයන්ගේ අසීරුතාව සුළුපටු නොවේ. එනමුත් විසිඑක් වන සියවස වන විට "ඉන්දියාව" තම ස්වාධීන ගමන්මඟ මොනවට එළිපෙහෙළි කර ගනිමින් ස්වයංපෝෂිත ජීවන අර්ථ ක්‍රමයකට කාලයාගේ ඇවෑමෙන් ගමන්කොට තිබේ...

TATA, Mahindra, Airtel, බජාජ් වැනි ලෝ පතළ සන්නාමයන්ගේ සිට මුකේෂ් අම්බානි ආසියාවේ මහා ධන කුවේරයා ලෙස ලෝක ධනවතුන් අතරට එකතු වීම, ඉන්දියාවේ නැගී සිටීම පිළිබඳ ජීවමාන උදාහරණ සපයයි.

යටත්විජිතයක්ව පැවති සමයේ අධිරාජ්‍යවාදීන්ගේ භාණ්ඩ අමුද්‍රව්‍ය ප්‍රවාහනය පිණිස ඉන්දියාව තුළ ස්ථාපනය කරන ලද මංමාවත් පද්ධති - දුම්රිය ගමනාගමනය ඇතුළු තාක්ෂණ - සන්නිවේදන අනුභූතීන් ඔස්සේ නිර්මාණය වෙමින් පැතිර ගියේ "මහත්මා ගාන්ධිගේ" "සුරේන්ද්‍රනාත් බැනර්ජි" ගේ ස්වදේශික චින්තනයයි.... දේශීය නිෂ්පාදන දිරිමත් කළ යුතු බවට උපන් උදාර ගීත රාවයයි...

කපු රෙදි කඩක් ගත දවටාගත්, ගතින් වයෝවෘද්ධ මුත් මාහැඟි ජීවයක් මනසින් දරා සිටි ගාන්ධිතුමන්ගේ ස්වදේශික නිෂ්පාදන ඇගයීමේ චින්තනය බලගැන්වීමේ ව්‍යාපාරය දූරදර්ශී දැක්මක් ලෙසින් ක්‍රියාත්මක වූයේ අනාගත භාරත මාතාවට පවා සෙවණ සැලසෙන ආකාරයටයි.

හිරු නොබසිනා අධිරාජ්‍යයේ "හිරු රැසින්" තම ජාතික චින්තනයේ සියපත් පුබුදුවාගත් ඉන්දියාව අද වන විට මෙවැනි සදාහරිත ශක්තිමත් රාජ්‍යයක් බවට පත්ව තිබීම එසේ හෙයින් විස්මය දනවන්නක් නොවේ...

චකිතය ඇති වන්නේ කලාපීය හිතවතුන් ලෙස සමාන දුක්මුසු කාලයන් - වාලුකාවන් පසුකර ආ නමුත් සැලකිය යුතු පිම්මකින් නව ලොව ජයගත් ආසියාව අබියස ලංකාව පමණක් අදට ද සංවර්ධනයේ අත්පොත් කියවමින් ඉඳුල් කටගාමින් සිටීම පිළිබඳවයි....

සාක්ෂරතාව විෂයෙහි ඉහළ මිනුම් අගයක සලකුණ සහිතව වුවත්, අතිශය මන්දගාමී ලෙසින් සිදුවන සමාජ- ආර්ථික විකාශනයක කොටස්කරුවන් ලෙස දුක්ඛිත ස්ථානයක අප තවමත් නතර වී සිටී.

රට තුළ නිබඳවම පවතින දේශපාලනික ආර්ථික අස්ථාවරභාවය සිය නුවණින් නොඉවසන උගතුන්ගේ බුද්ධිගලනයත්, දැක්මක් සහිත ප්‍රතිභාපූර්ණ මිනිසුන් ජරාජීර්ණ සමාජ ක්‍රමය තුළ සක්‍රිය වීමට දක්වන පැකිළීමත් හේතුවෙන් කරළිය මත දක්නට ලැබෙන්නේ ද ගලන ගඟෙන් දිය දෝතක් බොන්නට සූදානම් අවස්ථාවාදීන්ම මිස උඩුගං ගලා පිහිනීමට වෙර දරන්නන් නොවේ.

1969 වර්ෂයේදී අභ්‍යවකාශගාමීන් වූ නීල් ආම්ස්ට්‍රෝංග්, මයිකල් කොලින්ස්, එඩ්වින් ඕල්ඩ්‍රින් සඳ තරණය කිරීමේ මෙහෙයුමක නිරත වනුද, නීල් ආම්ස්ට්‍රෝංග් ලොව ප්‍රථම සඳගාමියා ලෙස ඉතිහාසයට එක්වෙනුද ට්‍රාන්සිස්ටර රේඩියෝවෙන් හෝ කැසට් ටේප් රෙකෝඩරයෙන් එදා අසා දැනගත් අප, අද වන විට චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ එසැණ රූප ලෙස මුළු විශ්වයම කාලයේ බාධාවෙන් පවා තොරව අපගේ ඇස් මායිමට කැඳවා ගැනීමට තරම් භාග්‍යවන්තයන් බවට පත්ව ඇත....

අන්තර්ජාලය - ස්මාට් දුරකතනය වෙතට ලෝක තාක්ෂණය මඟින් අපගේ සන්නිවේදන කර්තව්‍යය විතැන් කොට ඇත.

ඇපලෝ 11 යානයේ සඳගමනය ට්‍රාන්සිස්ටර රේඩියෝවෙන් දැන හැඳිනගත් අප අද STS - 51 යානය අභ්‍යවකාශගතවනු අන්තර්ජාලය ඔස්සේ වඩාත් තීව්‍ර හා සියුම්ව දැන ගනී, දැක ගනී.

ඒ ලෝක තාක්ෂණයේ දායාදයයි. එනමුත් ලෝකයට දෙන්නට හෝ පෙන්වන්නට රටක් වශයෙන් අප කිසියම් හෝ දියුණුවක් පරිචයක් ලබාගෙන ඇති මානය කුමක්ද? ඉසව්ව කොතනද?

ආර්ථික - සමාජ විද්‍යාත්මක - භෞතික හෝ ආධ්‍යාත්මික වශයෙන් අපගේ මිනුම් අගය සැලකිය යුතු විපර්යාසයකට බඳුන් වී ඇත්දැයි යන්න සොයා බැලීමට විපරමක් අවශ්‍ය නොවන්නේද?

සුප්‍රසිද්ධ ගුණදාස මලලසේකර ශබ්දකෝෂයේ ඩොලරය යන්නට හැඳින්වීම සඳහා "ලංකා රුපියල් පහක පමණ වටිනාකමකි"යන්න වරහන් කොට සඳහන් කර තිබීමේ සිට දශක කිහිපයකට පසු අද දවස වන විට ලංකා රුපියල් එකසිය අනූඅටක අගයක් දක්වා ඩොලරය සිය ආර්ථික අරමුණු දික්විජය කොටගෙන තිබේ.

එහෙත් අපි තවම කොතැනද,

සමකාසන්න රටක් වීම තුළ පරිසර පද්ධතියෙන් නිතර ලැබෙන සහයෝගාත්මක අතහිත දීමත්

- ගිනිකඳු - අනවරත ජල ගැලීම් - භූමිකම්පා - ඍතු විපර්යාසයන්ගෙන් තොර වීමෙන් ලැබෙනා සැනසිලිදායක ඉසිඹුවත් සලකා බලමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය තුළ පවතින අඛණ්ඩ මන්දගාමීත්වය පිළිබඳව සිතා බැලීමේදී සිහියට නැගෙන්නේ සම්මානලාභී කවියකු වන රුවන් බන්දුජීවයන්ගේ කවියකින් උපුටනය කොට ගත් පහත වදන් ඇමිණුමයි.

"සුබ ප්‍රාර්ථනා තුඩුවේදිත් නැව් ගිලෙන බව ඇත්තයි"

හතර වටින් සමුද්‍ර දායාදය ඇතුළුව භූ විෂමතාවයෙන් පවා වරදාන වරප්‍රසාද ලද මුත් එකතැන පල්වන ලංකාව වනාහි සුබ ප්‍රාර්ථනා තුඩුවෙහිදී පවා ගිලී යමින් පවතින නෞකාවක් ම නොවන්නේද?

■ චාමිකා අරවින්දි




2021 මැයි 08 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
2021 මැයි 08 සෙනසුරාදා
සදුතනික පත්තර කාර්ණ්‍යය

# යොවුන් ජනතා

## හුස්ම ඉල්ලන ඉන්දියාව






හොඳම තත්පරේ ගෙවෙන තත්පරේද? PAGE 05



පිනිලන්තෙ හොඳම ගෙවේ.. PAGE 07



හඳට පොලු ගහන්න එන්න PAGE 08

## අපි ඔබ ඉලක්ක කරන්නෙමු

යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මග සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.

චින්න, අපි හරි පාරක් හදමු

සංස්කරණය - රජිත බස්නායක
younjanatha@lakehouse.lk
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35
ලේක් හවුස්
ඩී. ආර්. විජයවර්ධන මාවත
කොළඹ 10

යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත් younjanatha@lakehouse.lk ලිපිනයට යොමු කරන්න

ඕසෝන් වියනත් හිල් කරපු මිනිස්සුන්ට

# ගහකොළ කපන එක කප්පක් ද?

පරිසරය කියන්නෙම හරි අපූරු නිමිත්තක්. කුඩා දරුවන් උපන් මොහොතේ පටන් පරිසරය හා බැඳෙයි. කුරුලු ගීත, ගංගා ගලා බසිනා නාදය, ගහකොළ තාලෙකට නැළවෙන ඒ මියුරු සංගීතය සදා සිත් සුවපත් කරවන ඔසුවකි. කුඩා දරුවන් පවා නැළැවෙන්නේ මේ සොබාදම් තුරුලේ යැයි පැවසුවොත් මා නිවැරදියි. සිරිලක කුඩා භූමි භාගයක් වුවත් එහි එක් එක් ප්‍රදේශයන්ට ආවේණික ජෛව විවිධත්වයක් දැකගත හැකිය. මේ අනුව ගහකොළවල ස්වරූපය පමණක් නොව එය නිජබිම් කර ගනිමින් ජීවත් වන සතා සිවුපාවාගේ පවා මේ විවිධත්වය දැකගත හැකිය. මේ විවිධත්වය හේතුවෙන්ම විදේශීය සංචාරකයන් බොහෝ දෙනා ලක්දිව වෙත පැමිණෙයි. රට මැද ඇති සොබා සෞන්දර්යයත් රට වටා ඇති අලංකාර මුහුදු තීරයත් මනස්කාන්ත දසුන් මැවීමට උපන්ගෙයිම හපන්නෝ වෙති. ඒ නිසාම ලංකාවට හිමි සොබා සෞන්දර්යය ලෝක ප්‍රසිද්ධිය ලබා ඇත.

අපගේ පැරැන්නෝ සොබාදහම පණ මෙන් රැක ගත්තෝය. එහි ප්‍රතිඵලයක් ලෙස අදටත් අපට සොඳුරු පරිසරයක් උරුම වෙයි. එහෙත් අද වන විට වර්තමාන පරපුර විසින්ම අපගේ පරිසරය වනසා ගනිමින් පවතී. මහ පොළොව අපට මෙන්ම සතා සිව්පාවාට උරුම යැයි කට වචනයට බොහෝ දෙනා උදම් අනති. එහෙත් වල් අලියෙක් ගම් වැදුනහොත් මරා දැමීමට තරම් අපි කුරිරු වී ඇත්තෙමු. සංවර්ධනය යැයි පවසමින් අහිංසක සතුන්ගේ නිජබිම් විනාශ කරමින් ඒවා අපම අල්ලාගෙන සතුන්ගේ වාසස්ථාන නැති කිරීමට තරම් අප කුරිරු වී ඇත. රට පුරා සිදුවන වනාන්තර විනාශ කිරීම හේතුවෙන් වර්ෂා රටාව ද වෙනස් වෙමින් පවතී. මේ නිසාම විශාල ගොවිබිම් ප්‍රමාණයක් විනාශ වී යනු අපගේ නෙත ගැටෙයි. "ඔක්සිජන් කන්නදැයි" කටමැත දොඩවමින් ආඩම්බරකාරකම් පෙන්වන අපගේම ඇයන්ට ගහක කොළක වටිනාකම යථාර්ථ සොබාදම් නීතිය පසක් කරමින් සිටී. අහස් කුස සිසාරා නැඟුණු ගොඩනැඟිලි වෙනුවෙන් මහ පොළොවේ පස් නිධි අප කෙතරම් විනාශ කරන්නට ඇත් ද? ඒවා අපටම සාපයක් වී නායයෑම්, ගංවතුර ආදි ස්වභාවික උවදුරුවලින් පීඩා ගෙනදෙයි. සීමාන්තික නොවූ මුදල් ඉපයීම මත කර්මාන්තශාලා බිහිවන්නේ හතු පිපෙන්නාක් මෙනි. මේවායින් සිදු වන වායු දූෂණය, ශබ්ද දූෂණය පමණක් නොව ජල දූෂණය ද අපමණය. මෙනිසා චර්ම රෝගීන් පමණක් නොව ශ්‍රවණාබාධිතයන් ද බොහොමයක් සිටී. මින් නොනැවතී පිළිකා රෝගීන්ගේ වර්ධනය ද උච්චතම අවස්ථාවකට පැමිණ ඇත.

මහ පොළොව විනාශයෙන් නොනැවතුණු කුරිරු මිනිසා මහ සයුරට ද අභියෝග කළේය. කැළිකසළ අපමණක් මහ සයුරට මුදා හරින්නට මිනිසා කටයුතු කරන්නට විය. අසීමාන්තික ලෙස ජලජ ජීවීන් ගොදුරු කර ගනිමින් ජෛව පද්ධතිය අසමබර කිරීමට කටයුතු කරන්නේ ද මිනිසායි. සංවර්ධනයේ උච්චතම අවස්ථාව තුළ සිටිමින් අහස් ගැබ සිදුරු කරමින් ඕසෝන් වියන පළුදු කළේ ද මිනිසාමයි. ගොනා පසුපස ඇදෙන කරත්ත රෝදයක් මෙන් මිනිසා විසින්ම කරන ලද සොබාදම් විනාශය නිසා විවිධ රෝගාබාධවලින් පීඩා විඳීමට මිනිසාටම සිදුව ඇත.

දුරදිග නොබලා මිනිසා විසින්ම සිදු කරනු ලබන සොබාදහම් වැනසුම නිසා අද වන විට කඳුළු සලන්නේ ද මිනිසාමයි.



**නිශානි සචින්දිකා රාජපක්ෂ**
ජන සන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය



# විද්‍යාව ළං කරගෙන අන්තිමේදී මොකද වුණේ

කොටියෙන් විග්‍රහ කර බැලුවහොත් මිනිසා නොදන්නා සියලුම දේවල් පරීක්ෂා කර බැලීමත් ඒ අතරින් හසුකරගත් දැනුම හා අවබෝධයත් විද්‍යාව ලෙස හඳුන්වයි. උණුසුම නිසා වාෂ්ප වූ ජලය අහසට නැග යළි වර්ෂාව ලෙස පොළොවට පතිත වන බව දැන ගැනීම හා පැවසීම විද්‍යාව වේ. එමෙන්ම මිනිසාට වැලඳෙන බොහෝ රෝග වයිරස් බැක්ටීරියා ආදි ක්ෂුද්‍ර ජීවීන් හේතු කොටගෙන සිදු වන්නක් බව දැන ගැනීම හා ඒවාට පිළියම් දැන ගැනීම ද විද්‍යාව වේ. එපමණක් නොව ගහකොළ සතා සීපාවා ඇතුළු සමස්ත විශ්වයේම ආරම්භය හා පැවැත්ම පිළිබඳ සොයා ගැනීම ද විද්‍යාව වන්නේය. විද්‍යාව යන විෂය දියුණුවෙන් දියුණුවට පත් වී ඇත. අතීතයේ සිට මේ දක්වා මිනිස් සමාජයට විපුල ඵල ගෙන එමින් පවතී.

විද්‍යාව දියුණුවත්ම මිනිසා පිරිහෙයි ද යන ගැටලුව වර්තමානයේ පැනනැඟුනක් නොවේ. බොහෝ අතීතයේ ද වෙනස් වීම නොපිළිගන්නා පිරිස් විද්‍යාවේ දියුණුවත් සමඟ මිනිසා පිරිහෙන බවට අනාවැකි පළ කර තිබේ. නමුත් සිදු වී ඇත්තේ බුද්ධිය වැඩි වන විට ගුණධර්ම ද වැඩි වීමය. අතීතයේ වන සතුන් ලෙස මිනී මස් බුදිමින් ජීවත් වූ මිනිසුන් වර්තමානය වන විට ශිෂ්ටසම්පන්න වී තිබෙන්නේ ද ස්වභාවධර්මයට අනුව ලෝක ජනගහනය කෙතරම් වැඩි වුව ද, ජෛව, ජලල ශිලාල සහ වායු ගෝලවල සමතුලිතතාවත් මේ තරමට පවත්වාගෙන යනු ලබන්නේ විද්‍යාව සහ ඒ ඇසුරෙන් ලත් දැනුම භාවිතයට ගැනීමත් නිසාය.

විද්‍යාව නිසා ලොවට දායාද වූ දැනුම මිල කළ නොහැකි තරම්ය. අතීතයේ පෝලියෝ වසංගතය කුඩා ළමුන් අංගභාග තත්ත්වයට පත් කර ඇත. නමුත් සෞඛ්‍ය විද්‍යා දියුණුවත් සමඟ පෝලියෝ රෝගය ලොවෙන් තුරන් කිරීමට හැකි විය. එය පිරිහීමක් නොව ආශිර්වාදයකි. තමා ලැබූ දැනුම හොර රහසේ භුක්ති විඳි මායා බන්ධකයන් සිටි යුගයකට වඩා තාක්ෂණ දැනුමෙන් ලොව ඇති තතු නිසි දැනගත් සිසු සිසුවියන් රැසක් ලොව පුරා වාසය කිරීම භාග්‍යකි. එය අධ්‍යාපන විද්‍යාවේ දියුණුවයි.

මේ අනුව කල්පනා කර බලන විට මිනිසා පිරිහෙන්නේ දියුණුව නිසා නොව අවිද්‍යාව නිසාය. මිනිසා තමා හා සමාන මිනිසකුට වද හිංසා කිරීම කරනුයේ විද්‍යාත්මකව නොසිතා වනචාරීව කල්පනා කිරීම නිසාය. තම මවුපියන් අමතක කර දමා තමා ද වල්මත් වී සමාජයට පිළිලයක් වන්නේ මෝහය හෙවත් අවිද්‍යාව නිසාය. මේ අනුව විද්‍යාව දියුණු වූවාට ජීවිතයට ළඟා නොකරගන්නා තාක්කල් පුද්ගලයා පිරිහෙන බව නම් සත්‍යයකි.

**නෙහාරා සිරිසේන**



## පින්ලන්තෙ හොඳම නෙවෙයි...



# ලංකාවේ අවුල්

අධ්‍යාපනය වූ කලී සියලු දෙනාටම පොදුවේ ලැබෙන දෙයකි. ඒ අතරින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව තුළ දක්නට ලැබෙන දෙයක් වන්නේ නිදහස් අධ්‍යාපනය යි. එනම් මුදල් ගෙවීමකින් තොරව අපට ඉගෙන ගැනීමට අවකාශ සැලසීමයි. ලංකාවේ දරුවකු අවුරුදු හතරේ සිට අධ්‍යාපන සඳහා යොමු කරයි.

පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරන දරුවකු එතැන් පටන් නොකඩවා අවුරුදු දහතුනක් අධ්‍යාපනය හැදෑරීමට පටන් ගනියි. පින්ලන්තය ලොව සාක්ෂරතාව අතින් ඉහළින් ම තැනක සිටිනා රටකි. එම රට තුළ දරුවන්ගේ අධ්‍යාපන ක්‍රමය ඉතා ම වෙනස් ය. ඔවුන් පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරන්නේ වයස අවුරුදු හතේදී ය. කුඩා කාලයේ ඔවුන්ගේ ළමා කාලය විඳීමට ඉඩ දෙන අතර තරග විභාගවලින් ඔබ්බට ගිය විෂය ක්‍රමයක් එරට තුළ දක්නට ලැබේ. මානසික පීඩනයකින් තොරව දරුවාට අධ්‍යාපන කටයුතු කරගෙන යා හැකිය. ඔවුන්ට ජාතික මට්ටමේ විභාගයක් ලෙස පවත්වන්නේ උසස් පෙළ සිසුන් සඳහා වන අවසාන විභාගය පමණකි. තමන්ට කැමති විෂය පථයක් ඔස්සේ ඉගෙනීමේ හැකියාව ඔවුන්ට ලැබී තිබේ.

මේ ක්‍රමය හා සාපේක්ෂව බලන කල ලංකාවේ දරුවන් කුඩා කාලයේ සිටම අධ්‍යාපනයට යොමු කරයි. ඒ අතරතුර ශිෂ්‍යත්වය, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ආදියට මුහුණ දීමට සිදු වෙයි. විශාල පීඩනයකින් යුක්තව දරුවන් අධ්‍යාපනයේ නිරත වන ආකාරයක් දක්නට ලැබේ. අවුරුදු 10 ක දරුවා යනු තවමත් සෙල්ලම් වයසේ පසුවන්නෙකි. නමුත් අද වන විට අප විදි ළමා ලෝකයේ ඔවුනට ඉඩක් නැත. එයට හේතුව වන්නේ ඔවුන් ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දීමයි. විභාගය සමත් කරවීමට මවුපියෝ අපමණ වෙහෙසක් දරති. එබැවින් මෙය මවුපියන්ගේ විභාගය ලෙස ද හඳුන්වයි. ලංකාව තුළ මෙවැනි විභාග ක්‍රමයක් පැවැත්වීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? බොහෝ දෙනාගේ බලාපොරොත්තුව හොඳ පාසලක් තෝරා ගැනීමයි. ඉහළ පිළිගැනීමක් ඇති පාසලකට තමන්ගෙ දරුවා යොමු කිරීමයි. නමුත් දරුවාට සිදු වන මානසික පීඩනය ගැන ඔවුන් නොසිතයි. දරුවාගේ ළමා කාලය විභාගයක් වෙනුවෙන්ම කැප කරයි.

දකුණු ආසියාවේ ඉහළම සාක්ෂරතාවක් ඇති රට ලෙස හංවඩු ගැසෙන ශ්‍රී ලංකාව තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා ලක්ෂ තුනකට අධික සිසුන් ප්‍රමාණයක් මුහුණ දෙයි. එයින් සමත් වන්නේ සුළු පිරිසකි. විභාගයෙන් පසු හැළෙන සිසුන් ගැන කවුරුත් කතා නොකරති. ගණිතය විෂය නැතිව උසස් පෙළ හැදෑරීමට නොහැකිව සිටින විශාල ප්‍රමාණයක් සිටී. ඒ අතර චිත්‍රවලට දක්ෂ නැටුම් සංගීතය නව නිපැයුම් ආදිය සඳහා දක්ෂ පිරිස් කොතරම් සිටීද? විෂයක් නිසා ඔවුන්ගේ මුළු අනාගතයම අඳුරු වෙයි. එලෙසම පොතේ දැනුම නැති වුවත් විවිධ නිපැයුම්, නව අදහස් ඇති වූවෝ වෙති. එවැනි දරුවන් ප්‍රායෝගික මට්ටමින් ඉහළට ගෙන යෑමට වෘත්තීය අධ්‍යාපනයක් දිය යුතුයි. රටට වැඩදායී පුද්ගලයන් ලෙස ඔවුන්ගෙන් ගත හැකි උපකාරයන් අතිමහත්ය. එබැවින් එවැනි දරුවන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ඔවුන් වෙනුවෙන් ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රමයක් සකස් කළ යුතුය.

සාමාන්‍ය පෙළ සමත් වෙලා උසස් පෙළට මුහුණ දෙන සිසුන් ප්‍රමාණය ලක්ෂ තුනකට අධිකයි. නමුත් එයින් වසරකට විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබන්නේ හතළිස් පන්දහසක් වැනි ඉතාම සුළු පිරිසකි. නමුත් එතැනින් හැළෙන පිරිස් ගැන අවධානය යොමු වීමක් දක්නට නොලැබෙයි. දශම ගණනකින් විශ්වවිද්‍යාලය අහිමි වන සිසුන් බොහොමයකි. යම් පිරිස් විදේශගතව හෝ පෞද්ගලික විශ්වවිද්‍යාල වෙත යොමු වේ. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ලංකාවේ සියලු දෙනාටම එක හා සමාන වත්කමක් නැති බැවින් එලෙස පෞද්ගලිකව අධ්‍යාපනය හැදෑරීමට ඇති අවස්ථා ද ගිලිහෙයි. එවැනි පිරිස කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ට වෘත්තීයම කුසලතාව දිය යුතුය. ස්වයං රැකියාවක් වෙත යොමු කිරීමට ප්‍රතිපාදන වෙන් කොට ඔවුන් දිරිමත් කිරීමක් කළ හැකිය.

විශ්වවිද්‍යාලයට පැමිණීම යනු සියල්ල ලබා ගැනීම හා සමාන නොවේ. විශ්වවිද්‍යාල තුළ අවුරුදු තුනක් හතරක් අධ්‍යාපනය ලබා ඉන් එළියට ගිය පසු රැකියා දියව් කියා බෝඩ් ඔසවාගෙන සිටිය යුතුද? අද වන විට උපාධියක් යනු එක් සුදුසුකමක් පමණි. එය තිබූ පමණට රැකියා ලබා ගත නොහැකිය. එසේ නම් කළ යුත්තේ වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමයි. උපාධියත් සමඟම රැකියාවකට ගැළපෙන ආකාරයට වෘත්තීය සුදුසුකම් එක්කර ගැනීම තුළින් රැකියා දියව් කියා බෝඩ් අල්ලා සිටීමේ අවශ්‍යතාවක් ඇති නොවෙයි.

නමුත් ලංකාව තුළ පවතින්නා වූ මේ ඒකාකාරී අධ්‍යාපන රටාව යම් වෙනස්කම්වලට භාජන කළ යුතුය. මන්ද යත් කටපාඩම් කර විභාගවලට ලිවීම යන ක්‍රමය තුළින් බිහි වන්නේ පොත්ගුල්ලන් පිරිසකි. ඊට පරිබාහිරව සිසුන්ට අනාගත තාක්ෂණය සමඟ ගැටෙන ආකාරයට නව විෂය මාලා ක්‍රම, ප්‍රායෝගික අධ්‍යාපනික ක්‍රම රට ඇති කළා නම් ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් යන ලේබලයෙන් ද ගැලවීමට ඇති ඉඩකඩ වැඩිය.

**සචින්ද්‍යා මධුෂාණි කැකුලාවල**
ජන සන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

## අපේ රටටත් ශක්තිමත් තාරුණ්‍යයක්



තාරුණ්‍යය ගැන අද කතාබහ ඇත්තේ විවේචනයන්ට බරවය. තාරුණ්‍යය සෑම පුද්ගලයාටම පාහේ ජීවිතයට අලුත් පිටුවක් පෙරළන යුගයකි. අභියෝග රැසකට මුහුණ දීමට සිදු වන අවධියක්. කඩඉම් විභාග, ප්‍රථම ආදරය, ප්‍රථම රැකියාව වගේ ජීවිතේ හරි හරියට පටන්ගන්න දණ ගාන්නෙ මේ කාලේ. ඉතින් මේ හැමදේම අස්සේ ජයග්‍රහණ වගේම පරාජයනුත් සෙවණැල්ලක් වගේ පස්සෙන්ම ඉන්න කාලයක් තමයි මේ තාරුණ්‍ය.

තරුණ විසේ අස්සෙ අවිවේකය, අනාගතය පිළිබඳ ඇති දෙගිඩියාව, විවිධ පාර්ශ්ව වෙතිල් එල්ල වන පීඩනය නිසා මානසික රෝගයන් බෝවන රෝගයන් බවට පත්ව ඇත. මෙවැනි අභියෝග නිසා ශාරීරිකව, මානසික සෞඛ්‍ය පිළිබඳව සොයා නොබලා කටයුතු කරන තත්ත්වයකදී ඔබට, ඔබ මහා සාගරය මැද අතරමං වී පෙනෙනතෙක් මානයක උදවු ඉල්ලීමට පුද්ගලයකු හෝ නැවක් නොපෙනෙන අයකු ලෙස හැඟෙනු ඇත. මෙවැනි තත්ත්වයන් කාංසාව ලෙස මනෝවිද්‍යාවේදී හඳුන්වයි.

ඉක්මනින් විඩාවට පත් වීම, මානසික ඒකාග්‍රතාව නොමැති වීම, කලබලකාරී හැසිරීම් රටාව යනාදිය මෙහි රෝග ලක්ෂණ වේ. මෙය සැණෙකින් හට ගන්නා මානසික තත්ත්වයක් නොවේ. දීර්ඝ කාලයක් සිට පවතින මානසික දුර්වලතාවයක ප්‍රතිඵලයකි.

තරුණ බව තුළ ශාරීරික ශක්තිය මැනවින් පිහිටා තිබුණ ද කාංසා තත්ත්වය ප්‍රතිශක්තිකරණයට පවා අභියෝග එල්ල කරනු ලබයි. වර්තමානයේ පවතින කොවිඩ්19 වැනි සමාජ ගැටලු අවස්ථාවලදී ඒවා වැඩි වශයෙන් බලපානු ලබන්නේ තාරුණ්‍යයටයි. ඉදිරි අනාගතය පිළිබද අනියත බියකින් කලයක් තිස්සේ සිටීමට සිදු වීම නිසා ඉච්ඡාභංගත්වයට පත් වන්නන් කටුක මානසික තත්ත්වයකට මුහුණ දේ.

මෙසේ කාංසාව බලපෑම් ඇති කරනවා සේම අපට යම් කටයුත්තක් වඩාත් හොඳින් කිරීමට සෘජුව උනන්දු කරවන සාධකයක් වන අවස්ථාද ඇති විය හැකිය. තම අනාගතය පිළිබඳව ඇති විය හැකි බිය සම්බන්ධයෙන් සිතමින් සිටින විට එයට හොඳින් මුහුණ දීමට පෙර සූදානම් වීම මීට කදිම නිදසුනකි.

අප සමහර විටෙක ඉවතලන දෑ තවත් වේලාවක බෙහෙතට අවශ්‍ය වන බව සිංහල ජනප්‍රවාදයේ පැවත එන ඔවදනකි. එසේ කාංසාවද ඔබට ඔබගේ ජයග්‍රහණයේ මූලික සලකුණ වන අවස්ථා ඔබට අත්විඳීමට හැකිවීම ඉතා සුලබ කරුණක් වනු ඇත.

කාංසාව ඔබ රෝගියකු හෝ නරක පුද්ගලයකු ලෙස සලකණු ලැබීමට තුඩු දෙන කරුණක් නොවේ. එය ඔබට ඔබගේ මනස හරි මඟට ගැනීමට ලැබෙන අනතුරු ඇඟවීමකි. දැනට රටේ තිබෙන තත්ත්වය සෑම පුද්ගලයකුටම මෙම අවස්ථාවේදී සමානව අත්විඳීමට සිදු වන ගැටලුවකි. එය අප තේරුම් ගත යුතුය. මෙම මානසික තත්ත්වය තමා තුළින්ම පහසුවෙන්ම කෙටි කාලයක් තුළ නිරාකරණය කර ගත හැකිය. නමුත් එය පාලනය කර ගත නොහැකි බව වැටහුන හොත් මෙම මානසික තත්ත්වය පිළිබඳව තම පවුලේ අය, සමීපතම යහළුවකු හෝ මනෝ උපදේශකයකුගෙන් උපදෙස් පැතීම යෝග්‍ය වේ.

කෙසේ වෙතත් කොවිඩ්19 පමණක් නොව ජීවිතයට මොනයම් ආකාරයේ වුව අභියෝගයකට, ගැටලුවකට මුහුණ දීමට තරම් අප රටේ තාරුණ්‍ය ශක්තිමත් ය. එබැවින් මේ ගෙවෙන කාලය තුළ කාංසාවට පරාජය නොවී බලාපොරොත්තු ඉටු කර ගන්න පියවරක් ඉදිරියට තබමු.

**ටී. එන්. නිලක්ෂි**

බී. එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# මත්ද්‍රව්‍ය පානය කරමින් නිරෝධායන නීති කැඩූ තරුණයෝ 4ක් කැරම් ගසද්දී අත්අඩංගුවට

අන්තරායකර මත්ද්‍රව්‍ය වර්ග කිහිපයක් පානය කර, සන්තකයේ තබාගෙන නිරෝධායන නීති උල්ලංඝනය කරමින් කැරම් ගසමින් සිටි තරුණයන් සිව්දෙනකු අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. අනුරාධපුර නගරයේ නිවෙසක තරුණයන් පිරිසක් හෙරොයින්, අයිස්, මත්කුඩු හා කේරළ ගංජා පානය කර නිරෝධායන නීති උල්ලංඝනය කරමින් කැරම් ගසමින් සිටිනා බවට පොලිස් කණ්ඩායමට ලැබුණු තොරතුරකට අනුව පොලිස් කණ්ඩායම එහි ගොස් වැටලීම සිදු කර තිබූ අතර සැකකරුවන් පස් දෙනකු පොලිස් අත්අඩංගුවට ගෙන තිබිණි. ප්‍රධාන සැකකරු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් දෙකයි මිලිග්‍රෑම් 150ක්, තවත් සැකකරුවන් දෙදෙනකු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 450ක් හා කේරළ ගංජා ග්‍රෑම් දහයක් සන්තකයේ තබාගෙන සිටි අයකු ඇතුළු සිව්දෙනකු අත්අඩංගුවට ගත් බව පොලිසිය ප්‍රකාශ කළේය. ඔවුන් අතර ව්‍යාපාරිකයෙක්, රාජ්‍ය සේවකයෙක්, පෞද්ගලික අංශයේ සේවකයෙක් සහ අනුරාධපුර මහාධිකරණ බල ප්‍රදේශයේ පිහිටි අධිකරණයක සේවයේ නියුතු සේවිකාවකගේ සහෝදරයෙක්ද සිටිනා බව පොලිසිය ප්‍රකාශ කළේය. අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරු කලක සිට අනුරාධපුර ප්‍රදේශයේ හෙරොයින් බෙදාහැර තිබෙනා බවත් ඔහු සමඟ සිටි සෙසු පිරිසක් ඊට ආධාර අනුබල දෙමින් අලෙවි කිරීම් හා මත්ද්‍රව්‍ය පානය කිරීම සිදු කර තිබෙනා බවත් පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. වැටලීම සිදු කළ අවස්ථාවේ සැකකරුවන් පස්දෙනකු අත්අඩංගුවට පත්වූවත් එම ස්ථානයේ සිටි රාජ්‍ය සේවකයා සන්තකයේ කිසිදු මත්ද්‍රව්‍යක් නොතිබීම හේතුවෙන් ඔහු මුදාහැර ඇත. පවතින කොවිඩ් අවදානම හමුවේ ජනතාවට එක්රැස්වීම් සිදු නොකරනා ලෙස රජය හා සෞඛ්‍ය අංශ දිගින් දිගටම උපදෙස් ලබාදුන්නත් සැකකරුවන් පස්දෙනා නිරෝධායන නීති උල්ලංඝනය කරමින් මත්කුඩු පානය කර කැරම් ක්‍රීඩාවේ නිරත වූ බව පොලිසිය ප්‍රකාශ කළේය. සැකකරුවන් වයස අවුරුදු 23ත් - 30ත් අතර පසුවන්නන් වන අතර ඔවුන් මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීමේ චෝදනාවට අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බණ්ඩාර විජේකෝන්, පොලිස් පරීක්ෂක රත්නායක, පොලිස් සැරයන්වරුන් වන නිෂාම් (61406), රාජරත්න (66934) හා ඉලංගසිංහ (68497) යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

බී. ඩබ්ලිව්. ඩී. ධර්මකීර්ති - තලාව සමූහ

# හෙරොයින් විකුණමින් හොරකමත් ජයටම කරලා

හෙරොයින් ජාවාරමේ හා සොරකම්වල නිරත වූ අයකු සැකපිට අත්අඩංගුවට ගැනීමට එප්පාවල පොලිසිය සමත් වී තිබේ. මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ කටියාව යාය 9, එප්පාවල ප්‍රදේශයේ පදිංචි 30 හැවිරිදි වියේ පසුවන යුද හමුදාවේ කලක් සේවය කර ඉන් ඉවත් වූ අයෙකි. විවිධ වර්ගයේ සොරකම් හා හෙරොයින් ජාවාරම් සම්බන්ධයෙන් තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ ඔහුට විරුද්ධව පවරා ඇති නඩුවලට මොහු සහභාගී නොවීම හේතුවෙන් අධිකරණය මගින් දැනට මාස දෙකකට පෙර වරෙන්තු තුනක් නිකුත් කර තිබූ බව පොලිසිය සඳහන් කළේය. වරෙන්තු නිකුත් කිරීමෙන් අනතුරුව ද හෙරෝයින් ජාවාරමේ හා සොරකම් සිදු කර ඇති බවත් ඔහු එප්පාවල අවට ගම්වාසීන්ට මහත් හිරිහැරයක් සිදු කරමින් සිටි අයෙක් බවත් පොලිසිය ප්‍රකාශ කළේය.

හෙරොයින් පානය කරමින් සෙල්ෆි ඡායාරූප ගනිමින් ප්‍රදේශයේ සැරිසරන බවට පොලිසියට ලද තොරතුරක් මත පොලිසිය මඟින් ඔහු වැටලීමට යද්දී අනියම් බිරිය සමඟ ස්කූටි වර්ගයේ යතුරුපැදියකින් ගල්නෑව දෙසට යමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. හෙරෝයින් ග්‍රෑම් 2යි මිලිග්‍රෑම් 650ක් ඔහු අත්අඩංගුවට පත්වන විට ළඟ තිබී ඇත. සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. එප්පාවල පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. රෝහණ අධිකාරි, පො.ප. එරංග, අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප. ජයම්පති යන මහත්වරු වැටලීමට එක් වූහ.

ජී. එස්. තැලිගම - කිරිඳිවැල සමූහ

## පාළු ගොඩනැඟිල්ලක ගංජා ගහමින් ඉඳලා

පූගොඩ පොලිසිය ඉකුත් දින සවස සිදු කළ විශේෂ මෙහෙයුමකදී මණ්ඩාවල ප්‍රදේශයේ පාළු ගොඩනැඟිල්ලක් අසල ගංජා පානය කරමින් සිටි හතර දෙනකු ගංජා සුරුට්ටු හතරක් ද සමඟින් අත්අඩංගුවට ගෙන ඇත. එම ප්‍රදේශයේම පදිංචි අවුරුදු 25ත් - 30ත් අතර වියේ පසුවන තරුණයන් හතර දෙනකු මෙසේ අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් පූගොඩ අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. පූගොඩ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියන්ත චන්ද්‍රසේකර, උප පොලිස් පරීක්ෂක මංජුල හා ආටිගල යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## ත්‍රී/මලේ හුදෙකලා කළ වසම්වලට ජංගම රථවලින් අත්‍යවශ්‍ය ආහාර



ත්‍රිකුණාමලයේ කොවිඩ් - 19 හේතුවෙන් හුදෙකලා කළ ග්‍රාම නිලධාරි වසම් නවයක් සඳහා ජංගම රථ මඟින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීමට ත්‍රිකුණාමලය මධ්‍යම එළවළු වෙළෙඳපොළේ වෙළෙඳුන් හමු වූ දිසාපති සමන් දර්ශන පාඩිකෝරාල මහතා ඒ සඳහා වෙළෙඳුන්ගෙන් කරුණු විමසීය. පිට පළාත්වලින් එළවළු තොග මධ්‍යම වෙළෙඳපොළට නොඅඩුව ලැබෙන බැවින් ජංගම රථ හරහා හුදෙකලා ප්‍රදේශවලට එළවළු බෙදාහැරීමේ ගැටලුවක් නැති බව වෙළෙඳුන් මෙහිදී දිසාපතිවරයාට පැහැදිලි කර දුන්නේය. විශේෂ අවසර පතක් දෙමින් හුදෙකලා ප්‍රදේශවලට ද්‍රව්‍ය බෙදා හැරීමට පහසුකම් සැලසීමට දිසාපතිවරයා පොරොන්දු විය. සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිත කරමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාහැරීම කෙරෙහිද අවධානය යොමු විය.

පී. පී. ජී. සුගතදාස - තිහගොඩ සමූහ

## මුලටියන සංවර්ධන ව්‍යාපෘති රැසක් කඩිනමින් අවසන් කිරීමට පියවර

මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. එම සංවර්ධන ව්‍යාපෘති යටතේ නගර හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමුඛත්වය දී තිබෙනා බව මුලටියන ප්‍රාදේශීය සභාවේ සභාපති සුනිල් ඇල්ලදෙණිය මහතා පැවසීය. නගර සංවර්ධන ව්‍යාපෘති යටතේ මුලටියන, දෙයින්දර, මාකඳුර හා රදාවෙල ඇතුළු ප්‍රදේශයේ ප්‍රධාන නගර හා උප නගර සංවර්ධනය සඳහා තෝරාගෙන තිබෙනා බව ද මුලටියන ප්‍රාදේශීය සභාවේ සභාපති සුනිල් ඇල්ලදෙණිය මහතා කීය.

නගර සංවර්ධනය යටතේ අත්‍යවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම හා අබලන් තත්ත්වයේ පවතින සියලුම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම, වෙළෙඳපොළ සංවර්ධනය යටතේ අවශ්‍ය ගොඩනැගිලි අලුතින් ඉදි කිරීම හා අලුත්වැඩියාව හා සතිපොළ සංවර්ධනය කිරීම්, මාර්ග පද්ධතිය අලුත්වැඩියාව යටතේ අදාළ සියලුම ප්‍රවේශ මාර්ගවල කාපට් ඇතිරීම, කැටගල් ඇල්ලීම, කොන්ක්‍රීට් කිරීම් හා ගල් අතුරා තාර දැමීම සිදු කෙරේ.

ඊට අමතරව මාර්ග දෙපැති කානු පද්ධති හා බෝක්කු අලුතින් ඉදි කිරීම් හා අලුත්වැඩියා කිරීම් සිදු කරනු ඇත. තවද ග්‍රාමීය ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ව්‍යාපෘති යටතේ දෙයියන්දර ග්‍රාමීය රෝහලේ දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කර සංවර්ධනය කිරීම සහ කැටියපේ, අතපත්තුකන්ද හා බටදොළ ඇතුළු ප්‍රදේශයේ සියලුම ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන අලුත්වැඩියා කර සියලුම සායනික පහසුකම් සහිතව සංවර්ධනය කිරීම මේ සංවර්ධන වැඩසටහන්වලට අයත් වේ.

සංවර්ධන ව්‍යාපෘති රැසක වැඩ දැනටමත් අවසන් කර තිබෙනා අතර, දැනට ඉතිරිව පවතින ව්‍යාපෘති සංවර්ධන වැඩද කඩිනමින් අවසන් කරනා බවත් සභාපතිවරයා කීය. මේ සඳහා රුපියල් කෝටි 10කට වැඩි මුදලක් වැය කෙරේ. මධ්‍යම රජය හා මුලටියන ප්‍රාදේශීය සභාව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයයි.

දිනමිණ දසත දස අත ම එක තැන

ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## පොලතුකන්ද රක්ෂිතයේ මරා දැමූ ගෝනාගේ අංතට්ටුව රොටුඹ නිවෙසක



රොටුඹ පොලතුකන්ද ප්‍රදේශයේ නිවෙසක සඟවා තිබී මරා දමන ලද ගෝනකුගේ අං තට්ටුවක් සොයාගත් බව රොටුඹ පොලිසිය ප්‍රකාශ කළේය. රොටුඹ ඌරුව පොලතුකන්ද ප්‍රදේශයේ නිවෙසක සඟවා තිබියදී මේ ගෝන අංතට්ටුව සොයාගෙන ඇති අතර ගෝන අංතට්ටුවේ දිග අඟල් 23ක් සහ වට අඟල් 5ක් බවට පොලිසිය ප්‍රකාශ කළේය. ගෝන අංතට්ටුව තිබූ නිවෙසේ හිමිකරු පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහුගෙන් කරන ලද ප්‍රශ්න කිරීම්වලදී අනාවරණය වී ඇත්තේ මීට මාසයකට පමණ පෙර පොලතුකන්ද රක්ෂිතයේ සිටි ගෝනකු පිරිසක් විසින් මරා මස් පිණිස විකුණා ඇති බවත් මෙය එම සතාගේ අංතට්ටුව බවටයි. අත්අඩංගුවට ගත් සැකකරු රොටුඹ ඌරුව ප්‍රදේශයේ පදිංචි 38 හැවිරිදි පුද්ගලයෙකි. සැකකරු මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බවත් සිද්ධිය සම්බන්ධයෙන් රොටුඹ පොලිසිය වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

රොටුඹ පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. බන්දුල ප්‍රියන්ත මහතාගේ උපදෙස් අනුව අපරාධ හා දූෂණ වැටලීම් අංශයේ ස්ථානාධිපති උ.පො.ප. කේ. ආර්. ජී. කේ. මුණසිංහ මහතා සමඟ පො.සැ. (25048) සුසිරිපාල, පො.කො. (68290) නිශාන්ත, පො.කො.රි. (16273) වීරසූරිය යන නිලධාරීහු වැටලීමට එක් වූහ.

ඩී. එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## වැල්ලවාය මූලික රෝහලට ප්ලාස්ටික් පුටු



වැල්ලවාය මූලික රෝහලට ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණෙන රෝගීන්ට අසුන් ගැනීම සඳහා ප්‍රමාණවත් පුටු නැති වීමෙන් රෝගීන් දැඩි දුෂ්කරතාවකට පත්වන අයුරු දැක පරිත්‍යාගශීලීන් පිරිසක් ප්ලාස්ටික් පුටු 100ක් පරිත්‍යාග කරන තිබේ. එම පුටු තොගය දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමති විජිත බේරුගොඩ මහතා විසින් වැල්ලවාය මූලික රෝහලේ වෛද්‍ය අධිකාරීවරයාට පිරිනැමූ ලැබූ අයුරුයි මේ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## මැදගම පවුල් තුනකට කිරි ගවයන්



මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යකුන්නාව ග්‍රාමයේ පදිංචි පවුල් තුනකට ස්වයං රැකියා අවස්ථා සලසා දීමේ අරමුණෙන් කිරි ගවයන් තිදෙනකු පරිත්‍යාග කිරීම පසුගියදා සිදු කෙරිණි. මැදගම ප්‍රාදේශීය ලේකම් කපිල බණ්ඩාර මහතාගේ මඟපෙන්වීම මත පරිත්‍යාගශීලීන් මේ එළගවයන් පරිත්‍යාග කර තිබූ අතර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කිරි ගවයන් තිදෙනා අදාළ පවුල්වලට භාර දෙන ලදි.

ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## බලපත්‍ර නැතිව පෝය දවසේ මත්පැන් විකුණා දඩ

බලපත්‍රයක් නැතිව මත්පැන් විකුණු පුද්ගලයකු රොටුඹ පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන පසුගියදා (30) මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වරදකරු බවට පිළිගත් නිසා සැකකරුට මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු අජිත් ලියනගේ මහතා විසින් රුපියල් හයදහසක දඩ මුදලක් ගෙවනා ලෙසට නියෝග කරන ලදි. මෙසේ දඩ මුදල් ගෙවීමට නියම වූයේ රොටුඹ ජනපදය ප්‍රදේශයේ පදිංචි ජාසිංගේ ජයන්ත කුමාර නමැත්තකුටය. පැමිණිල්ල වෙනුවෙන් රොටුඹ පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. බන්දුල ප්‍රියන්ත මහතාගේ උපදෙස් අනුව පො.කො. (76782) ප්‍රියංකර මහතා අධිකරණයට කරුණු දැක්වීය. පසුගියදා (26) සුරාසල් වසා දමා තිබෙනා අවස්ථාවේ රොටුඹ ජනපදය ප්‍රදේශයේ පුද්ගලයකු සීල් අරක්කු විකුණන බවට තොරතුරක් ලැබුණු බවත් ඒ අනුව පොලිස් උපායදූතයකු යොදා අරක්කු මිලිලීටර 180ක ප්‍රමාණයක් රුපියල් පන්සීයක මුදලකට මිල දී ගත් බවත් ඒ අනුව සැකකරුගේ නිවෙසේ නිදන ඇඳ යට තිබී තවත් අරක්කු මිලිලීටර 180ක් සොයා ගත් බවත් පොලිස් කොස්තාපල්වරයා අධිකරණයට කරුණු දක්වමින් කියා සිටියේය.

රොහාන් සී. ප්‍රේමතිලක - හෙම්මාතගම සමූහ

## සිල් මාතාවකගෙන් ගමේ පන්සලට සනීපාරක්ෂක පහසුකම්



ඇස් දෙකම නොපෙනෙන බලත්ගමුවේ සීතා අම්මා විසින් ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ප්‍රයෝජනය සඳහා වැසිකිළියක් සාදා පසුගියදා පරිත්‍යාග කරන ලදි. බලත්ගමුව ප්‍රදේශයේ ඇස් දෙකම නොපෙනෙන සිල් මාතාවක් වන කාගේත් ජනාදරයට පත්ව සිටිනා සීතා අම්මා බලත්ගමුව ශ්‍රී සුදර්ශනාරාමයේ පෝය දිනයන්හි සිල් සමාදන් වන උපාසක උපාසිකාවන්ගේ ප්‍රයෝජනය සඳහා සිය දායකත්වයෙන් අංගසම්පූර්ණ මේ සනීපාරක්ෂක පද්ධතිය පරිත්‍යාග කර තිබේ.

කේ. ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

## බඩගින්නට කාඩ්බෝඩ් ගිලින කල්පිටියේ බූරුවෝ




කල්පිටිය අර්ධද්වීපයට ආවේණික වූ සත්ත්ව කොට්ඨාසයක් වන බූරුවන්ට අතීතයේ හිමිව තිබුණේ සුවිශේෂී ප්‍රමුඛස්ථානයකි. ඔවුන් උපයෝගී කර ගනිමින් එවකට ලුණු තවලම් ගෙන යෑම සේම පොල් වතුවල කුරුම්ණියන් පලවා හැරීමට එම සතුන්ගෙන් මනා දායකත්වයක් ලැබිණි. පසුකාලීනව කල්පිටිය ජනාකීර්ණ වීමත් සමඟ ඔවුන්ට අවශ්‍ය ආහාර වන ස්වාභාවික තෘණ භූමි සතු ඉඩම් මිනිසුන් විසින් අත්පත් කර ගැනීමත් අනවසර ලුණු ලේවා සේම ඉස්සන් වගා පොකුණු ඉවක් බවක් නැතිව ඉදි කිරීම හේතුවෙන් බූරුවන් උග්‍ර ආහාර හිඟයකට මුහුණ පා සිටී.

ඒ අනුව අද වන විට බූරුවන් කාඩ්බෝඩ්, කඩදාසි, පොලිතීන් ආදිය ආහාරයට ගැනීම හේතුවෙන් මේ වන විට ශීඝ්‍රයෙන් මරණයට පත්වීමේ දැඩි අවදානමකට ලක්ව ඇත. තවද ඔවුන් සංරක්ෂණය කළ යුතුව තිබියදී ඔවුන්ව අයාලේ හැර තිබීම හේතුවෙන් දිනෙන් දින රිය අනතුරුවලට ලක්ව මිය යෑමේ ප්‍රවණතාවක්ද දක්නට ලැබේ. නුදුරේදී මෙලෙස බූරුවන්ට සිදු වන අකටයුතුකම් හේතුවෙන් කල්පිටිය අර්ධද්වීපයෙන් බූරුවන් වඳ වී යෑමේ තර්ජනයකට ලක්ව තිබේ.

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

# ඌව පළාත් ධාවන කළමනාකරු මුදල් හා ලිංගික අල්ලසක් ගනිද්දී අත්අඩංගුවට

ඌව පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ඌව පළාත් ධාවන කළමනාකරු රුපියල් 50,000ක අල්ලස් මුදලක් පෙරේදා (03) දින සවස තම කාර්යාලයේදීම කාන්තාවකගෙන් ලබා ගනිමින් සිටියදී අත්අඩංගුවට ගත් බව වැටලීම සිදු කළ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරියකු පැවසීය.

ඌව පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ඌව පළාත් ධාවන කළමනාකරු වන නුවරඑළිය ප්‍රදේශයේ පදිංචි ප්‍රදීප් රණතුංග යන අය මුදල් ලබාගන්නා අවස්ථාවේදී අත්අඩංගුවට ගෙන තිබේ. පාසල් ළමුන් ප්‍රවාහනය කරන සිසුසැරිය බස් රථයක් සඳහා මාර්ග ධාවන බලපත්‍රයක් ලබාදීම හා ඉදිරි කටයුතු කිරීම සඳහා වැලිමඩ පදිංචි තරුණියකගෙන් රුපියල් 50,000ක අල්ලස් මුදලක් ලබා ගැනීම හා එම තරුණිය සමඟ පෙරේදා (03) දින සවස ලිංගික අල්ලසක් ලබා ගැනීමටත් සැකකරු කටයුතු කර තිබෙනා බව කොමිෂන් සභාවේ නිලධාරියකු පැවසීය. කොමිෂන් සභාවට දීර්ඝ කාලයක් තිස්සේ සැකකරු අල්ලස් ලබා ගන්නා බවට ලැබුණු පැමිණිලි මත කිහිපවරක්ම සැකකරු අත්අඩංගුවට ගැනීමට නිලධාරීන් කටයුතු කර තිබෙනා බවත් දින කිහිපයක් තිස්සේ සිදු කළ වැටලීමකින් පසු සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරු අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඉදිරි විමර්ශන සිදු කිරීමට කටයුතු කර තිබේ.

නාඋල සමූහ

## නාඋල කොවිඩ් රෝගීන් රෝහල් නැතිව නිවෙස්වල

දිනෙන් දින නාඋල පොලිස් බල ප්‍රදේශයෙන් වාර්තා වන කෝවිඩ් රෝගීන්ට ලබාදෙන රෝහල් පහසුකම් නොමැතිකමින් මේ වන විට නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝවිඩ් වයිරසය ආසාධනය වූ පුද්ගලයෝ දොලොස් දෙනෙකුට වැඩි පිරිසක් නිවෙස්වල රඳවා ඇතැයි සෞඛ්‍ය අංශ කියයි. කෝවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස මාතලේ දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යනු ලබන දඹුල්ල සහ ලග්ගල රෝහල් කොරෝනා රෝගීන්ගෙන පිරී යෑම මේ සඳහා බලපා ඇතැයි සෞඛ්‍ය අංශ කියයි. පවත්නා තත්ත්වය හමුවේ රෝගීන් රැඳී සිටින නිවෙස්වල සෙසු පිරිස්වලින් වැඩි පිරිසකට කෝවිඩ් වයිරසය ආසාධන වී ඇති බව ද එම පවුල්වල පිරිස් කියා සිටිති. මේ සම්බන්ධයෙන් නාඋල ප්‍රාදේශීය සභා සභාපති සනත් දසනායක මහතාගෙන් කළ විමසීමක දී හෙතෙම පසුගියදා (02) කියා සිටියේ කඩිනමින් රෝගීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සිදුකරන බවයි. වැඩිවන කෝවිඩ් රෝගීන් වෙනුවෙන් අඹන රෝහල සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව ද හෙතෙම කියා සිටියේය. නාඋල පොලිස් බල ප්‍රදේශයෙන් පසුගිය 01 වෙනිදා වන විට කෝවිඩ් ආසාධිතයන් 158 දෙනෙකු වාර්තා වී තිබේ.

එස්. ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

## පූසා ගෙනාපු හක්කපටස් එක පුපුරා නව හැවිරිදි දරුවෙක් තුවාල ලබලා

කටුගස්තොට පොලිස් වසමේ එඬරුතැන්න ප්‍රදේශයේදී නව හැවිරිදි දරුවකු හක්කපටස් එකක් පුපුරා යෑමෙන් තුවාල ලබා ඇති බව කටුගස්තොට පොලිසිය ප්‍රකාශ කළේය. වනසතුන් දඩයම් කිරීම පිණිස ගෙවත්ක සඟවා තබා ඇති හක්කපටස් එකක් පූසකු විසින් රැගෙනවිත් නිවෙසක් අසල මාර්ගයේ දමා ගොස් තිබියදී එය බෝලයක් යැයි සිතා නිවෙසට ගෙනවිත් ගලකින් තැලීමට යෑමේදී පුපුරා යෑම නිසා මෙසේ දරුවාට තුවාල සිදුව තිබේ. කටුගස්තොට පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ උප පොලිස් පරීක්ෂක මහින්ද මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් හක්කපටස් එක පුපුරා ගිය තැනට ගොස් පරීක්ෂා කිරීමේදී එම හක්ක පටස් එකේ කරවල කැබැල්ලක් ගැට ගසා තිබී ඇති බවත් එහි සුවඳ නිසා පූසා එය නිවෙස අසල මාර්ගයට ගෙනවිත් දමා ඇති බවත් තහවුරු කරගෙන ඇත. හක්කපටස් එක තැබූ පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ ආරම්භ කර තිබේ.



දිනමිණ දුසත දස අත ම එක තැන

සුනිල් ප්‍රනාන්දුපුල්ලේ - වෙන්නප්පුව විශේෂ

## පත්‍රවිචිත්‍ර රෝගයෙන් ගස්ලබු වගාකරුවෝ අනතුරේ

වෙන්නප්පුව හා දංකොටුව යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල වෙසෙන ජනතාවගෙන් වැඩිදෙනා ගස්ලබු වගා කිරීමෙන් හොඳ ආදායමක් ලබාගත් නමුත් පත්‍රවිචිත්‍ර නමැති වයිරස් රෝගය හේතුවෙන් හා ඒ සඳහා ස්ථිර ප්‍රතිකර්මයක් මෙතෙක් සොයාගෙන නොමැතිකමින් ඔවුන් එම කටයුතුවලින් ඈත්වී අසරණ තත්ත්වයට පත්ව තිබේ. මිනිස් සිරුරට පෝෂ්‍යදායි හා ආහාර දිරවීමට බෙහෙවින් හේතුකාරකවන පලතුරු විශේෂයක් ලෙස වෛද්‍යවරු හඳුන්වාදෙන පැපොල් වගාව මහා පරිමාණයෙන් කරන වගාකරුවෝ මේ රෝග පීඩා නිසා කිසිත් කරකියාගත නොහැකිව ඇත්තේ ඔවුන් බොහෝවිට එම වගාවන් සඳහා යොමුවී ඇත්තේ බැංකුවලට ණයවීය.

මේ පත්‍රවිචිත්‍ර නමැති අතිභයානක රෝග ලක්ෂණ පහළවූ විට පත්‍ර සියල්ල ඇඹරී පත්‍ර හා ගෙඩි කුඩාවී අස්වනු අඩුවන අතර දින කිහිපයකින් මෙම රෝගය ප්‍රදේශය පුරාම ව්‍යාප්තවී මුළු වගාවම විනාශවී යන අතර ඒ සඳහා ස්ථිර ප්‍රතිකර්මයක් මෙතෙක් සොයාගෙන නොමැති හෙයින් කළ හැකි එකම ප්‍රතිකර්මය නම් එම ගස් කපා පුලුස්සා විනාශ කර දැමීම බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීහු පෙන්වා දෙති.


ඩබ්. ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ

## සිවිල් ආරක්ෂක භටයා සිහිසුන්ව බිම ඇදවැටී මරුට

පොළොන්නරුව, අරලගංවිල, කන්දේගම පිහිටි සිවිල් ආරක්ෂක බළකා අනුකණ්ඩයට අනුයුක්තව රාජකාරි කරමින් සිටි සිවිල් ආරක්ෂක භටයකු ඉකුත්දා (02) හිටිහැටියේම සිහි සුන්ව බිම ඇද වැටී මියගොස් ඇතැයි අරලගංවිල පොලීසිය කියයි. එම සිද්ධියෙන් මියගොස් ඇත්තේ අංක 43, අරලගංවිල, දම්මින්න, ලිපිනයේ පදිංචි ආර්.බී. රූපසිංහ යන විවාහක සිවිල් ආරක්ෂක භටයෙකි. සිවිල් ආරක්ෂක බළකායේ අනු කණ්ඩයේ කාර්යාලය අසළ රාජකාරි කරමින් සිටියදී ඔහු මෙසේ මියගොස් ඇත. මෙම සෙබළා පසුගිය කාලයේ කොළඹ මීතොටමුල්ල ප්‍රදේශයේ රාජකාරි සඳහා ගොස් සිටියදී කොවිඩ් ආසාදනය වී සුවය ලබා පැමිණි අයෙකු බවට සෞඛ්‍ය අංශ පවසයි. කෙසේ නමුත් ඔහුගේ මෘත දේහය මේ වන විට අරලගංවිල රෝහලේ මෘත ශරීරාගාරය තිබෙන අතර වැඩිදුර පරීක්ෂණ පැවැත්වන බව සෞඛ්‍ය අංශ සඳහන් කළේය.

ලංකින්ද්‍ර නානායක්කාර - ඉමදුව සමූහ

## සන්ඩේ ඔබ්සවර් - මොබිටෙල් පාසල් ක්‍රිකට් සම්මාන 3ක් නවෝද්ට



සන්ඩේ ඔබ්සවර් - මොබිටෙල් පාසල් ක්‍රිකට් සම්මාන උලෙළේදී අවුරුදු 19 පහළ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා ඇතුළු සම්මාන ත්‍රිත්වයකින් පුද ලද ගාල්ල මහින්ද විද්‍යාලයේ නවෝද් පරණවිතාන සිසුවාට උපහාර පිදීමේ උත්සවයක් පසුගියදා ගාල්ල මහින්ද විද්‍යාලයීය ඕලකට් ශාලාවේදී පැවැත්විණි. අවුරුදු 19න් පහළ පාසල් ක්‍රිකට් තරගාවලියේදී ඉනිමකදී වැඩිම ලකුණු ප්‍රමාණය වූ ලකුණු 409ක් ලබා ගනිමින් වාර්තාවක් පිහිට වූ නවෝද් මේ සම්මාන උලෙළේදී සියලු කාණ්ඩයන්ගේ 2020 වර්ෂයේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020 හොඳම පිතිකරු හා 2020 හොඳම තුන් ඉරියව් ක්‍රීඩකයා යන සම්මාන ත්‍රිත්වයම හිමි කර ගැනීමට සමත් වී තිබේ. වත්මන් පාසල් සිසුන් සහ ආදි සිසුන් සහභාගි වූ මේ උපහාර පිදීමේ උත්සවය සඳහා ගාල්ල මහින්ද විද්‍යාලයේ විදුහල්පති ගාමිණී ජයවර්ධන මහතා, නවෝද් පරණවිතාන සිසුවාගේ මවුපියන්, සුබ පතන්නන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

ඩී. එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

## තණමල්විල වෙළෙඳසලකින් මුදල් සහ දේපළ සොරාගෙන

තණමල්විල පොලිස් වසමේ සූරියආර - විජයපුර පිහිටි වෙළෙඳසලකින් ඉකුත් පළමු වැනිදා රාත්‍රී රුපියල් එක්ලක්ෂ තිස්හතරදහස් හයසිය අසූවක් වටිනා මුදල් සහ දේපළ සොරාගෙන ගොස් ඇතැයි තණමල්විල පොලීසිය පවසයි. වෙළෙඳසලේ වහලයේ සෙවිලි තහඩුවක් ඉවත්කොට ඇතුළු වූ කිසියම් අයෙකු රුපියල් විසි නවදහසක් වටිනා රූපවාහිනී යන්ත්‍රයක්, රුපියල් පන්දහසක් වටිනා පරිගණක බැටරියක්, රුපියල් විසි එක්දහස් හාරසිය අසූවක් වටිනා ජංගම දුරකථන 12 සහ ලාච්චුවේ තිබූ රුපියල් දහතුන් දහසක් මෙලෙස සොරාගෙන ගොස් ඇත.

තණමල්විල පොලිස් ස්ථානාධිපති ටී. එම්. කරුණාතිලක මහතා පරීක්ෂණ පවත්වයි.

සනත් ගමගේ - ලුණම සමූහ

## අම්බලන්තොට මහජන පොළේ වෙළෙඳුන් සෞඛ්‍ය නීති පිළිපදින්නේ නෑ

අම්බලන්තොට නගරයේ ඇතැම් වෙළෙඳුන් හා මහජන පොළේ වෙළෙන්දෝ නිසි ලෙස සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිනොපැදීම හේතුවෙන් එම වෙළෙඳුන්ට දැඩි ලෙස අවවාද කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හා පොලීසිය පෙරේදා (03) පියවර ගත්හ. අම්බලන්තොට නගරයේ සහ සති පොළේ සිදු කළ විශේෂ මෙහෙයුමක දී මෙලෙස අවවාද දීම සිදු කෙරිණි. නගරයේ ඇතැම් වෙළෙඳසල් හිමියන් අත් සේදීම සඳහා ජල කරාමය පමණක් සවිකර තිබුණද ඒ සඳහා අවශ්‍ය සෙසු පහසුකම් සපයා නොතිබිණි. ඇතැම් වෙළෙඳසල් ඉදිරිපිට අත් සෝදන ජලය මාර්ගය දිගේ ගලා යන අවස්ථාද දක්නට ලැබිණි. වෙළෙඳසල් තුළට පුද්ගලයන් වැඩි පිරිසක් පැමිණ භාණ්ඩ මිලදී ගැනීම් සිදු විය. මුව ආවරණ නිසි ලෙස පලඳා නොමැතිව සිටීම වැනි නිරෝධායන පනතේ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම මත මෙසේ අවවාද කිරීම සිදු විය. අම්බලන්තොට මහජන පොළද පැවැති අතර එහිදී ද ප්‍රමිතියෙන් තොර මුව ආවරණ පැලඳ සිටි වෙළෙඳුන් කිහිප දෙනෙකුට දැඩි ලෙස අවවාද කර නව මුව ආවාරණ පැලඳ ගැනීමට උපදෙස් ලබා දුන්නේය. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා අම්බලන්තොට පොලිස් ස්ථානයේ නිලධාරිහු මේ හදිසි පරීක්ෂාවට සහභාගී වී සිටියහ.

සරත් වෙලගෙදර - ඇළහැර

## බකමූණ රජයේ රෝහලේ දෙමහල් ගොඩනැගිල්ල ජනතා අයිතියට



බකමුණ රජයේ රෝහලේ මිලියන 25ක් පමණ මුදලක් වැයකර ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ල මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් පළාත් සභා හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය රොෂාන් රණසිංහ පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති අමර කීර්ති අතුකෝරල යන මහත්වරුන් විසින් විවෘත කර ජනතා අයිතියට පත්කරන ලදී . මෙම දෙමහල් ගොඩනැගිල්ලේ බාහිර අංශයේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම හදිසි අනතුරු ප්‍රතිකාර කිරීමේ වාට්ටු සඳහා වෙන්කර තිබේ. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ අමාත්‍ය රොෂාන් රණසිංහ අමාත්‍ය සිරිපාල ගම්ලත් පොළොන්නරුව දිස්ත්‍රික් මන්ත්‍රී අමර කීර්ති අතුකොරල යන මහත්වරුන් රොහලට රෝද පුටුවක් පිරිනමන අයුරු.

රූපිකා කේ. බණ්ඩාර කුරුවිට සමූහ

## වතු සේවකයන්ගේ පාරිතෝෂික මුදල් කලට වේලාවට නෑ

රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්ක තුළ වැවිලි සමාගම් යටතේ පාලනය වන බොහෝ වතුවල කම්කරුවන්ට සේවා පාරිතෝෂික මුදල් ලබාදීම හිතාමතාම ප්‍රමාද කරන බවට සේවකයෝ මැසිවිලි නඟති. සේවයෙන් ඉවත්වී මාසයක් ඇතුළත මම මුදල් ලබාදීම කළ යුතුව තිබුණත් වසර ගණනක් ගතව ගියද එම මුදල් ලබා දෙන බවද සේවකයෝ පවසති. මේ සම්බන්ධයෙන් වතු පාලනාධිකාරියෙන් විමසු විට අදාළ වතු සමාගමෙන් මුදල් ලැබුණහොත් පමණක් පාරිතෝෂික මුදල් ගෙවන බව පවසන බවද මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවක් බවද සේවකයෝ පෙන්වා දෙයි. පාරිතෝෂික මුදල් හිමිවන්නේ සේවකයකු වසර පහක් අඛණ්ඩව සේවය කළහොත් පමණක් බැවින් සමහර පාලකයෝ වාසිය තකා අඛණ්ඩ සේවා කාලයක් ලබානොදීමට විවිධ උපක්‍රම යොදන බවද සේවකයන් නොදැනුවත්වම සේවක අර්ථසාධක අංක කිපයක් යොදන බවද ඔවුහු පවසති. කම්කරුවන් නියෝජනය කරන වතු වෘත්තිය සමිති පවසන්නේ මෙවැනි ගැටලු වෘත්තිය සමිති හරහා අදාළ කම්කරු කාර්යාලයට යොමු කරන බවත් පළමු හා දෙවන පරීක්ෂණ දිනවලට බොහෝ පාලකයන් නොපැමිණ තුන්වන අවස්ථාවේ පමණක් සහභාගි වෙමින් කල්මරන බවයි.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## ත්‍රි'මලේ හුදෙකලා කළ වසම්වල ජනතාවට වියළි ආහාර



ත්‍රිකුණාමලයේ කොවිඩ් 19 වසංගතය පලනය කිරීම සඳහා හුදකලාකල ග්‍රාම නිලධාරි වසම්වල අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සඳහා වියළි ආහාර මලු 300ක් දිසාපති සමන් දර්ශන පාඩිකෝරල මහතා වෙත "අහම්" මානුෂිය මානව සම්පත් මධ්‍යස්ථානය මගින් ලබාදනු ලැබීය. දිසාපති කාර්යාලයේදී මෙම වියළි ආහාර මලු මානුෂිය මානව සම්පත් මධ්‍යස්ථානයේ සහකාර සම්බන්ධිකාරක අලගුරාජා මදන් මහතා විසින් දිසාපතිවරයා වෙත නිල වශයෙන් භාර දුන් අතර එම අවස්ථාවේදී දිසාපතිවරයා මෙම වියළි ආහාර මලු තොගය අඩු ආදායම්ලාභීන්ට බෙදාදීම සඳහා ත්‍රිකුණාමල ප්‍රාදේශීය ලේකම් පොන්නයියා දනේෂ්වරන් මහතාට ලබා දුන්නේය. අනෙතුක් පවුල් සඳහාද මේ ආකාරයටම රාජ්‍ය නොවන සංවිධාන හරහා වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කරන බව දිසාපතිවරයා මෙහිදි පැවසීය. මෙම අවස්ථාවට අතිරේක දිසාපති (ඉඩම්) පී.ආර්. ජයරත්න මහතාද එක්ව සිටියහ.

දික්වැල්ලේ තිලකරත්න - ගාල්ල උතුර සමූහ

## දක්ෂිණ අධිවේගයේ සේවකයන් දෙදෙනකුටත් කොරෝනා

දක්ෂිණ අධිවේගි මාර්ගයේ ඉමදුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ සේවය කරන මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් දෙදෙනකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බැව් ඉමදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි. ටිකට් කවුන්ටරයේ සේවකයකුට හා පරිගණක අංශයේ සේවකයකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව පී.සී.ආර්. පරීක්ෂණවලදී තහවුරුවී ඇත. මොවුන්ගේ ආශ්‍රිතයින්ද මේ වන විට පී.සී.ආර් පරීක්ෂණවලට ලක්කොට ඇත. මෙම තත්ත්වය නිසා දැනට ඉමදුව හුවමාරු මධ්‍යස්ථානයේ කටයුතු අක්‍රිය වී ඇති අතර කොක්මාදුව පිවිසුම භාවිතා කරන ලෙසට දක්ෂිණ අධිවේගි මාර්ගය භාවිත කරන වාහන හිමියන්ගෙන් ඉල්ලා සිටිති.

## දවසේ රාහු කාලය

උදේ 10.31 සිට 12.07 දක්වා, රාත්‍රී 10.40 සිට 12.07 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි

## දින තත්ත්වය

මේෂ රවි 25 භාග බක් අව දොළොස්වක තිථිය ලත් ශනි දින ඉර උදාව 5.55ට ඉර බැසීම 06.19ට උත්‍රපුටුප නැකත දහවල් 02.50න් ගෙවී රේවතී නැකත උදා වේ. බක් අව දොළොස්වක තිථිය සවස 05.25න් ගෙවී අව තෙළෙස්වක තිථිය ලබයි. විශ්කම්භ යෝගය රාත්‍රී 08.01න් ගෙවී ප්‍රීති යෝගය ලබයි. කෞලව කරණය අලුයම 04.26 න් ගෙවී තෛතිල කරණය ලබා එය සවස 05.25න් ගෙවී ගරජ කරණය ලබා පවතී.

විෂ කලාව - කෙණ්ඩ අමෘත කලාව - දණහිස

මරු සිටින දිසාව - නැගෙනහිර, යෝගිනී - නිරිත, සුබ දිසාව - උතුර

### 2021 මැයි 08 සෙනසුරාදා හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**
05.55 - 06.55 දක්වා - සෙනසුරු හෝරාව
06.55 - 07.55 දක්වා - ගුරු හෝරාව
07.55 - 08.55 දක්වා - කුජ හෝරාව
08.55 - 09.55 දක්වා - රවි හෝරාව
09.55 - 10.55 දක්වා - සිකුරු හෝරාව
10.55 -11.55 දක්වා - බුධ හෝරාව

**සවස**
11.55 - 12.55 දක්වා - සඳු හෝරාව
12.55 - 01.55 දක්වා - සෙනසුරු හෝරාව
01.55 - 02.55 දක්වා - ගුරු හෝරාව
02.55 - 03.55 දක්වා - කුජ හෝරාව
03.55 - 04.55 දක්වා - රවි හෝරාව
04.55 - 05.55 දක්වා - සිකුරු හෝරාව

**රාත්‍රී**
05.55 - 06.55 දක්වා - බුධ හෝරාව
06.55 - 07.55 දක්වා - සඳු හෝරාව
07.55 - 08.55 දක්වා - සෙනසුරු හෝරාව
08.55 - 09.55 දක්වා - ගුරු හෝරාව
09.55 - 10.55 දක්වා - කුජ හෝරාව
10.55 -11.55 දක්වා - රවි හෝරාව

**අලුයම**
11.55 - 12.55 දක්වා - සිකුරු හෝරාව
12.55 - 01.55 දක්වා - බුධ හෝරාව
01.55 - 02.55 දක්වා - සඳු හෝරාව
02.55 - 03.55 දක්වා - සෙනසුරු හෝරාව
03.55 - 04.55 දක්වා - ගුරු හෝරාව
04.55 - 05.55 දක්වා - කුජ හෝරාව




**බබාට නමක්**

මෙදින දහවල් 02.50 තෙක් උත්‍රපුටුප නැකත උදාවන බැවින් එතෙක් උපදින දරුවනට දු, ථ අකුරු ද ඉන්පසු රේවතී නැකත උදාවන බැවින් එතැන් සිට උපදින දරුවන්ට දෙ, දො, ච, චි අකුරු ද දිනට අදාළව ප, බ, හ, ම අකුරු ද මුල් කොට දරුවාට නමක් තැබීම සුබයි.



## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - දේපළ සම්බන්ධ ගැටලු

මේෂ ලග්නයට අනුව අද ඔබට තම දූ දරුවන්ගේ කටයුත්තක් සඳහා නිවසින් දුර බැහැර යාමට සිදු වේ. තම දේපළ සම්බන්ධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ. ආර්ථික අතින් පාඩු සිදුවනු ඇත. සකසුරුවම අපරික්ෂාකාරී බව අවශ්‍ය වේ. ඒ අනුව ඔබ තම ආගමික කටයුතු කෙරේද සිත යොමු කර මානසික ඒකාග්‍රතාව උදා කර ගැනීමට උනන්දු වන්න. නැතොත් තම ගැටලුවලට තව තවත් අවුල් සිදුවනු ඇත.

### වෘෂභ ලග්නය - ආර්ථිකය සවිමත් වේ

වෘෂභ ලග්නයට අනුව අද ඔබට ආර්ථික අතින් සුබයි. ගෘහ ජීවිතය කාර්ය බහුල වේ. නව ආයෝජනවලට මඟ පෑදේ. තම එදිනෙදා කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාමට හැකි වේ. තම දූ දරුවන්ගේ කටයුතුවලට වැඩි කැපවීමක් දැරීමට සිදුවන අතර, දණහිස ආශ්‍රිත උවදුරු පෙන්වන නිසා කල්පනාකාරී වන්න.

### මිථුන ලග්නය - රැකියා උසස් වීම්

මිථුන ලග්නයට අනුව අද ඔබට රැකියා යහපත උදා වේ. නව රැකියා මාර්ග හා තමා දැනට කරගෙන යන රැකියා උසස් වීම් ද සහිතයි. වාහන ඉඩම් ලාභ පෙන්වයි. සිතට දැනෙන ශක්තිය දැඩිකම මත විවිධ ආර්ථික ක්‍රමෝපායන මාර්ග අත්හදාබැලීම් සිදු කෙරෙනු ඇත. තුනටිය ආශ්‍රිත උවදුරු පෙන්වයි ප්‍රවේසම් වන්න. බර ඉසිලීම් සුබ නොවේ.

### කටක ලග්නය - ගෘහ ජීවිතය සතුටුදායක වේ

කටක ලග්නයට අනුව අද ඔබට තම පෙර පිං මහිමය උදාවීම තුළ විවිධ ආගමික කටයුතුවල නිරත වන බවක් පෙන්වයි. වෘත්තීය මට්ටමේ ජයග්‍රහණ රැසක් උදා වේ. ඒ අතර දේපළ හිමිකම නව නිවසක පදිංචියට යාම සිදු වේ. ගෘහ ජීවිතය සතුටුදායක වන නමුදු වෙහෙසකාරී බව නිසා පීඩාවලට ගොදුරු වේ. යටි බඩේ අසනීප හා සැර උෂ්ණ ආහාර නිසා අගුණ පළවනු ඇත.

### සිංහ ලග්නය - ආර්ථික පාඩු

සිංහ ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා ඔබ කේන්ද්‍රයේ 08 වැන්නේ හැසිරෙන නිසා ඉතා ප්‍රවේසම් වන්න. ආර්ථික පාඩුවකට හේතු වෙයි. බලාපොරොත්තු නොවූ කටයුත්තකට අතගැසීම නිසා එහි පසුතැවීමකට භාජනය වේ. තම විවාහ ස්ථානගත ගැටලු හා ආදර සබඳතා බිඳෙන තත්ත්වයකි. සිත සන්සුන්ව තබා ගැනීමට වග බලා ගන්න.

### කන්‍යා ලග්නය - විවාහ දිවිය සතුටුදායක වේ

කන්‍යා ලග්නයට අනුව අද ඔබට සුබ දිනකි. සතුටුදායක ලෙස කාලය ගත කිරීමට හැකි වේ. තම සහකරු හෝ සහකාරිය අතර සුහදතාව දැඩිවන දිනකි. හුදෙකලාව හිඳීමේදී තම නව යොවුන් ආදර සබඳතා දලුලා වැඩෙනු ඇත. කොතෙක් කටයුතු තිබුණ ද ආලය, ආදරය, විවාහ දිවිය වෙනුවෙන් වැඩි කැපවීමක් සිදු කෙරෙන දිනකි. පපුවේ සෙම, හතිය දැඩිවන ලකුණු පෙනේ.

### තුලා ලග්නය - ශරීර සෞඛ්‍යය අයහපත් වේ

තුලා ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රචාරය 06 වැන්නේ නිසා යටිබඩ ආශ්‍රිත අගුණ පළ වේ. සැර ආහාරයක් නිසා අජීර්ණ තත්ත්වයකි. ගෘහ ජීවිතය කාර්ය බහුල වේ. තම රැකියාගත රාජකාරි පැහැර හැරෙන තත්ත්වයක් මත ප්‍රධානීන් තමාට චෝදනා එල්ල කිරීමට ඉඩ ඇත. ප්‍රවේශමෙන් කටයුතු කරන්න. ආර්ථික පාඩු මෙන්ම ව්‍යාපාර බිඳවැටීම් මතු කෙරේ.

### වෘශ්චික ලග්නය - වාසනාවන්ත දරු සම්පත්

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. වාසනාවන්ත දරු උපත් ආර්ථික සවිමත් බව සෙසු අයගේ ඇප උපකාර සහිතයි. තම දේපළකට තිබූ බාධා ඉවත් වේ. නඩු තීන්දුවක් තම වාසිය පිණිස ලැබේ. තම වෘත්තීය මට්ටම උසස් වනු ඇත. ලැබීම්වලට සමගාමීව වියදම් ද පෙන්වන නිසා කල්පනාකාරී වන්න.

### ධනු ලග්නය - සිතේ සතුට සැනසුම

ධනු ලග්නයට අනුව අද ඔබට තම වාසනාව පිළිබඳ වඩාත්ම තහවුරු කරන කරුණු කීපයක් උදා වේ. ඒ අතර රැකියා ව්‍යාපාර සපල වේ. උසස් ආදායම් ලැබේ. අන් අයගේ ඇප උපකාර හා ආර්ථික පරිත්‍යාගයන් උදා වේ. වාහන, ඉඩම් ලාභ මූල්‍යමය ප්‍රතිලාභ මෙන්ම නව නිවසක පදිංචියට යාම ආදිය සිදු වන නිසා සිතේ සතුට සැනසුම උදා වේ.

### මකර ලග්නය - ජලාශ්‍රිත කටයුතු කෙරෙන් ප්‍රතිලාභ

මකර ලග්නයට අනුව අද ඔබට ජලාශ්‍රිත කටයුතු කෙරෙන් ප්‍රතිලාභ ලැබේ. ධීවර ප්‍රජාවගේ ආදායම් උසස් වේ. තවද වැලි ගොඩ දැමීම්, මැණික් හෑරීම් ආදි කටයුතුවල නිරත අයට උසස් ලැබීම් සහිතයි. ශරීර සෞඛ්‍ය අතින් සීතල වැඩි වීම නිසා සෙම, හතිය, උණ ආදි අසාත්මිකතා ඇති වීමට පුළුවන.

### කුම්භ ලග්නය - ලොතරැයි ජය

කුම්භ ලග්නයට අනුව අද ඔබට ධන සම්පත් උදා කෙරේ. නොසිතූ මාර්ගවලින් ආදායම් ලොතරැයි ජය මෙන්ම තරග විභාගවලින් ජය හිමි වනු ඇත. ඔට්ටු ඇල්ලීම් තුළින් ධන සම්පත් ඇති වේ. තම ශරීර සෞඛ්‍ය පිළිබඳ උනන්දු විය යුතු වන්නේ ස්නායුගත ගැටලු පවතින අයයි. ඒ රෝග උත්සන්න වන ලකුණු පෙනේ.

### මීන ලග්නය - නිදහස් අදහස්වලට මුල්තැන

මීන ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. චන්ද්‍රයා ලග්නයේ හැසිරෙන අද ඔබට සතුටුදායක ආරංචි රැසක් අසන්නට ලැබේ. නිදහස් අදහස් ක්‍රියාවට නැංවීම නිසා බොහෝ අයගේ ප්‍රසාදය දිනාගත හැකි දිනකි. ඔබ නිර්මාණශීලී අයකු නම් ග්‍රන්ථකරණය පිළිබඳව මූලාරම්භයක් සිදු කිරීම සුබයි. ඔබ ගන්නා තීන්දු තීරණ යහපත් ලෙස ප්‍රතික්‍රියා කරන දිනකි.

## ඉන්දියාවට බොහෝ රටවලින් හදිසි වෛද්‍ය සැපයුම් ගලා ආවත් භාණ්ඩ බෙදා හැරීම් ප්‍රමාදයි



පසුගිය මාසයේ ඉන්දියාවේ විනාශකාරී කොවිඩ් -19 අර්බුදය උත්සන්න වෙද්දී, ලොව පුරා රටවල් හදිසි වෛද්‍ය සැපයුම් යැවීම ආරම්භ කළේ ආසාදිතයන් ඉහළ යෑම වැළැක්වීමටය. පසුගිය සතිය මුලදී එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය ඇතුළු රටවලින් වෙන්ටිලේටර, ඖෂධ සහ ඔක්සිජන් උපකරණ ඉන්දියාවට ගලා ඒමට පටන් ගත්තේය. ඉරිදා වන විට දිල්ලි අන්තර්ජාතික ගුවන්තොටුපොළට පමණක් ගුවන් ගමන් 25ක සැපයුම් ටොන් 300ක් පමණ පැමිණ තිබේ. එහෙත් රට පුරා සිද්ධි වාර්තාගත මට්ටම් කරා ළඟා වෙමින් පවතින හෙයින්, බොහෝ අවශ්‍යතා ඇති අයට ආධාර සැපයීමේ ප්‍රමාද සිදුවිය. දින කීපයක් තිස්සේ රෝහල් වැඩි සහයෝගයක් ඉල්ලා සිටි නිසා බොහෝ භාණ්ඩ ගුවන් තොටුපොළේ සිට බෙදා හැරීම ප්‍රමාද වී තිබේ.

සඳුදා සවස් වනතුරුම සැපයුම් බෙදා හැරීම ආරම්භ කර නැත. පළමු හදිසි ආධාර කණ්ඩායම පැමිණ සතියකට වැඩි කාලයක් ගතවී ඇති බව රාජ්‍ය නිලධාරීන් ප්‍රාදේශීය මාධ්‍ය වෙත පවසා තිබේ. ප්‍රමාදයක් ඇති බව ඉන්දීය රජය තරයේ ප්‍රතික්ෂේප කර ඇති අතර අඟහරුවාදා සවස ප්‍රකාශයක් නිකුත් කරමින් කියා සිටියේ සැපයුම් බෙදා හැරීමට විධිමත් හා ක්‍රමානුකූල යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇති බවයි. සෞඛ්‍ය අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ භාණ්ඩ වේගයෙන් සොයා ගැනීමට සහ පිරිසුදු කිරීමට දින 7ම පැය 24ම වැඩ කරන බවයි. එහෙත්, භූමියේදී, ඉන්දියාවේ දරුණුතම බලපෑමට ලක්වූ ඇතැම් ප්‍රාන්තවල නිලධාරීන් මාධ්‍ය වෙත පැවසුවේ ඔවුන්ට තවමත් කිසිදු සැපයුමක් ලැබී නැති බවයි.

## කොවිඩ් එන්නතට පේටන්ට් බලපත්‍ර අත්හැරීමේ එක්සත් ජනපද යෝජනාවට ජර්මනියේ විරෝධය







### එන්නත් නිෂ්පාදනයට එය බාධාවක් නොවෙයි

කොවිඩ් -19 එන්නත සඳහා පේටන්ට් බලපත්‍ර අත්හැරීමේ එක්සත් ජනපද පිටුබලය සහිත යෝජනාවට ජර්මනිය විරෝධය පළ කර ඇති අතර, ඒවා එන්නත් නිෂ්පාදනයට බාධාවක් නොවන බව කියා සිටියේය. එහි රජය පැවසුවේ "බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම නව්‍යකරණයේ ප්‍රභවයක් වන අතර එය එසේ විය යුතු" බවයි. යුරෝපා සංගමය මීට පෙර කියා සිටියේ මේ යෝජනාව ගැන කතා කිරීමට සූදානම් බවයි. මේ සැලසුමට අනුබල දෙන අය පවසන්නේ ජීවිතාරක්ෂක එන්නත් නිපදවීමට වැඩි නිෂ්පාදකයන්ට ඉඩ ලබා දෙන බවයි.

මෙය දුප්පත් රටවල එන්නත්වලට ප්‍රවේශය වැඩි කරනු ඇතැයි ඔවුහු තර්ක කරති. එහෙත් ඖෂධ නිෂ්පාදකයන් ඇතුළු විරුද්ධවාදීන් පවසන්නේ එය අපේක්ෂිත බලපෑමක් ඇති නොකරනු ඇති බවයි. ගෝලීය වාණිජ්‍ය ප්‍රවර්ධනය කරන අන්තර් රාජ්‍ය ආයතනයක් වන ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) රටවල් 60ක පමණ කණ්ඩායමක් මෙහෙයවන ඉන්දියාව සහ දකුණු අප්‍රිකාව විසින් මේ අදහස මුලින් යෝජනා කරන ලදී. එන්නත් සඳහා බුද්ධිමය දේපළ ආරක්ෂණ තාවකාලිකව ඉවත් කිරීමට මේ කණ්ඩායම පෙලඹී සිටී.

## පාසලක දැරියක සිසුන් දෙදෙනෙකුට සහ කාර්ය මණ්ඩලයේ අයකුට වෙඩි තබලා



එක්සත් ජනපදයේ ඉඩාහෝ ප්‍රාන්තයේ පාසලක වයස අවුරුදු 12ක දැරියක් ඇගේ සෙසු සිසුන් දෙදෙනෙකුට සහ කාර්ය මණ්ඩල සාමාජිකයකුට වෙඩි තබා තුවාල සිදු කළ බව පොලිසිය පවසයි. හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නම් නොකළ සිසුවිය රිග්බි මධ්‍ය මහා විද්‍යාලයට තුවක්කුවක් ගෙනැවිත් වෙඩි තැබුවේය. තුවාල ලැබූ තිදෙනා දිවි ගලවා ගනු ඇතැයි අපේක්ෂා කරන බව නිලධාරීහු පවසති. ගැහැනු ළමයා නිරායුධ කිරීමට සමත් වූ අතර පොලිසිය ඇය අත්අඩංගුවට ගන්නා තෙක් ඇය රඳවා තබා ගත් බව බලධාරීහු පවසති.

ඇයගේ චේතනාව තවම තහවුරු කර නොමැත. දැරිය ඇගේ බෑගයෙන් අත් තුවක්කුවක් ලබාගෙන, පාසල ඇතුළත හා පිටත වට කීපයක් වෙඩි තැබුවාය. ජෙෆර්සන් කවුන්ටි ෂෙරිෆ් ස්ටීව් ඇන්ඩර්සන් පැවසුවේ දැරිය අසල පිහිටි ඉඩාහෝ දිය ඇල්ලෙන් පැමිණි බවයි. සිද්ධිය එෆ්බීඅයි සහ ප්‍රාදේශීය නීතිය ක්‍රියාත්මක කරන්නන් විසින් විමර්ශනය කරනු ලැබේ.

## ඔස්ට්‍රේලියාවට පැමිණීමේ තහනම 15 වැනිදා අවසන්: ඉන්දියාවේ සිටින ඕස්ට්‍රේලියානුවෝ 9,000ක් ගුවන් ගමන් අරඹන තෙක් බලා සිටිති

ඔස්ට්‍රේලියාවට පැමිණීම තහනම් කිරීම මැයි 15 වැනිදායින් අවසන් වීමෙන් පසු එරට විසූ ඉන්දියාවේ ඇතැම් පුරවැසියන්ට නැවත ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් ආරම්භ කරනු ඇත. කොවිඩ් නිසා විනාශයට පත් සිරවී සිටින ඉන්දියාවේ පුරවැසියන්ට උදව් කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අගමැති ස්කොට් මොරිසන් විවේචනයට ලක්ව තිබේ. නිවෙස් බලා යෑමට අපේක්ෂා කරන ඔස්ට්‍රේලියානුවන්ට සිර දඬුවම් හෝ දඩ මුදල් ගෙවිය යුතු බව රජය පැවසීමෙන් පසු මේ තහනම තවත් කෝපයට හේතු විය. මොරිසන් මහතා කියා සිටියේ "අවදානමට ලක්විය හැකි" පුරවැසියන් නැවත ගෙන්වා ගැනීම ඔවුන් ආරම්භ කරන බවයි.

ඔස්ට්‍රේලියානුවන් 900ක් පමණ මේ කණ්ඩායමේ රජය සමඟ ලියාපදිංචි වී සිටිති. මේ වන විට ඔස්ට්‍රේලියානුවන් 9,000කට වැඩි පිරිසක් ඉන්දියාවේ සිටිති. මොරිසන් මහතා පැවසුවේ සංචාරක තහනම මැයි 15 වැනිදායින් අවසන් වනු ඇතැයි තමන් අපේක්ෂා කරන බවයි. කෙසේ වෙතත්, ඔහුගේ රජය ඉන්දියාවෙන් වාණිජ ගුවන් ගමන් නැවත ආරම්භ කරන්නේද යන්න පිළිබඳ තීරණයක් ගැනීමට ලබන සතිය තෙක් බලා සිටිනු ඇත. එසේ වුවද, ගුවන් යානයක ආසනයක් ලබා ගැනීම හෝ මිල අධික ගාස්තු දැරීම දුෂ්කර යැයි බොහෝ දෙනා බිය වෙති.






## රියෝ ද ජැනයිරෝ නුවර වෙඩි හුවමාරුවකින් 25ක් මරුට



රියෝ ද ජැනයිරෝ නුවර සිදු වූ වෙඩි හුවමාරුවකින් පොලිස් නිලධාරියකු ඇතුළු 25ක් මියගොස් ඇති බව ප්‍රාදේශීය මාධ්‍ය වාර්තා කරයි. මෙම වෙඩි තැබීම සිදුව ඇත්තේ නගරයේ ජැකරෙසින්හෝ ප්‍රදේශයේ ෆැවේලා ප්‍රදේශයක පොලිස් මෙහෙයුමක් අතරතුරදීය. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් තම කල්ලියට ළමයින් බඳවා ගන්නා බවට වාර්තා ලැබීමෙන් පසු පොලිසිය මේ මෙහෙයුම ක්‍රියාත්මක කළේය. මෙට්‍රෝ දුම්රියේ සිටි මගීන් දෙදෙනෙකුට වෙඩි උණ්ඩ වැදී ඇති නමුත් ඔවුන්ගේ ජීවිතවලට තර්ජනයක් වී නැත.

ඔවුන්ගේ එක් නිලධාරියකු වන පොලිස් පරීක්ෂක ඇන්ඩ්‍රේ ලෙනාඩෝ ද මෙලෝ ෆ්‍රියාස්ගේ මරණය බ්‍රසීල නගරයේ පොලිසිය විසින් තහවුරු කරන ලදී. පොලිස් ප්‍රධානී රොනාල්ඩෝ ඔලිවෙයිරා රොයිටර් පුවත් සේවයට පැවසුවේ බ්‍රහස්පතින්දා සිදු කළ වැටලීම "රියෝහි පොලිස් මෙහෙයුමකදී සිදු වූ විශාලතම මරණ සංඛ්‍යාව" බවයි. ප්‍රාදේශීය ප්‍රවෘත්තිවලට අනුව, මේ වැටලීම ඉලක්ක කරගත් කල්ලිය මත්ද්‍රව්‍ය ජාවාරම, ජාවාරම්, ඝාතන සහ පැහැරගැනීම්වල නිරත වේ. රූපවාහිනී පින්තූරවලින් පෙනී ගියේ සැකකරුවන් වහල උඩින් පැන යෑමට තැත් කරන බවයි.

## ඉහළ ආරක්ෂාවක් දෙන රුසියාවේ එන්නත පුටින් අගයයි



ජනාධිපති ව්ලැඩිමීර් පුටින් රුසියාවේ එන්නත අගය කරමින් "කලෂ්නිකොව් ප්‍රහාරක රයිෆලයක් තරම් විශ්වාසදායක" යැයි ප්‍රකාශ කර තිබේ. බ්‍රහස්පතින්දා නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ටැටියානා ගොලිකෝවා සමඟ වීඩියෝ සම්මන්ත්‍රණයක දී මේ බව ප්‍රකාශ කර තිබේ. එය සිදු වූයේ රටේ සෞඛ්‍ය නිලධාරීන් විසින් බ්‍රහස්පතින්දා ස්පුට්නික් ෆයිව් එන්නතේ තනි මාත්‍රාවකින් යුත් ස්පුට්නික් ලයිට් ලෙස ලියාපදිංචි කිරීමත් සමඟය. පුටින් මහතාගේ සංසන්දනය සෝවියට් සමූහාණ්ඩුවේ යුගයේ ආයුධය ගැන සඳහන් කර ඇති අතර එය අදටත් ජනප්‍රිය වේ.

මේ වසර මුලදී ඔස්ට්‍රියානු වෛද්‍යවරයකු එන්නතේ කාර්යක්ෂමතාව පිළිබඳව කළ ප්‍රකාශයක් ඔහු මෙහිදී උපුටා දැක්වීය. පසුගිය වසරේ මොස්කව්හිදී එන්නත සඳහා ඉක්මන් නියාමන අනුමැතිය ලබා දුන් විට පුටින් පරිපාලනයේ විවේචකයන් සැක පහළ කළ නමුත් අවසාන අදියරේ අත්හදා බැලීම්වලින් පෙනී ගියේ එය කොවිඩ් -19 ට එරෙහිව ඉහළ මට්ටමේ ආරක්ෂාවක් සපයන බවයි. එහි මාත්‍රා දෙකේ අනුවාදය දැන් ලොව පුරා රටවල් ගණනකට අවසර දී ඇත.

## පොල් මිල
පොල් සංවර්ධන අධිකාරිය - ප්‍රකාශිත දිනය 2021/05/07

1. පොල් මිල
(අ) වෙළෙඳපොළ මිල ගණන් 2021.04.23 -2021.04.29 (මූලාශ්‍රය - HARTI)

| | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|
| ලොකු ප්‍රමාණය ගෙඩියක මිල රු. | 65.00 -68.00 | 80.00 - 90.00 |
| කුඩා ප්‍රමාණය ගෙඩියක මිල රු. | 60.00 - 62.00 | 60.00 - 75.00 |

(ඈ) දේශීය ගොවිපොළ මිල රු/ගෙඩි 1000ක්

| | (ලෙලි නොගසන) | රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද) |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 65,000 - 75,000 | 110,000 -115,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 60,000 -72,000 | 108,000 -116,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 60,000 -65,000 | 110,000 -115,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 65,000 -70,000 | 110,000 - 112,000 |

2.කොප්පරා - දේශීය වෙළෙඳපොළ මිල 07/05/2021

| | | |
|---|---|---|
| ඛාද්‍ය කොප්පරා | | (රු/කි.ග්‍රෑ.250ක්) - |
| තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) - | | 107,5 00 |
| තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) - | | 90,000 |
| තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා (රු/කි.ග්‍රෑ.250ක්) - | | |
| 3.දිසිඳි පොල් | | |
| සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශීය) | (රු./කි.ග්‍රෑ.1 ක්) | 580 -585 සා |
| | (රු./කි.ග්‍රෑ.1 ක්) | 580 - 590 සා |
| ශ්‍රී ලංකා - නැවතෙක් මිල | (රු./කි.ග්‍රෑ.1 ක්) | |
| 4.පොල් තෙල් (තොග මිල) | | |
| දේශීය මිල | (රු./මෙ.ටො.1ක්) | 700, 000 - 750,000 සා |
| පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.04.22) (රු./මෙ.ටො.1ක්) | | 338,967 |
| 5. පුන්නක්කු | (රු./මෙ.ටො.1ක්) | 65,000 - 80,000 වි |
| 6. ගුදිරි කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 950 - 1,400 වි |
| 7. ඕමැට් කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 3,750 - 5,000 වි |
| 8. මිශ්‍ර කොහු | (රු./කි.ග්‍රෑ.50 ක්) | 1,650 - 1,800 වි |
| 9. බ්‍රිස්ටල් කොහු බැමි 1 | (රු./කි.ග්‍රෑ.50 ක්) | 5,000 - 7,500 වි |
| 10. බ්‍රිස්ටල් කොහු බැමි 2 | (රු/කි.ග්‍රෑ. 50ක්) | 8,000 -9,000 වි |

11. පොල් ලෙලි මිල (03-05-2021)

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) | |
|---|---|---|
| පුත්තලම | 4,500 - 5,000 | |
| ගම්පහ | 4,500 - 5,000 | |
| මාතර | 4,500 - 5,000 | |
| කුරුණෑගල | 4,500 - 5,500 | |
| තෙතමනය 50% වැඩි පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.00 |
| තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.50 |
| තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 8.50 |
| තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 9.50 |
| තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 10.50 |
| තෙතමනය 10% අඩු පොල් ලෙලි | (රු/කි.ග්‍රෑ. 1ක්) | 13.00 |
| 12. පොල් කටු | (රු/මෙ. ටො. 1ක්) | 25,500 -26,500 වි |
| 13. පොල් කටු අඟුරු (2021-04-22 - 2021-04-29) | (රු/මෙ.ටො. 1ක්) | 97,000.00 වි |
| | (තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%) | |
| 14. පොල් ඉරටු | (රු./මෙ.ටො. 1ක්) | 45,000 - 48,000 වි |

**වි - විකුණුම් මිල** **සා.- සාමාන්‍ය මිල**

## CLC වෙතින් නම්‍යශීලි ලීසිං පහසුකම් රැසක්

රථවාහන ආනයනය සීමා කර ඇති මෙවන් කාලයක ලියාපදිංචි රථ වාහන සඳහා වෙළෙඳපොළ තුළ අධික ඉල්ලුමක් පවතී. "මිස් කර ගන්නැතුව ලීස් කර ගන්න" යන තේමාව යටතේ ක්‍රියාත්මක වන මේ ප්‍රවර්ධන වැඩසටහන හරහා වාහනයක් මිලදී ගැනීමට අපේක්ෂාවෙන් සිටින පෞද්ගලික පරිහරණය සඳහා මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු උදෙසා භාවිත කරන ලොරි, ට්‍රක් රථ ආදිය සඳහාත් මේ පහසුකම අත් විඳිය හැකිය. ආකර්ෂණීය පොලී අනුපාත යටතේ, අවම ලියකියවිලි සමඟින් ලීසිං පහසුකම් ගැනීමට හැකියාව හිමි වේ. තවද මේ හරහා ගනුදෙනුකරුවන්ගේ ආදායම් මට්ටම්වලට ගැළපෙන වඩාත් නම්‍යශීලි ගෙවීම් ක්‍රම හිමි වන අතර, කඩිනමින් එක්දිනක්



තුළදී මේ පහසුකම් ගැනීමට අවස්ථාව හිමි වේ.

දිගු පෝලිම්වල රැඳී සිටිමින් කාලයත් මුදලුත් නාස්ති කරමින් සිටි කාලය අවසන් වන අතර, විවිධ ලියකියවිලි රැසක් සොයමින් නිකරුනේ වෙහෙස විය යුතුද නැත. පාරිභෝගිකයාගේ අවශ්‍යතාව අනුව අවම ලියකිවිලි සකස් කරගත් විට පැය 24ක් වැනි කෙටි කාලයක් ඇතුළත ලීසිං පහසුකම් ගැනීමට හැකියාව මේ ප්‍රවර්ධන වැඩසහටන හරහා පාරිභෝගිකයාට හිමිවේ. මේ පිළිබඳ අදහස් දක්වමින් කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යධිකාරි ප්‍රසන්න කරන්දගොල්ල මෙසේ පැවසීය.

"වසර ගණනාවක් පුරාවට ගනුදෙනුකරුවන්ගේ රථ වාහන සිහින යථාර්ථයක් බවට පත් කිරීමේ කාර්යයේ නිරත වූ කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් සමාගම, ස්වකීය ගනුදෙනුකරුවන් හා දීර්ඝ කාලීන සමීප සබඳතාවක් පවත්වා ගෙන යන අතරතුර, නිරන්තරයෙන් ඔවුන් ඉලක්ක කර ගනිමින් මෙවැනි කාලීන වැදගත්කමින් යුතු ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරනවා."

## ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය CNCI රිදී සම්මාන දිනයි

ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් වන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය සංවිධාන කළ කර්මාන්ත විශිෂ්ටතා 2020 සම්මාන උලෙළේදී ජාතික මට්ටමේ, මහා පරිමාණ කාණ්ඩයේ, නිෂ්පාදන අංශයේ රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. සම්මාන උලෙළ කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ ගලදාරි හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි.

ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ මංජුල ආරියකුමාර මහතා එහිදී සම්මානය ගත්තේය. "පාරිභෝගිකයන්ට ගුණාත්මක භාවයෙන් ඉහළ නිෂ්පාදන සහ සේවා සැපයීමට අප සෑම විටම ක්‍රියා කරනවා. අඛණ්ඩව සම්මාන ලබමින් ඉදිරියට යන්න මූලික හේතුව එයයි. මේ සම්මානය දිනා ගැනීමට දායකත්වය සැපයූ කාර්ය මණ්ඩලට මෙන්ම අපගේ පාරිභෝගිකයන්ට මගේ කෘතවේදීත්වය පිරිනමනවා." මංජුල ආරියකුමාර



මහතා පැවසීය.

කුඩා පරිමාණයෙන් අරඹා වර්තමානයේදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමාගමක් බවට පත්වී තිබෙන ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරය සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය පිරිනැමූ කර්මාන්ත විශිෂ්ටතා රන් හා රිදී සම්මාන සහ ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය පිරිනැමූ විශිෂ්ටතම ව්‍යවසායකයා රන් හා රිදී සම්මාන හිමි කර ගැනීමත්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පිරිනැමූ නිෂ්පාදන විශිෂ්ටතා සම්මානවලින් අඛණ්ඩව පිදුම් ලැබීමත් ඒ අතරින් ප්‍රධානය. ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ නවතම පරිසර හිතකාමී හඳුන්වාදීම වන්නේ හිරු එළියෙන් විදුලිය නිපදවන සූර්ය පැනල පද්ධතියයි. ත්‍රී සිංහ සමූහය නවීන තාක්ෂණය යොදා ගනිමින් අඩු වියදමින් වානේ ගොඩනැගිලි (Prefabricated Steel Building) ඉදි කිරීමද අරඹා තිබේ. රෝලර් ඩෝ, රෝලර් ෂටර්ස්, සෙක්ෂනල් ඕවර්හෙඩ් ඩෝ, වින්ඩෝ ෂටර්ස්, ෆයර් රෙසිස්ටන්ට් ඩෝ, ඇලුමිනියම් ෆැබ්රිකේෂන්ස්, සෙන්සර් ඩෝ, ස්ටේන්ලස් ස්ටීල්, ස්ටීල් රේලින්ග්ස් සහ ස්ටෙයාවේස්, පොලිකාබනේට් කැනපීස්, ස්ටේන්ලස් ස්ටීල් පැන්ට්‍රි කබඩ්ස්, ස්ටීල් බිල්ඩින්ග්ස්, ඔටෝමැටික් බැරියර්ස් සහ මෝටර් සවි කළ ස්ලයිඩින්ග් ඇන්ඩ් ස්වින්ග් ගේට්ස් ත්‍රී සිංහ සමූහ ව්‍යාපාරයේ අනෙකුත් නිෂ්පාදන අතර වේ.

## OPPO A54 හඳුන්වා දෙයි

ලොව smart උපාංග ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන OPPO සිය නවතම දුරකතන මාදිලිය වන OPPO A54 දැන් ශ්‍රී ලංකාවට හඳුන්වා දී තිබේ. ඉතා අලංකාර දුරකථනය මාදිලියක් වන OPPO A54 විශිෂ්ට මට්ටමේ ඡායාරූප ගත හැකි වන ආකාරයට සැලසුම් කර ඇත. එහි 3D Panel සඳහා යොදා ඇති ලෝහමය නිමාව මඟින් එයට වැඩි ශක්තියක් සහ නොනැමෙනසුලු බවක් එක්වී ඇති අතර, අතේ රඳවා ගැනීමද පහසු වේ. මේ නිසාම මෙය ග්‍රෑම් 192ක් වැනි අඩු බරකින් යුක්ත වන අතර, මිලිමීටර් 8.4ක් තරම් සිහින්ය. දුරකථනයේ සමස්ත පෙනුම හා ස්වභාවයට සමගාමී වන ආකාරයට Middle Frame Process සඳහා ද විශේෂ අවධානයක් යොමු කර ඇත.




මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් XINDA Lanka (OPPO Sri Lanka)හි ප්‍රධාන විධායක නිලධාරි බොබ් ලී මහතා මෙසේ පැවසීය. 'OPPO A Series දුරකථන මාලාව සැලසුම් කර ඇත්තේ පාරිභෝගිකයන්ගේ ජීවන රටාවට පහසුවක් එක් වන සහ එය වැඩි දියුණු කිරීමට අත්වැලක් වන ආකාරයටයි. OPPO A54 මාදිලියත් එම අරමුණ ඇතිවම නිර්මාණය කළ මාදිලියක්. නවීන නිමාවක් සමඟින් විශිෂ්ට ක්‍රියාකාරීත්වයක් සහිත එයට යොදා ඇති 5000mAh බැටරිය සහ 18W Fast Charge තාක්ෂණය නිසා එදිනෙදා භාවිතය ඉතා පහසුයි. එමෙන්ම විනෝදාස්වාදයට අවශ්‍ය දේ ගබඩා කර ගැනීමට උපකාරි වන ඉහළ මතක ධාරිතාවක් OPPO A54 මාදිලියට ඇතුළත්."

# MARKET PRICE

## රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 80 | 100 | 40 | 30 | 20-30 | ගෝවා | 90 |
| අළු කෙසෙල් | 100 | 120 | 60 | 12-15 | 40-45 | කැරට් | 100 |
| පිපිඤ්ඤා | 80 | 120 | 50 | 20 - 25 | 25-30 | ලීක්ස් | 50 |
| වැටකොළු | 160 | 160 | 110 | 60-70 | 80-85 | රාබු | 50 |
| බණ්ඩක්කා | 140 | 160 | 80 | 60-65 | 50-60 | බීට්රූට් | 50 |
| කරවිල | 180 | 180 | 90 | 90-100 | 70-80 | අර්තාපල් | 105 |
| පතෝල | 140 | 160 | 110 | 50-60 | 50-60 | අර්තාපල් රතු | 95 |
| මාළු මිරිස් | 240 | 240 | 120 | 100-120 | - | නෝකෝල් | 60 |
| බටානා | - | 120 | 70 | 80 | 50-60 | බෙල්පෙපර් රතු | 350 |
| මුරුංගා | 240 | - | - | - | - | කහ | 350 |
| එළබටු | 140 | 100 | 90 | 60 | 65-70 | කොළ | 220 |
| කැකිරි | 70 | 80 | 30 | 15-20 | 25-30 | බැසිල් | 330 |
| නෝකෝල් | 140 | 140 | 90 | - | 50-60 | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 80 | 80 | - | 30 | 30-35 | රෙඩ් කැබේජ් | 450 |
| බතල | - | - | - | 50-60 | 50-60 | සැල්දිරි | 200 |
| දඹල | 160 | 120 | 110 | 100-110 | 75-80 | කොත්තමල්ලි කොළ | 40 |
| මැකරල් | 140 | 160 | 80 | 70-100 | 50-60 | අයිස්බර්ග් | 220 |
| **උඩරට එළවළු** | | | | | | සලාද | 40 |
| බෝංචි | 140 | 180 | 110 | 100-120 | 110-120 | රතුසලාද | 350 |
| ගෝවා ගෙඩි | 160 | 160 | - | 80-110 | 50-60 | මිංචි | 220 |
| කැරට් | 180 | 180 | 140 | 120-130 | - | පාස්ලි | 220 |
| ලීක්ස් | 120 | 120 | 70 | 60-80 | 50-60 | රූබා | 60 |
| රාබු | 120 | 120 | 70 | 50 | - | රෝස්මරි | 700 |
| තක්කාලි | 120 | 120 | 70 | 60 | - | බ්‍රොකෝලි | 550 |
| බීට්රූට් | 100 | 120 | 50 | 80 | 60-70 | මල්ගෝවා | 400 |
| සලාද | - | - | - | 100-120 | 50-60 | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 140 | - | 30 | - | - | පැවර්ලි | 220 |
| **පලතුරු** | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 130 | 200 | 100 | 80-100 | 60-90 | කහ සුකිනි | 170 |
| ඇඹුල් කෙසෙල් | 100 | 120 | 50 | 30-50 | 30-35 | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 220 | 200 | - | 100-140 | 160-180 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 130 | 140 | 60 | 30-50 | 40-45 | මාළුමිරිස් | 200 |
| ඇම්බුන් | 200 | 200 | - | 120-140 | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 110 | 50 | - | - | | |
| ගස් ලබු | 120 | 120 | 50 | 30-40 | - | | |
| ඇපල් (ආනයනික) | 60 – 80 | 80 | - | - | - | | |
| මිදි (දේශිය) | - | 1000 | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | - | 900 | - | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | - | 900 | - | | - |
| **මස්** | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 580 | 600 | - | 550 | - | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 480 | 560 | - | - | - | | - |
| **අනෙකුත්** | | | | | | | |
| අමු මිරිස් | 200 | 180 | 170 | 120 | 80-100 | | |
| දෙහි | 150 | 240 | - | 70-80 | 80-90 | | |
| අමු ඉඟුරු | - | 500 | 170 | - | 190-200 | | |
| **සහල්** | | | | | | | |
| රතු නාඩු | 96-115 | 115 | 105 | 106-108 | - | | |
| සුදු නාඩු | 96-120 | 125 | 112-113 | 106-108 | - | | |
| රතු කැකුළු | 84-100 | 100 | 94 | 100 | - | | |
| සුදු කැකුළු | 93-115 | 110 | 104 | - | - | | |
| සුදු කැකුළු සම්බා | 108 | 145 | 125-130 | 130-140 | - | | |
| තම්බපු කැකුළු සම්බා | 110 | - | 125-130 | 138-140 | - | | |
| කීරි සම්බා | 125-200 | 200 | - | 198 | - | | |



### දැනගෙන ගන්න රන් මිල

| | |
|---|---|
| කැරට් 21 | 95912 |
| කැරට් 22- | 100375 |
| කැරට් 24- | 109500 |

# ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය (BES)

# ප්‍රසම්පාදන දැන්වීමයි

## වෛද්‍ය උපකරණ, අමතර කොටස් හා උපාංග සැපයීම

1. කොළඹ 10 ද සේරම් පෙදෙසේ අංක 27 හි, ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වෛද්‍ය උපකරණ අමතර කොටස් සහ උපාංග සැපයීම සඳහා මුද්‍රා තබන ලද ලංසු එම ලංසු භාර ගන්නා (පහත දැක්වෙන) අවසාන දින පෙ.ව. 10.00 තෙක් භාරගනු ලැබේ.

| අංක | අයිතමය | ලංසු ලියවිලි ලබාගත හැකි කාල සීමාව | | භාරගන්නා අවසාන දිනය | BES කාර්යාලයට ගෙවිය යුතු ආපසු ගෙවනු නොලබන ගාස්තුව | ඇස්තමේන්තුගත පිරිවැය (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | | | |
| 01 | 150 Nos. High Flow Oxygen Theraphy Machine | 08.05.2021 | 15.05.2021 | 17.05.2021 | 12,500.00 | 200 |
| 02 | 250 Nos. BI-PAP Machine | 08.05.2021 | 15.05.2021 | 17.05.2021 | 12,500.00 | 200 |

ඉල්ලා ඇති අයිතම සඳහා ගැළපෙන උපාංග අමතර කොටස් සහ වෛද්‍ය උපකරණ සතු ඕනෑම සැපයුම්කරුවෙකු මෙම ප්‍රසම්පාදනය සඳහා සහභාගි වීම සඳහා යෝග්‍යතාව ලබනු ඇත.

2. මේ පිළිබඳ උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ඕනෑම ලංසුකරුවෙකු විසින් මිලදී ගනු ලබන මිල ගණන්/ ලංසු ලිපිලේඛණවල මුද්‍රා තබන ලද ලංසු ඉදිරිපත් කළ යුතුය.
3. මිල ගණන් / ලංසු ලිපිලේඛන ඉහත වගුවේ සඳහන් කාලසීමාව තුළ පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා අතරතුර කොළඹ 10, ද සේරම් පෙදෙසේ අංක 27 හි ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ අධ්‍යක්ෂක (මූල්‍ය) වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංක 011-2691916, 2694479, ෆැක්ස් අංක 0112698317)
4. ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම කොළඹ 10, ද සේරම් පෙදෙසේ අංක 27 හි ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ අධ්‍යක්ෂක (මූල්‍ය) කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.
5. මිල ගණන්/ ලංසු ලිපිලේඛන කොළඹ 10, ද සේරම් පෙදෙසේ අංක 27 හි ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ, අධ්‍යක්ෂක (මූල්‍ය) කාර්යාලයේදී ගාස්තුවක් ගෙවීමකින් තොරව, පරීක්ෂාකර බැලිය හැකිය.
6. කරුණාකර ලංසු ලේඛන සමග සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලද කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කරනු මැනවි.
7. වැඩිදුර තොරතුරු ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ අධ්‍යක්ෂක (මූල්‍ය) වෙතින් විමසා ලබාගත හැකිය.

දුරකථන : 2684732

**සභාපති/ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය, (BES),**
**27, ද සේරම් පෙදෙස,**
**කොළඹ 10.**

# බස්නාහිර පළාතේ,
# පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

**(මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය බස්නාහිර පළාත)**

## දැන්වීමයි

මාර්ග සහ මාර්ග ආශ්‍රිත ඉදිකිරීම් වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම තුළින්, මහජනතාවගේ ප්‍රවාහන කාලය අවම කර, සුව පහසු සහ ආරක්ෂිත මාර්ග පද්ධතියක් උරුමකර දීම මගින්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර, පළාත් අතර සම්පත් බෙදී යාමේ විෂමතාවය අවම කිරීමේ අරමුණ පෙරදැරිව මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඒ අනුව, මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අදාළ වන පහත තනතුරු ඇබෑර්තු සඳහා බස්නාහිර පළාත තුළ වර්ෂ 03 ක ස්ථිර පදිංචිය සහිත, ක්‍රියාශීලී සහ ස්වයං උද්යෝගී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සහකාර කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

**බාහිර අයදුම්කරුවන්**

රාජ්‍ය පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / වාණිජ්‍ය හා ගිණුම් / නීතිය / සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i හෝ ii)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
ii. 'කනිෂ්ඨ කළමනාකාර' සේවා ගණයෙහි I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 අනුව
MM 1-3 : රු. 55,925 - 10 x 1,375 - 15 x 1,910 - 98,325

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**පත්වීමේ ස්වභාවය** : ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

**අමතර ප්‍රතිලාභ** :
❖ රජයේ අනුමත අනෙකුත් දීමනා
❖ රජයේ අනුමත ජීවන වියදම් දීමනාව
❖ වාහන / නිවාස / ආපදා ණය පහසුකම්
❖ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**අයදුම් කිරීම :**

01. ජීව දත්ත තොරතුරු සමග ඥාතීන් නොවන, තමන් පිළිබඳව නිර්දේශ කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්, අධ්‍යාපනික / වෘත්තිමය සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ හා සම්බන්ධ සහතික පිටපත් සහිතව, අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේම, දැනටමත් රජයේ / සංස්ථාවන්හි / ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයේ නියුතු අය, ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙනි.
02. අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි, අදාළ තනතුරු නාමය සඳහන් කළ යුතුය.
03. සියලු අයදුම්පත් 2021.05.20 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථනය - 011-2321990**

# වෙළෙඳ අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි (HM 2-2) පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් සඳහා :**

විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් සහ අවම වශයෙන් වසර 10 ක ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණ සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ සඳහා පිළිගත් ආයතනයක් මගින් සනාථ කරන ලද වාර්තාවක් ලබා තිබිය යුතුයි. ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්දක් සහිත විය යුතුය. තවද, බහුවිධ කණ්ඩායම් මෙහෙයවීම, මානව හා අනෙකුත් සම්පත් නිසි ලෙස සංවර්ධන කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරී සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පංතිය හා ඊට ඉහළ නිලධාරීන් ද්විතීයන පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකිය.

වැටුප් පරිමාණය (HM 2-2) : රු. 93,020/- 12X2,700 = රු. 125,420/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

වයස අවුරුදු 55 ට අඩු, ඉහත සුදුසුකම් සහිත පුද්ගලයින් හට මෙම තනතුරට අයදුම් කිරීමේ හැකියාව ඇති අතර, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් සුදුසුකම් :**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**තනතුර සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :**

❖ 2016-10-27 දිනැති PED 1/2015(i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ.
❖ අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
❖ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
❖ සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙළ :**

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත් අයදුම්පතක් 2021-05-31 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය, 7 වන මහල, සතොස මහ ලේකම් කාර්යාලය, අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ "ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අයදුම්පත" වශයෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ලේකම්,**
**වෙළෙඳ අමාත්‍යාංශය,**
**සතොස මහලේකම් කාර්යාලය,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

**දුර : 011-2110565**

**දිනය : 08-05-2021**

**30 හැවිරිදි විවාහක තරුණියකට වෛද්‍යවරුන්ගේ නිර්දේශය අනුව තම ජීවිතය බේරා ගැනීම සඳහා $B^+$ වකුගඩුවක් අවශ්‍ය වේ.**

*වැඩි විස්තර සඳහා කරුණාකර*

**0768177696 / 0771237018 / 0771482333 / 0772277327**

**අමතන්න.**

සියලුම ප්‍රතිකාර හා වෛද්‍ය වියදම් දැරීමට අපි කැමැත්තෙමු.

## නිවැරදි කිරීමකි

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත් පාලන දෙපාර්තමේන්තුව
## උතුරු මැද පළාත

2021 මැයි මස 01 දින දිනමිණ පුවත්පතේ 13 පිටුවේ පළවූ දැන්වීමේ ඡේද අංක 04 පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පළකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවන්ට මෙයද ඇතුළත් වේ. අනුගාමී වසර 5 ක් තුළ මිලියන 3.5 ට වැඩි වටිනාකමකින් යුත් සමාන ස්වභාවයේ ගොඩනැගිලි කර්මාන්තයක් සාර්ථකව නිමා කර තිබීම හෝ පසුගිය වසර පහ තුළ සමාන ව්‍යාපෘති තුනක නියැළී සිටි තාක්ෂණ නිලධාරියෙකු (NCT Civil/ NVQ5) සේවයේ නියුක්ත කිරීම.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව,**
**පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය (බිම් මහල)**
**හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.**

**පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි**

**1950 සිට**
**දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබට ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011)2 242 9491**

LAKE HOUSE

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
## උතුරු පළාත

### භාණ්ඩ සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

උතුරු පළාතේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | භාණ්ඩ විස්තර | යොමු අංකය | ලංසු ඇපකරය රු. | ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| අ. | කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය (ඩෙස්ක්ටොප් පරිගණක. UPS, ලැප්ටොප් පරිගණක. ලේසර් මුද්‍රණ යන්ත්‍ර, ටැබ්ලට් පරිගණක සහ රූපවාහිනී) | NP/21/02/OE/2021 | 35,000/- | 3,500/- |
| ආ. | ගිනි නිවන උපකරණ ප්‍රසම්පාදනය | NP/21/02/FE/2021 | 3,000/- | 1,000/- |

01. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් තිබිය යුතුය.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් ලංසු ලිපිලේඛනයේ 2 වන කොටසේ - ලංසුකරණ දත්තවල සඳහන් අවම සුදුසුකම් නිර්ණායකයන් සපුරා තිබිය යුතුය. අමතර තොරතුරු, ලංසු ලිපිලේඛනයේ 4 වන කොටසේ ලබා දී ඇත.
04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර, එම ලිපිනයේදී රාජකාරි දිනයන් හි 09.00 පැය හා 15.00 පැය අතර, ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
05. ඉහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021.05.10 වෙනි දින සිට 2021.05.31 වෙනි දින දක්වා 9.00 පැය හා 15.00 පැය අතර ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
06. ලංසු (මුල් පිටපත හා අනු පිටපත) 2021.06.01 වෙනි දින 2.30 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයේ ප්‍රධාන ගණකාධිකාරී කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
07. ඉහත සඳහන් කර ඇති ආකාරයේ ලංසු ඇපකරයක් ලංසු සමග අමුණා එවිය යුතුය.
08. කිසිදු පාර්ශවයකට වන්දි ගෙවීමකින් තොරව ඕනෑම අවස්ථාවක ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමේ හෝ මෙම ලංසු ක්‍රියාවලියේ ලංසුවල කොටසක් පිළිගැනීමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති සතු වේ.
09. කාර්යාල ලිපිනය : පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය ගම්මානය, පන්නයි, යාපනය, උතුරු පළාත.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය ගම්මානය, පන්නයි, යාපනය 40000**
**දුරකථන අංකය : 021-2220812, 021-2220839, www.np.gov.lk**
**ෆැක්ස් : 0212220818, ඊමේල් : capdhsnp@gmail.com**


BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina
Daily News
Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT


LAKE HOUSE

## සමාවෙයං මාමේ

දිරා පත් වූ සාලිය
අශෝකමාලා
ඇත කුස්සියේ
දත් ඇස් මුව
දුමටම කළුවෙච්චී

උයා පියා කවා
සෝදවා අත පය
සතපවා සයනාසන
මත සිහිවුවා
කුණ්ඩලකේෂී

ඔත්පල වෙලා පිළ
මත සාදුකාර දෙන්නට
බුදුන් වඩින තුරු
මඟබලා හාමතේ
මැලවූ මට්ටකුණ්ඩලී

පහර දී ගේ වටේ දුවනා
"කපනවා උඹේ ඇඟිල්ලක්"
දමාගන්නට වාගේ දූගේ
සැමියා අංගුලිමාලේ

පැතිර යන වකුගඩු
අමාරුව හින්දා වතුර
ගැන විමසුමක්
ආණ්ඩුවෙනුයි මාව එව්වේ
නොවේ මම බුදුන්
නොවේ මම සක් දෙවුන්
වෙන දොරකින් මං
අබ හොයන්නං
සාමාවෙයං මාමේ

**නදූෂ මදුරංග**

## හඳ පළුව තනි තරුව

මදහසේ සුදු සේද අන්දා
හදවතේ රුදු තැවුල් බින්දා
ගනඳුරේ නෙක හැඟුම් හංගා
සඳට තරුවක් තනි රකින්නා...

**තත්සරණී කාරියවසම්**



## තුන්කොන් ප්‍රේමය

පොළොව අහසට
පෙම් කරද්දී
ඉර පොළොව
බදාගෙන

**තුෂාරී ජයසිංහ**

## මඟ බලා සිටීම කොහොමත් කළ හැක

කාලෙකට පසු
හිතාගන්නවත් බැරි මොහොතක
මොන තරම් සුපුරුදුද
එහා ගෙදරින් නැගෙන
පිච්ච මල් කට හඬ

ඉර බැස යන මොහොතක
ඇස් දෙක බලාගෙන
"පිච්ච මල් වැටක කාරිය
වැටෙන් එහාටත් සුවඳ දෙන එකය"
ඔබ කීවා මතකද?
ඇත්තටම
දේදුන්නෙන් අප වෙන් කළ
මොහොතත් එතනය

අතීතෙ එමල පෙති
එකින් එක අරගෙන
වැටෙන් එහා කෙනකුට
සුවඳ පුද දෙන එකත්
බොහොම චමත්කාරය

එනමුදු කම් නැත.
පසුතැවී කුමටද?
දරුවන් තිදෙනකු අෑ හට
සිටින වග දැනගෙන
සුපරීක්ෂාකාරීව
එදවස ඔබ කියු වදනට
අරුතක් දිය හැක
නිට්ටාවට සුවවෙන රෝගෙට
මඟ බලා සිටීම කොහොමත් කළ හැක

**ධනංජය බණ්ඩාර**

## යෝධ ගස් යට කුඩා පැළ ගස්

අඳුරු වැසි වනයක
විසල් තුරු ගොමුවක
දෑත් විදලූ යෝධ මවු ගස්
උරා බී ගෙන හොඳම හිරු රැස්
ඌන වර්ධිත ළදරුවන් දැක
නගයි මැසිවිලි ලතාවන් හා

**ඉමල්ක විජේසේකර**



## ස්මාර්ට් ෆෝන් නෑ සමා දෙනවද ටීචර්

මහ උඩින් නියෝගය පොඩි උන්ට ඉගෙනුමට
ඔන්ලයින් පාඩමක් ඇත පුතේ අද රෑට
ලින්ක් එකක් එවලා ඇති බලාපං ගෲපයට
අමාලියි අශේනුයි නෑ ඇයිද පේන්නට

අරන් හනිකට ඇමතුමක් ඇහුව්වේ මං සද්දයට
ඇහුණු මගේ ඉකිබිඳුම පපුව මගේ දවනකොට
අනේ පොඩි ෆෝන් එක ගත්තේද අපි ණයට
"ස්මාර්ට් ෆෝන් නෑ සමා දෙනවද ටීච මට"

ඉකිලලා ඉරිතළපු පපු කුහර තද කරන්
වැලපුනා මගේ පුතේ උඹලාගේ හෙට හිතන්
ජීවිතය දිනිය යුතු මේ කැකුළු මල් තරන්
තැළේවිද වෙන එකෙක් ඇති-නැතිය මතු කරන්

**නිලුෂා දිල්රුක්ෂි**


## දීගෙක ගිය සොකරිට....

තුට්ටු දෙකකට ගත්ත
ඔසරියෙ හැට්ටකද
ඇත දිය වෙලා
සිද්ධ පත්තිනි වැන්න
හැඩ රුව කුස්සි මුල්ලක
හිර වෙලා

සොකරි උඹ ඇඬුවා ඇතියි
දැන්, අදුන් සේරම දිය වෙලා
වන්නමුත් අමතක උනාදෝ
තොට්ලි දහඅත පද්දලා

කාලෙ යනකොට නෑඹුලේ
සවුදමත් ටික ටික හිඟවෙලා
පෑළ දොර ළඟ ඉඳන් කාටද
අතවනද්දිං අහුවුණා.
රෙද්දෙ පල්ලෙන් කඳුළු පිහ පිහ
උඹ හුඟක් කල් ඉවසුවා.
මදැයි දැන් නිවපන් පහන්
වැට, දෙයියො නෑ බං වැඩමලා

**අමාදි සංජනා දසනායක**



ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

සඳට අයිති රෑ යාමේ එපා අහස ගුගුරුවන්න
වැසි වැටිලා මහ පොළවට එපා කඳුළු වගුරවන්න
තනි යහනේ තනියක් නෑ එපා සීත මට දැනෙන්න
තුරුල් වෙන්න අවසර නෑ වැස්ස වලාහක දුවන්න...

තටු සිඳලා තුඩු කඩලා රොන් සිඹින්න නොකිය ඉන්න
හිත බිඳලා නෙතු තෙමලා සිනාසෙන්න නොකිය ඉන්න
හිර කරලා වළකාලා පියාඹන්න නොකිය ඉන්න
මල නොතලා හිස සිඹලා ඉන්නට මට ඉඩ හරින්න...

**රුවින්ද තාරක**

## නිදන සිහින

සයනය පුරා වැතිරෙන්න
ආසයි මටත් සැතපෙන්න
කිසිදා දෑස් නොහරින්න
සිහිනයක ගුළි වී නිදන්න.....

**ඩිල්ෂා හර්ෂණී**





# හුස්ම ඉල්ලන ඉන්දියාව

ඔබ අප කවුරුත් මේ දිනවල මුහුණදෙන විශාලතම ගැටලුව වන්නේ කොරෝනා වසංගතයයි. ලෝකයේ සංවර්ධිත රටවල්, සංවර්ධන වෙමින් පවතින රටවල් ද කිසිදු භේදයකින් තොරව මේ ශෝචනීය ඉරණමට මුහුණදීමට සිදුව ඇත. කොරෝනා ආසාදිතයන් දිනෙන් දින ඉහළ යන අතර, මිය යන සංඛ්‍යාව ද සාපේක්ෂව ඉහළ යමින් පවතී. කොරෝනා වසංගතය හමුවේ දැඩිව අසරණ වූ රටක් ලෙස අද වන විට ඉන්දියාව පත්ව ඇත. අපගේ අසල්වාසී රටක් වූ ඉන්දියාව මුහුණදෙන ඛේදනීය තත්ත්වය ශ්‍රී ලාංකික ජනයාගේ හදටද එක් කරනුයේ දොම්නසකි.

ඉන්දියාවේ කොරෝනා වසංගතයෙහි මුල් කාලයේ ඉතාමත් සුළු ආසාදිතයන් සංඛ්‍යාවක් හමු වූ අතර අද වන විට දිනකට ලක්ෂ 3 ඉක්මවා රෝගීන් හමුවනුයේ කොරෝනා ව්‍යාප්තියේ ප්‍රබලත්වය විදහාපාමිනි. අද වන විට ඉන්දියාවේ රෝහල් කොවිඩ් ආසාදිතයන්ගෙන් පිරී ඉතිරී ගොස් ඇති අතර, බොහෝ රෝගීන් මහමඟ මිය යන තත්ත්වයකට පත්ව ඇත්තේ ඉතාමත් ශෝචනීය අයුරිනි. ඉන්දියාවේ දිනකට කොරෝනා මරණ 2000 - 2500 ඉක්මවා යන අතර, ආදාහනාගාර තුළ ද ඉඩකඩ නැති තත්ත්වයකට පත්ව ඇත. බොහොමයක් ආසාදිත පුද්ගලයන්හට හුස්ම ගැනීමේ අපහසුතාව ඇති වන අවස්ථා වැඩි වී ඇති අතර, ඔවුන්ට අවශ්‍ය ඔක්සිජන් සැපයීමට ඉන්දියානු සෞඛ්‍ය නිලධාරීන් මේ වන විටත් අපොහොසත් වී ඇත්තේ රෝගීන් දිනෙන් දින ඉහළ යන බැවිනි.

ඉන්දියානු ජනයා හඬා වැලපෙමින් තම ආදරණීයන්ගේ ජීවිත අයදිමින් සිටින්නේ දැඩි සේ අසරණ තත්ත්වයකට පත්වය. කොරෝනා ව්‍යාප්තිය ඉතා ඉහළ මට්ටමක පවතින අවස්ථාවක ඉන්දීය සෞඛ්‍ය පද්ධතිය බිඳ වැටීමකට ද ලක්ව ඇත. එය ඛේදනීය තත්ත්වයකට පත්ව ඇත්තේ අවශ්‍ය ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය තරම් පහසුකම් සැපයීමට ඔවුන්ට නොහැකි බැවිනි. හුස්ම ඉල්ලා හඬනා අහිංසක ඉන්දීය ජනතාව කෙතරම් අපහසුතාවකට අසරණභාවයකට පත්ව ඇත්දැයි පුවත් ඔස්සේ අනිකුත් සියලු රටවල් දකිනුයේ නෙත් කඳුළින් පුරවාගෙනය. තම මව්පියන් දූදරුවන් තම දෑස් ඉදිරිපිට මිය යන අවස්ථා බොහොමයකට ඉන්දීය ජනතාවට මුහුණ දෙන්නට සිදුව තිබේ. ඉන්දියාව තුළ අද ඇත්තේ කඳුළු පමණ ය. ඔවුන්ට සතුට පෙනෙන මානයකවත් නැත. කොරෝනා වසංගතය කෙතරම් දරුණුදැයි ඉන්දියාව තුළින් ලොවට කියාපායි. මේ ඔවුන්හට සහායක් අවශ්‍යම මොහොතකි. ලෝකයේ ධනවාදී රටවල් ඉන්දීය ජනතාවට සහායක් වන්නේ නම් ඉතාමත් අගනේය. ජීවිතයක වටිනාකම ජාති, කුල, ආගම් භේදයකින් තොරව තීරණය වේ. එබැවින් ඔවුන්ගේ ජීවිත ද අපගේ ජීවිත මෙන් වටින්නේය. හුස්ම රැකගන්නට වෙහෙස දරන ඒ අහිංසක ජනතාව ආරක්ෂා වේවායි ශ්‍රී ලාංකික අප සැමගේ එකම ප්‍රාර්ථනයයි.

**නවෝදා වීරසිංහ**
**සන්නිවේදන හා කළමනාකරණ අධ්‍යයන පීඨය,**
**නැඟෙනහිර විශ්වවිද්‍යාලය.**

# අදහස පැහැදිලි වුණාට practically මදි

නූතන සමාජ රටාව තුළ සියලුම දැනුම අන්තර්ජාලය මඟින් ලෝකය පුරා සංචරණය වෙද්දී ලාංකේය අනන්‍යතාවක් තියෙන නිර්මාණයක් දුප්පත් වෙන්නේ කොතැනක සිදුවන වරදකින් ද? දුප්පත් සිත්තමක් ළඟ නිර්මාණකරුවන් නතර වන්නේ කුමන හෝ හේතුවක් තිබෙන නිසාවෙන් ද?

සමාජය දෙස නිරීක්ෂණාත්මකව බැලුව හොත් හැමෝටම අදහසක් තිබෙන බව පෙනුනත් ඒ අදහස පැහැදිලි භාවිතයක් සඳහා යොදා ගන්නා බවක් පෙනෙන්නේ නැත. පසුගිය කාලවල සමාජ මාධ්‍ය වෙබ් අඩවිවලින් ඇති වූ සබඳතා නිසා දිවි නසා ගැනීම් අපට අසන්නට ලැබිණි. එයට හේතුව සමාජ මාධ්‍ය ද? එසේනම් ඒවා භාවිත කළ අයගේ ජීවිත පරිඥානය කෙසේද යන්න සොයා බැලිය යුතුය. මේ කාරණය ම තමයි සිතීමේ දුප්පත්කම කියන්නෙත්. මේ දුප්පත්කම තමයි නිර්මාණශීලිත්වයට බලපෑම් එල්ල කරන්නේ. අප උත්සාහ කළ යුත්තේ මීට කලින් කරපු දෙයක කොපියක් නොවී අලුත් දෙයක් නිර්මාණය කිරීම.

> **සමාජය දෙස නිරීක්ෂණාත්මකව බැලුව හොත් හැමෝටම අදහසක් තිබෙන බව පෙනුනත් ඒ අදහස පැහැදිලි භාවිතයක් සඳහා යොදා ගන්නා බවක් පෙනෙන්නේ නැත. පසුගිය කාලවල සමාජ මාධ්‍ය වෙබ් අඩවිවලින් ඇති වූ සබඳතා නිසා දිවි නසා ගැනීම් අපට අසන්නට ලැබිණි.**

එහෙත් යම්විටක ලාංකේය ජන සමාජයට එය හුරු වීමට ටික කලක් ගත වේ. මන්ද වර්තමාන ප්‍රේක්ෂක සමාජයට හුරු කර තිබෙන්නේ ක්ෂණික වටහා ගැනීම් මිස ගැඹුරු තේරුම් ගැනීම් නොවනා නිසා ය. එසේ වන්නේ අප විසින් සාදා ගන්නා සිතීමේ කම්මැළිකමයි. එනිසා ම අප යම් නිර්මාණයක් කිරීමට සූදානම් වන විට මුලින් කරන්නේ සිතීමට ඇති කොටස වෙනුවට එවැනි දෙයක් ලෝකයේ කොහේ හෝ තිබෙනවාදැයි බැලීම යි. ඒ මොහොතේම අපගේ නිර්මාණ දුප්පත් වීමට පටන් ගනී.

එනිසා ම තමන්ට නිර්මාණකරුවකු වීමට අවශ්‍ය නම් අනුකරණයෙන් ඈත් විය යුතුය. අනුකරණයෙන් ඈත් වීම යනු සාර්ථක නිර්මාණශීලී නිර්මාණකරුවකු තුළ තිබිය යුතු සහ එය ජීවිතය තුළ භාවිතයට ගත යුතු කරුණකි.



**ආර්. ඩී. එම්. ටී. පී. රාජකරුණා**
**ජනසන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය,**
**නැඟෙනහිර විශ්වවිද්‍යාලය**

## කෙටි කතාව

# ඩීඑන්ඒ



වැඩ ඇරිලා එන ගමන් ඬේ කෙයා එකෙන් පොඩි එකාවත් අරගෙන කෙළින්ම ගියේ කෙල්ලගේ ඉංග්‍රීසි පන්තිය තියෙන තැනට. පන්තිය ඉවර වෙන්න තව විනාඩි පහළොවක් විතර තියෙන නිසා පන්තියට එපිටින් තියෙන මැයි ගහ යටට වෙලා හිටියේ පොඩි පුතාවත් වඩාගෙන. දවස තිස්සෙම සෙල්ලම් කරලා මහන්සියට ද කොහෙද කොල්ලට උරහිසේම නින්ද ගිහින්.

ගහ යට ඉඳගෙන මං උදේ බුද්ධිකගෙන් ආපු කෝල් එක ගැන හිතුවා.

"මචන් උදේනිගේ ලෝයර් කතා කරා. උදේනි කියනවලු කොල්ලගේ DNA ටෙස්ට් එකක් කරන්නෝනි කියලා"..

ඒ මොකටද..? මං ගත් කටට ම ඇහුවා

"දරුවව ඒකි ළඟට ගන්න.."

"එතකොට කෙල්...."

"අප්පච්චී...". කෙල්ල කෑගහගෙන මං ගාවට දුවගෙන එනකොට මගේ මනෝලෝකෙත් කඩාගෙන වැටුණා..

"අප්පච්චි මල්ලි නිදිද..?" කොල්ලගේ අතින් අල්ලන ගමන් දුව ඇහුවා..

"ඔව්නේ.. මල්ලිට නින්ද ගියානේ අප්පච්චි අතම. යන ගමන් අපි ගෙදරට බඩු මොනාහරි අරන් යං පුතේ.." කෙල්ල ඔළුව වැනුවා.

ෆුඩ් සිටියට ගිහින් ගෙදරට බඩු ටිකකුත් අරගෙන රෑට කන්න කොත්තුවකුත් අරන් අපි බස් එකට නැග්ගා.

මට දැං එකම කතාව හැමෝම අහනකොට කේන්තියි. ඒ වගේම අනුකම්පාවෙන් බලනකොට ලැජ්ජයි. දෙයියනේ මෙහෙම දෙයක් වුණු එකම මිනිහා මංද.. ගෑනු අනුකම්පා කරනවා පිරිමි හිනා වෙනවා. එක අතකට හැමදාම මෙහෙම කළුවරේම ඉන්න තිබ්බා නං හොඳයි, මං හිතුවා.

කොල්ල මගේ කතාවලට හිනා වෙනවා.. පව්, අවුරුදු එකහමාරට මේ අහිංසකයා මොනවා දන්නවද... ටී වී එක දාලා කොල්ලව බිමින් තියලා මං ගියා නාන්න..

මට නානගමනුත් හිතුණේ බුද්ධිකගේ කතාව, කෙල්ල උඹේ කියන්නේ...

කෙල්ල මගේ.. කෙල්ල මගේ.. කෙල්ල මගේ..

එතකොට කොල්ලා...?

නාගෙන ඇවිත් අරන් ආපු කොත්තුව දූට කවලා මාත් කෑවා..

"මට කවදහරි ඔයා වගේම කොල්ලෙක් ඕනේ, දවස තිස්සෙම දඟලන විසේ කරන.."

"එතකොට මට විසේ කරන්න බෑනේ.."

"ඔය විසේ කරන ටික මදෑ..."

කැම්පස් එකේ ඉන්න කාලේ කතා වුණු දෙයක් මතක් වුණා. මිනිස්සු කොයි තරම් ඉක්මනට වෙනස් වෙනවද.... මට ලොකු හුස්මක් ඉහළට ඇදුණා.

* * * * * * * * *

උදේම කෙල්ලව ඉස්කෝලේට දාලා කොල්ලවත් අරන් මං ගියේ බුද්ධික හම්බවෙන්න.

"මොකක්ද බං මේ කතාව," මං කෙළින්ම බුද්ධිකගෙන් ඇහුවා.

"කෙල්ල උඹේ නිසා කෙල්ල උඹට ගන්නලු කොල්ලා අරුගෙලු ඒ නිසා කොල්ලව උදේනිට ඕනෙලු"

"හෙණ ගහන කතාවක් නේ බං මේ දරුවා මගේ බං.. බලපන් මගේ මූණ කටමනේ ඇයි බං මේ ගෑනි මෙහෙම.. ඇත්තටම දුකයි" බුද්ධිකට මූණ දීගන්න බැරි ලැජ්ජාවයි හින්දා මට ඇඬුණා" .

"උඹ කලබල වෙන්නෙපා බං. දැං ළමයින්ගේ අම්මම එහෙම කියනවනං වෙන කරන්න දෙයක් නෑ. DNA ටෙස්ට් එක කරත් ඔප්පු වෙනවනේ. උඹට කොල්ලව දෙන්න වෙනවා "බුද්ධික කිව්වා.

"ඊළඟ නඩුවාරේ කවද්ද"

"ලබන 30 වෙනිදා.".

දරුවත් වඩන් මං ආවා.. අසේල අසේල කියලා බුද්ධික දෙතුන් පාරක් කතා කරත් මං හැරුන්නෑ... තාත්තත් නැතුව මාව උස්මහත් කරපු අම්මටත් ද්‍රෝහී වෙලා මං කසාද බැන්දේ මෙහෙම ගෑනියෙක්ද.. මං එක දිගට කල්පනා කරා. අන්තිමට මං ෆෝන් එක අතට ගත්තා. ෆෝන් ස්ක්‍රීන් එකේ වෙලාව පාන්දර 4.22යි. කාලයක් භාවිතයට නොගත්තු ඒ අංකයට මං කෝල් එකක් ගත්තා. බොහෝ වෙලාවක් රින්ග්ස් ගිහින් අන්තිම මොහොතේ වගේ එහා පැත්තෙන් හෙලෝ කියලා කටහඬක් ආවා.

"මං ඩිවෝස් එකට කැමති නෑ "මං කිව්වා.

"අසේල, පිස්සුද ඔයාට? මොකද්ද වෙලා තියෙන්නේ..? මහ ලොකුවට කිව්වේ එදා එපා කියලා ගියපු ගෑනි ආයි ඕන්නෑ කියලා.

දැං මොකො මේ."

උදේනි කටකොනකින් හිනාවෙන ගමන් ඇහුවා. තවත් හිනාවක් ඇහුණත් මං එච්චර ගණන් ගත්තේ නෑ..

"ඔයාව නං මට කොහොමත් ඕන නෑ.. ආයි මට කවදාවත් ඕන වෙයි කියලා හිතන්නත් එපා." මං කිව්වා..

"එහෙනං මොකද්ද මේ කරන්නේ"

"තමුසෙව ඕන්නැතුවට මට ළමයි දෙන්නා ඕනේ.. දෙන්නා... දෙන්නා... දෙන්නව ම".

උදේනිගෙන් පිළිතුරක් නැතුව විනාඩි දහයක් විතර ගෙවුණා.

"ඩිවෝස් එක ඕනි නම් දරුවා අවශ්‍ය නෑ. දරුවෝ දෙන්නවම මට භාර දෙන්න කැමතියි කියලා මගේ ලෝයර්ට ලිඛිතව දැනුම් දෙන්න. එතකොට තමුන්ට අවශ්‍ය දේ ඉක්මනට ලැබෙයි."

"ඒත් අසේල.??."

මං ෆෝන් එක තිබ්බා.. දරුවගේ ඔළුවට අත තියාගෙනම මං ඇස් දෙක පියා ගත්තා..

30 වැනිදා නඩු වාරෙට යනකොට උදේනිගෙන් දරුවෝ දෙන්නවම මට දෙන්න කියලා ලිඛිත ලියුමක් බුද්ධිකට ලැබිලා තිබුණා. ආයේත් ඇදෙන්න හේතුවක් නැති නිසාම ඊළඟ නඩුවාරෙදී දික්කසාදය ලැබුණා.

උසාවියෙන් මං ආවේ කා දිහාවත් නොබලා. උදේනි කතා කරන්න හැදුවත් මං අහක බලාගෙන ආවා. අවුරුදු හතරක ආදරේ අවුරුදු අටක කසාදේ එහෙම මළගම් යවලා මං උසාවි ගේට්ටුවෙන් එළියට ආවා.

මාස පහකට විතර පස්සේ එක දවසක හවස මහ වැස්සේ දරුවෝ දෙන්නත් වඩාගෙන මං ටවුන් එකේ කඩයක් ගාව හිටියේ ධාරාණිපාත වැස්සේ යාගන්න බැරුව. මහ වැස්සට ඇතුගල හරි ලස්සනට පේනවා.

"අසේල," එක පාරට ආපු කටහඬකින් මං මෙපිට බැලුවා..

"උදේනි"

මට එකපාරට කියවුණා.. උදේනි මහත් වෙලා ඇඟටම හිර උනු කොට ගවුම වැස්සේ හිරිකඩට පෙඟිලා.. කෙල්ලයි කොල්ලයි දෙන්නම නිදි මගේ උරහිසට බර වෙලා. 'හොඳ වෙලාවට' මං හිතින් හිතුවා..

"වැස්සට ඇතුගල හරි ලස්සනයි නේද අසේල." මගෙන් එහෙම අහන ගමන් උදේනි දුවව අතගෑවා. මං හිම්හිට දුවව එහාට හරවගෙන පැත්තකට වුණා..

අහන්න දෙයක් නැතිකමටම මං කොහොමද කියලා ඇහුවා..

"වරදක් නෑ.." උදේනි හිනා වුණා..

මම ආයේම ඇතුගල දිහාට ඇස් තිබ්බා.

"අහම්බෙන් හරි ඔයාව දැකපු එක හොඳයි අසේල... මගේ අතින් ලොකු වැරැද්දක් වුණේ.."

"දැං ඒක ගැන කතා කරලා වැඩක් නෑ.." මං ඇස් අහකට නොගෙනම කිව්වා..

චේතකට දරුවෝ නෑ අසේල. අපි ට්‍රීට්මන්ට් ගන්නකොටයි දැනගත්තේ.. උදේනි එහෙම කියනවත් එක්කම ඇතුගල පැත්තෙන් මහ හෙණයක් ගැහුවා. මං උදේනිගේ මූණ දිහා බලන් හිටියා.

ටිකක් වෙලා බිම බලාගෙන ඉඳපු උදේනි කුඩේ ඉහලුවා.

"මේ දරුවෝ දෙන්නම ඔයාගේ.. මට සමාවෙන්න අසේල. චේතකට හරිහමන් රස්සාවක් නෑ. ඉන්නෙත් කුලියට නිසා මගේ පඩිය ඒවට ඉවරයි. ඒ නිසා දරුවෝ දෙන්නට චොකලට් එකක් අරන් දෙන්නවත් මං ළඟ සල්ලි නෑ අසේල.."

උදේනි අඬනවා.. මට ඒ දිහා නොබලා ඉන්න බැරි වුණා..

"කොහොමත් මට දැං ජීවිතයක් නෑ අසේල.. මං තෝරගත්තු ජීවිතේ මංම විඳවනවා"

උදේනි එහෙම කියලා යන්න ගියා..

මට බරට හීල්ලුණා. දරුවෝ දෙන්නා හීතලට මාව බදාගෙන උරහිසේ නිදි. මං අහේතුකව ම වහින වැස්ස මැද්දේ ඇතුගල දිහාට ආපහු ඇස් තිබ්බා..

යළිඳු කුංචන ජයවීර

---



කාලය වටිනවාය කියා සෑම තත්පරයක්ම මුදල් පසුපස දිවීම වනාහි ද කාලයට වටිනාකමක් එක් කිරීම නොවේ. අප ජීවිතයට වටිනාකම් එක් කළ යුතුය. එවිට වටිනා ජීවිතයක් මිස කාලකණ්ණි යනුවෙන් සම්මත ජීවිතයක් ඔබට හිමි නොවනු ඇත.

# හොඳම තත්පරේ ගෙවෙන තත්පරේද?



ඔබගේ ජීවිතයේ වටිනාම දෙය කුමක්දැයි කෙනකු ඔබෙන් ඇසුව හොත් ඔබේ පිළිතුර කුමක් හෝ දෙයක් එසේත් නැතිනම් කවුරුන් හෝ පුද්ගලයකු විය හැකිය. නමුදු ඔබ කුමක් කීවද විටෙක අපට නොහැඟෙන නමුත් ඔබ මම අප සියල්ලන්ටම වටිනාම දේ අන් කිසිවෙක් නොව මේ ගෙවෙනා තත්පරයි.

තත්පර, මිනිත්තු, පැය, දවස්, මාස, අවුරුදු ආදි වශයෙන් මේ ගෙවෙන්නේ නැවත කිසිදාක අපට නොලැබෙන කාලයයි. කාලය මිල කළ නොහැකිය. එය මිලට ගන්නට ද නොහැකිය. අපට ලැබෙන සෑම තත්පරයකටම අප වටිනාකමක් එක් කළ යුතුය. දුරකතනය, රූපවාහිනිය, සමාජ මාධ්‍ය, මේ සියල්ලටම ඔබ කෙතරම් නිකරුණේ කාලය වැය කරනවාද? ඔබ දන්නවාද 2011 වසරේ එක්සත් රාජධානියේ කළ සමීක්ෂණයකට අනුව අවුරුදු හතරක් හෝ ඊට වැඩි දරුවන් සාමාන්‍යක් ලෙස දවසකට රූපවාහිනිය බැලීමට වැය කරන කාලය විනාඩි 242කි. අපි මේ සොයා යන්නේ කුමක්ද? මෙහි අවසානය කුමක්ද? මෙහි අවසානය සංවර්ධිත එහෙත් ව්‍යාකූල මනසකින් හෙබි මිනිසකු බිහි කිරීමයි.

කාලය වටිනවාය කියා සෑම තත්පරයක්ම මුදල් පසුපස දිවීම වනාහි ද කාලයට වටිනාකමක් එක් කිරීම නොවේ. අප ජීවිතයට වටිනාකම් එක් කළ යුතුය. එවිට වටිනා ජීවිතයක් මිස කාලකණ්ණි යනුවෙන් සම්මත ජීවිතයක් ඔබට හිමි නොවනු ඇත. කාලය සියල්ලන්ටම ලැබෙන්නේ සමානවයි. එහෙයින් මුදල්ම නොව සතුටත්, විනෝදයම නොව වටිනාකම්ද, ගුණ ධර්ම, නැණවත්කම් මේ සියල්ල සමබර කර ගනිමින් ඔබට මට අප සියල්ලන්ටම ගෙවෙන සෑම තත්පරයකටම වටිනාකමක් එක් කිරීමට හැකි වේවායි මේ ගෙවෙන තත්පරයේදී ප්‍රාර්ථනා කරමි.

එස්. එම්. ඒ. ඩී. සමරකෝන්

---

# අසම්මතයෙන් බිඳෙන සැබෑ ප්‍රේමය



වත්මන් සමාජය තුළ ආදරයේ නාමයෙන් සිදු වන මිනීමැරුම් බහුල වී ඇත. එය එසේ සිදු වීම ආදරය යන උතුම් වචනයට පවා සිදු කරන නිගාවකි. වඩාත්ම මෙකී ව්‍යසන සිදු වනුයේ අසම්මත ප්‍රේම සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙනි. මෙවැනි බේදවාචකයන් ආදරය නමින් වෙස්වළා පැමිණිය ද ඒ තුළ සැබෑ ලෙසින්ම ඇත්තේ සංසාරගත වෛරයක් පමණි. මන්ද තම පෙම්වතා හෝ පෙම්වතිය වේවා බිරිඳ හෝ සැමියා වේවා කෙනකුගේ ජීවිතයක් විනාශ කිරීමට තවත් කෙනකු තුළ සිතිවිලි උපදින්නේ පෙර ආත්ම භාවයන් තුළදී පතාගෙන ආ පළිගැනීමක් නිසාමය. අවාසනාවට කාරණය වන්නේ අප එයට ද ආදරය යනුවෙන් නම් තැබීමයි.

ලෝකයේ උතුම්ම දර්ශනය වන බෞද්ධ දර්ශනය අනුව ආදරය යනු පරිත්‍යාගයකි. එහි ප්‍රතිමූර්තිය සිදුහත් යශෝදරා දෙපළයි. සිද්ධාර්ථයන් සුමේධ තාපසයන්ගෙන් ආරම්භ කළ මේ සසර ගමනේ සුමිත්‍රාගෙන් ආරම්භ කළ ඒ පාද පරිචාරිකාව බුද්ධත්වයට පත්වන භවයේ යශෝදරාව වන තෙක් අත්නොහැරියේය. එහෙත් භවයේ නිමාව දකින තුරු මේ දෙපළට ආදරයේ නාමයෙන් සිදු කරන්නට ලැබුණා වූ පරිත්‍යාගයන් කැප කිරීම් අනන්ත අප්‍රමාණය. සිදුහතුන් කුස රජුව ඉපිද පබාවතීව ලබා ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රයත්නය අදහාගත නොහැක. මන්දයත් ඔහු සක්විති රජකම පවා පසෙකලා පබාවතියගේ නිවෙසේ වැරහැලි අඳිමින්, දර දිය අදිමින්, වළං සෝදමින් නොයෙකුත් දුක් ගැහැට වින්දේ පබාවතිය කෙරෙහි වූ අප්‍රමාණ සෙනෙහස නිසාමය.

රඹුකන සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ විසින් රචිත එච්. එම්. ජයවර්ධනයන්ගේ සංගීතයට හසුවුණු ළා දලු බෝපත් ගීතය අපට ඇසෙන විට මහත් වූ සිසිලසක් දැනෙයි. මේ ගීතය තුළින් තරුණ පරම්පරාවට ආදරය ගැන කියා ගන්න හොඳම නිදසුනක් ලෙස පහත සඳහන් ගීතය දැක්විය හැකිය.

*ළා දලු බෝ පත් සෙමින් සැලෙන සේ*
*යශෝදරා දේවී....*
*වාවනු බැරි තැන රහසේ හැඬුවා*
*පෙර සංසාරේ ඇසුර මතක් වී*
*ළා දලු බෝ පත් සෙමින් සැලෙන සේ...*

*ලේන කුලේ සිට ආ ගිය මඟතොට*
*සිටියා නොසැලී පහන් ටැඹක් වී*
*නිවන් දකින තුරු මේ සංසාරේ*
*පසුපස ආවා සෙවණැල්ලක් වී....*

*ළා දලු බෝ පත් සෙමින් සැලෙන සේ....*

*තැලී සෙනේ සිත සැලී හඬන විට*
*වැටී දෙපා ළඟ යශෝදරාවෝ*
*පිපී නිවන් මල් සාධුකාර දී*
*නිවී පහන් විය උදෑසනක් සේ...*

*ළා දලු බෝ පත් සෙමින් සැලෙන සේ....*

මේ ගීතය තුළින් අපට දැනෙන්නේ ආත්ම වූ පරිත්‍යාගයක් පිළිබඳවය. එමෙන්ම ආදරය යනු උතුම් ආත්ම පරිත්‍යාගයකි. ගසක ලස්සන මලක් පිපී ඇති විට අප එයට ආසා කර ඒ මල කඩා ගත්තොත් එය මොහොතකින් මැලවී පරවී යයි. එහෙත් එය ගසේ තිබෙන්නටම ඉඩ හැර ඈතින් සිට වතුර බිඳක් ඉස එහි ලස්සන බලා සිටිය හොත් ඒ මල අයිතිකර ගන්නවාට වඩා වැඩි කාලයක් සුවඳවත්ව ගසේ තිබේ. ආදරය යනුද එවැනිම පරිත්‍යාගයකි. එම පරිත්‍යාගය සුවඳ කළ යුත්තේ අල්ලා ගැනීමෙන් තොරවය. මන්ද අප යම් දෙයක් බලාපොරොත්තුව කිසියම් පරිත්‍යාගයක් සිදු කරනවා නම් ඒ තුළ සැබෑ පරිත්‍යාගයක් නැත. ඒ තුළ ඇති වන්නේ අපේක්ෂා කළ දේ නොලැබීමේ ගැටුමකි. එම නිසා ආත්මාර්ථකාමී අපේක්ෂා විරහිතව පරිත්‍යාගය යන වචනයේ පරිසමාප්තම වූ අර්ථයෙන් යුතුව ආදරයේ නාමයෙන් සිදු කරන පරිත්‍යාගය තුළ ඇත්තේ සැබෑ ආදරයම පමණි.

අංජිකා වාසනා ජයතිලක
භාෂා හා සන්නිවේදන අධ්‍යයනාංශය

2021 මැයි 08 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
2021 මැයි 08 සෙනසුරාදා
සදතතික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

## හුස්ම ඉල්ලන ඉන්දියාව







හොඳම තත්පරේ ගෙවෙන තත්පරේද?

PAGE 05



පින්ලන්තෙ හොඳම නෙවෙයි..

PAGE 07



හඳට පොලු ගහන්න එන්න

PAGE 08

අපි ඔබ ඉලක්ක කරන්නෙමු

**යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.**

එන්න, අපි හරි පාරක් හදමු

**සංස්කරණය - රජිත බස්නායක**

younjanatha@lakehouse.lk

**‘යොවුන් ජනතා’, දිනමිණ**
**අංක 35**
**ලේක් හවුස්**
**ඩී. ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10**

**යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත් younjanatha@lakehouse.lk ලිපිනයට යොමු කරන්න**

## ඕසෝන් වියනත් හිල් කරපු මිනිස්සුන්ට

# ගහකොළ කපන එක කජ්ජක් ද?

පරිසරය කියන්නෙම හරි අපූරු නිමිත්තක්. කුඩා දරුවන් උපන් මොහොතේ පටන් පරිසරය හා බැඳෙයි. කුරුලු ගීත, ගංගා ගලා බසිනා නාදය, ගහකොළ තාලෙකට නැළවෙන ඒ මියුරු සංගීතය සදා සිත් සුවපත් කරවන ඔසුවකි. කුඩා දරුවන් පවා නැළැවෙන්නේ මේ සොබාදම් තුරුලේ යැයි පැවසුවොත් මා නිවැරදියි. සිරිලක කුඩා භූමි භාගයක් වුවත් එහි එක් එක් ප්‍රදේශයන්ට ආවේණික ජෛව විවිධත්වයක් දැකගත හැකිය. මේ අනුව ගහකොළවල ස්වරූපය පමණක් නොව එය නිජබිම් කර ගනිමින් ජීවත් වන සතා සිවුපාවාගේ පවා මේ විවිධත්වය දැකගත හැකිය. මේ විවිධත්වය හේතුවෙන්ම විදේශීය සංචාරකයන් බොහෝ දෙනා ලක්දිව වෙත පැමිණෙයි. රට මැද ඇති සොබා සෞන්දර්යයත් රට වටා ඇති අලංකාර මුහුදු තීරයත් මනස්කාන්ත දසුන් මැවීමට උපන්ගෙයිම හපන්නෝ වෙති. ඒ නිසාම ලංකාවට හිමි සොබා සෞන්දර්යය ලෝක ප්‍රසිද්ධිය ලබා ඇත.

අපගේ පැරැන්නෝ සොබාදහම පණ මෙන් රැක ගත්තෝය. එහි ප්‍රතිඵලයක් ලෙස අදටත් අපට සොඳුරු පරිසරයක් උරුම වෙයි. එහෙත් අද වන විට වර්තමාන පරපුර විසින්ම අපගේ පරිසරය වනසා ගනිමින් පවතී. මහ පොළොව අපට මෙන්ම සතා සිව්පාවාට උරුම යැයි කට වචනයට බොහෝ දෙනා උදම් අනති. එහෙත් වල් අලියෙක් ගම් වැදුනහොත් මරා දැමීමට තරම් අපි කුරිරු වී ඇත්තෙමු. සංවර්ධනය යැයි පවසමින් අහිංසක සතුන්ගේ නිජබිම් විනාශ කරමින් ඒවා අපම අල්ලාගෙන සතුන්ගේ වාසස්ථාන නැති කිරීමට තරම් අප කුරිරු වී ඇත. රට පුරා සිදුවන වනාන්තර විනාශ කිරීම හේතුවෙන් වර්ෂා රටාව ද වෙනස් වෙමින් පවතී. මේ නිසාම විශාල ගොවිබිම් ප්‍රමාණයක් විනාශ වී යනු අපගේ නෙත ගැටෙයි. “ඔක්සිජන් කන්නදැයි“ කටමැත දොඩවමින් ආඩම්බරකාරකම් පෙන්වන අපගේම ඇයන්ට ගහක කොළක වටිනාකම යථාර්ථ සොබාදම් නීතිය පසක් කරමින් සිටී. අහස් කුස සිසාරා නැගුණු ගොඩනැගිලි වෙනුවෙන් මහ පොළොවේ පස් නිධි අප කෙතරම් විනාශ කරන්නට ඇත් ද? ඒවා අපටම සාපයක් වී නායයෑම්, ගංවතුර ආදි ස්වභාවික උවදුරුවලින් පීඩා ගෙනදෙයි. සීමාන්තික නොවූ මුදල් ඉපයීම මත කර්මාන්තශාලා බිහිවන්නේ හතු පිපෙන්නාක් මෙනි. මේවායින් සිදු වන වායු දූෂණය, ශබ්ද දූෂණය පමණක් නොව ජල දූෂණය ද අපමණය. මෙනිසා චර්ම රෝගීන් පමණක් නොව ශ්‍රවණාබාධිතයන් ද බොහොමයක් සිටී. මින් නොනැවතී පිළිකා රෝගීන්ගේ වර්ධනය ද උච්චතම අවස්ථාවකට පැමිණ ඇත.

මහ පොළොව විනාශයෙන් නොනැවතුණු කුරිරු මිනිසා මහ සයුරට ද අභියෝග කළේය. කැළිකසළ අපමණක් මහ සයුරට මුදා හරින්නට මිනිසා කටයුතු කරන්නට විය. අසීමාන්තික ලෙස ජලජ ජීවීන් ගොදුරු කර ගනිමින් ජෛව පද්ධතිය අසමබර කිරීමට කටයුතු කරන්නේ ද මිනිසායි. සංවර්ධනයේ උච්චිතම අවස්ථාව තුළ සිටිමින් අහස් ගැබ සිදුරු කරමින් ඕසෝන් වියන පළුදු කළේ ද මිනිසාමයි. ගොනා පසුපස ඇදෙන කරත්ත රෝදයක් මෙන් මිනිසා විසින්ම කරන ලද සොබාදම් විනාශය නිසා විවිධ රෝගාබාධවලින් පීඩා විඳීමට මිනිසාටම සිදුව ඇත.

දුරදිග නොබලා මිනිසා විසින්ම සිදු කරනු ලබන සොබාදහම් වැනසුම නිසා අද වන විට කඳුළු සලන්නේ ද මිනිසාමයි.

**නිශානි සචින්දිකා රාජපක්ෂ**
**ජන සන්නිවේදන අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**





# විද්‍යාව ළං කරගෙන අතිමේද මොකද වුණේ

කොටියෙන් විග්‍රහ කර බැලුවහොත් මිනිසා නොදන්නා සියලුම දේවල් පරීක්ෂා කර බැලීමත් ඒ අතරින් හසුකරගත් දැනුම හා අවබෝධයත් විද්‍යාව ලෙස හඳුන්වයි. උණුසුම නිසා වාෂ්ප වූ ජලය අහසට නැග යළි වර්ෂාව ලෙස පොළොවට පතිත වන බව දැන ගැනීම හා පැවසීම විද්‍යාව වේ. එමෙන්ම මිනිසාට වැලඳෙන බොහෝ රෝග වයිරස් බැක්ටීරියා ආදි ක්ෂුද්‍ර ජීවීන් හේතු කොටගෙන සිදු වන්නක් බව දැන ගැනීම හා ඒවාට පිළියම් දැන ගැනීම ද විද්‍යාව වේ. එපමණක් නොව ගහකොළ සතා සීපාවා ඇතුළු සමස්ත විශ්වයේම ආරම්භය හා පැවැත්ම පිළිබඳ සොයා ගැනීම ද විද්‍යාව වන්නේය. විද්‍යාව යන විෂය දියුණුවෙන් දියුණුවට පත් වී ඇත. අතීතයේ සිට මේ දක්වා මිනිස් සමාජයට විපුල ඵල ගෙන එමින් පවතී.

විද්‍යාව දියුණුවත්ම මිනිසා පිරිහෙයි ද යන ගැටලුව වර්තමානයේ පැනනැගුනක් නොවේ. බොහෝ අතීතයේ ද වෙනස් වීම නොපිළිගන්නා පිරිස් විද්‍යාවේ දියුණුවත් සමඟ මිනිසා පිරිහෙන බවට අනාවැකි පළ කර තිබේ. නමුත් සිදු වී ඇත්තේ බුද්ධිය වැඩි වන විට ගුණධර්ම ද වැඩි වීමය. අතීතයේ වන සතුන් ලෙස මිනී මස් බුදිමින් ජීවත් වූ මිනිසුන් වර්තමානය වන විට ශිෂ්ටසම්පන්න වී තිබෙන්නේ ද ස්වභාවධර්මයට අනුව ලෝක ජනගහනය කෙතරම් වැඩි වුව ද, ජෛව, ජලල ශිලාල සහ වායු ගෝලවල සමතුලිතතාවත් මේ තරමට පවත්වාගෙන යනු ලබන්නේ විද්‍යාව සහ ඒ ඇසුරෙන් ලත් දැනුම භාවිතයට ගැනීමත් නිසාය.

විද්‍යාව නිසා ලොවට දායාද වූ දැනුම මිල කළ නොහැකි තරම්ය. අතීතයේ පෝලියෝ වසංගතය කුඩා ළමුන් අංශභාග තත්ත්වයට පත් කර ඇත. නමුත් සෞඛ්‍ය විද්‍යා දියුණුවත් සමඟ පෝලියෝ රෝගය ලොවෙන් තුරන් කිරීමට හැකි විය. එය පිරිහීමක් නොව ආශීර්වාදයකි. තමා ලැබූ දැනුම හොර රහසේ භුක්ති විඳි මායා බන්ධකයන් සිටි යුගයකට වඩා තාක්ෂණ දැනුමෙන් ලොව ඇති තතු නිසි දැනගත් සිසු සිසුවියන් රැසක් ලොව පුරා වාසය කිරීම භාග්‍යකි. එය අධ්‍යාපන විද්‍යාවේ දියුණුවයි.

මේ අනුව කල්පනා කර බලන විට මිනිසා පිරිහෙන්නේ දියුණුව නිසා නොව අවිද්‍යාව නිසාය. මිනිසා තමා හා සමාන මිනිසකුට වද හිංසා කිරීම කරනුයේ විද්‍යාත්මකව නොසිතා වනචාරීව කල්පනා කිරීම නිසාය. තම මවුපියන් අමතක කර දමා තමා ද වල්මත් වී සමාජයට පිළිලයක් වන්නේ මෝහය හෙවත් අවිද්‍යාව නිසාය. මේ අනුව විද්‍යාව දියුණු වූවාට ජීවිතයට ළඟා නොකරගන්නා තාක්කල් පුද්ගලයා පිරිහෙන බව නම් සත්‍යයකි.

**නෙහාරා සිරිසේන**



# හුස්ම ඉල්ලන ඉන්දියාව

ඔබ අප කවුරුත් මේ දිනවල මුහුණදෙන විශාලතම ගැටලුව වන්නේ කොරෝනා වසංගතයයි. ලෝකයේ සංවර්ධිත රටවල්, සංවර්ධන වෙමින් පවතින රටවල් ද කිසිදු භේදයකින් තොරව මේ ශෝචනීය ඉරණමට මුහුණදීමට සිදුව ඇත. කොරෝනා ආසාදිතයන් දිනෙන් දින ඉහළ යන අතර, මිය යන සංඛ්‍යාව ද සාපේක්ෂව ඉහළ යමින් පවතී. කොරෝනා වසංගතය හමුවේ දැඩිව අසරණ වූ රටක් ලෙස අද වන විට ඉන්දියාව පත්ව ඇත. අපගේ අසල්වාසී රටක් වූ ඉන්දියාව මුහුණදෙන ඛේදනීය තත්ත්වය ශ්‍රී ලාංකික ජනයාගේ හදටද එක් කරනුයේ දොම්නසකි.

ඉන්දියාවේ කොරෝනා වසංගතයෙහි මුල් කාලයේ ඉතාමත් සුළු ආසාදිතයන් සංඛ්‍යාවක් හමු වූ අතර අද වන විට දිනකට ලක්ෂ 3 ඉක්මවා රෝගීන් හමුවනුයේ කොරෝනා ව්‍යාප්තියේ ප්‍රබලත්වය විදහාපාමිනි. අද වන විට ඉන්දියාවේ රෝහල් කොවිඩ් ආසාදිතයන්ගෙන් පිරී ඉතිරී ගොස් ඇති අතර, බොහෝ රෝගීන් මහමඟ මිය යන තත්ත්වයකට පත්ව ඇත්තේ ඉතාමත් ශෝචනීය අයුරිනි. ඉන්දියාවේ දිනකට කොරෝනා මරණ 2000 - 2500 ඉක්මවා යන අතර, ආදාහනාගාර තුළ ද ඉඩකඩ නැති තත්ත්වයකට පත්ව ඇත. බොහොමයක් ආසාදිත පුද්ගලයන්හට හුස්ම ගැනීමේ අපහසුතාව ඇති වන අවස්ථා වැඩි වී ඇති අතර, ඔවුන්ට අවශ්‍ය ඔක්සිජන් සැපයීමට ඉන්දියානු සෞඛ්‍ය නිලධාරීන් මේ වන විටත් අපොහොසත් වී ඇත්තේ රෝගීන් දිනෙන් දින ඉහළ යන බැවිනි.

ඉන්දියානු ජනයා හඬා වැලපෙමින් තම ආදරණීයන්ගේ ජීවිත අයදිමින් සිටින්නේ දැඩි සේ අසරණ තත්ත්වයකට පත්වය. කොරෝනා ව්‍යාප්තිය ඉතා ඉහළ මට්ටමක පවතින අවස්ථාවක ඉන්දීය සෞඛ්‍ය පද්ධතිය බිඳ වැටීමකට ද ලක්ව ඇත. එය ඛේදනීය තත්ත්වයකට පත්ව ඇත්තේ අවශ්‍ය ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය තරම් පහසුකම් සැපයීමට ඔවුන්ට නොහැකි බැවිනි. හුස්ම ඉල්ලා හඬනා අහිංසක ඉන්දීය ජනතාව කෙතරම් අපහසුතාවකට අසරණභාවයකට පත්ව ඇත්දැයි පුවත් ඔස්සේ අනිකුත් සියලු රටවල් දකිනුයේ නෙත් කඳුළින් පුරවාගෙනය. තම මව්පියන් දූදරුවන් තම දෑස් ඉදිරිපිට මිය යන අවස්ථා බොහොමයකට ඉන්දීය ජනතාවට මුහුණ දෙන්නට සිදුව තිබේ. ඉන්දියාව තුළ අද ඇත්තේ කඳුළු පමණ ය. ඔවුන්ට සතුට පෙනෙන මානයකවත් නැත. කොරෝනා වසංගතය කෙතරම් දරුණුදැයි ඉන්දියාව තුළින් ලොවට කියාපායි. මේ ඔවුන්හට සහායක් අවශ්‍යම මොහොතකි. ලෝකයේ ධනවාදී රටවල් ඉන්දීය ජනතාවට සහායක් වන්නේ නම් ඉතාමත් අගනේය. ජීවිතයක වටිනාකම ජාති, කුල, ආගම් භේදයකින් තොරව තීරණය වේ. එබැවින් ඔවුන්ගේ ජීවිත ද අපගේ ජීවිත මෙන් වටින්නේය. හුස්ම රැකගන්නට වෙහෙස දරන ඒ අහිංසක ජනතාව ආරක්ෂා වේවායි ශ්‍රී ලාංකික අප සැමගේ එකම ප්‍රාර්ථනයයි.

නවෝදා වීරසිංහ
සන්නිවේදන හා කළමනාකරණ අධ්‍යයන පීඨය,
නැඟෙනහිර විශ්වවිද්‍යාලය.

# අදහස පැහැදිලි වුණාට practically මදි

නූතන සමාජ රටාව තුළ සියලුම දැනුම අන්තර්ජාලය මඟින් ලෝකය පුරා සංචරණය වෙද්දී ලාංකේය අනන්‍යතාවක් තියෙන නිර්මාණයක් දුප්පත් වෙන්නේ කොතැනක සිදුවන වරදකින් ද? දුප්පත් සිත්තමක් ළඟ නිර්මාණකරුවන් නතර වන්නේ කුමන හෝ හේතුවක් තිබෙන නිසාවෙන් ද?

සමාජය දෙස නිරීක්ෂණාත්මකව බැලුව හොත් හැමෝටම අදහසක් තිබෙන බව පෙනුනත් ඒ අදහස පැහැදිලි භාවිතයක් සඳහා යොදා ගන්නා බවක් පෙනෙන්නේ නැත. පසුගිය කාලවල සමාජ මාධ්‍ය වෙබ් අඩවිවලින් ඇති වූ සබඳතා නිසා දිවි නසා ගැනීම් අපට අසන්නට ලැබිණි. එයට හේතුව සමාජ මාධ්‍ය ද? එසේනම් ඒවා භාවිත කළ අයගේ ජීවිත පරිඥානය කෙසේද යන්න සොයා බැලිය යුතුය. මේ කාරණය ම තමයි සිතීමේ දුප්පත්කම කියන්නෙත්. මේ දුප්පත්කම තමයි නිර්මාණශීලිත්වයට බලපෑම් එල්ල කරන්නේ. අප උත්සාහ කළ යුත්තේ මීට කලින් කරපු දෙයක කොපියක් නොවී අලුත් දෙයක් නිර්මාණය කිරීම.

> **සමාජය දෙස නිරීක්ෂණාත්මකව බැලුව හොත් හැමෝටම අදහසක් තිබෙන බව පෙනුනත් ඒ අදහස පැහැදිලි භාවිතයක් සඳහා යොදා ගන්නා බවක් පෙනෙන්නේ නැත. පසුගිය කාලවල සමාජ මාධ්‍ය වෙබ් අඩවිවලින් ඇති වූ සබඳතා නිසා දිවි නසා ගැනීම් අපට අසන්නට ලැබිණි.**

එහෙත් යම්විටක ලාංකේය ජන සමාජයට එය හුරු වීමට ටික කලක් ගත වේ. මන්ද වර්තමාන ප්‍රේක්ෂක සමාජයට හුරු කර තිබෙන්නේ ක්ෂණික වටහා ගැනීම් මිස ගැඹුරු තේරුම් ගැනීම් නොවනා නිසා ය. එසේ වන්නේ අප විසින් සාදා ගන්නා සිතීමේ කම්මැලිකමයි. එනිසා ම අප යම් නිර්මාණයක් කිරීමට සූදානම් වන විට මුලින් කරන්නේ සිතීමට ඇති කොටස වෙනුවට එවැනි දෙයක් ලෝකයේ කොහේ හෝ තිබෙනවාදැයි බැලීම යි. ඒ මොහොතේම අපගේ නිර්මාණ දුප්පත් වීමට පටන් ගනී.

එනිසා ම තමන්ට නිර්මාණකරුවකු වීමට අවශ්‍ය නම් අනුකරණයෙන් ඈත් විය යුතුය. අනුකරණයෙන් ඈත් වීම යනු සාර්ථක නිර්මාණශීලී නිර්මාණකරුවකු තුළ තිබිය යුතු සහ එය ජීවිතය තුළ භාවිතයට ගත යුතු කරුණකි.



ආර්. ඩී. එම්. ටී. පී. රාජකරුණා
ජනසන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය,
නැඟෙනහිර විශ්වවිද්‍යාලය

## සමාවෙයං මාමේ

දිරා පත් වූ සාලිය
අශෝකමාලා
ඇත කුස්සියේ
දත් ඇස් මුව
දුමටම කළුවෙච්චී

උයා පියා කවා
සෝදවා අත පය
සතපවා සයනාසන
මත සිහිවුවා
කුණ්ඩලකේෂී

ඔත්පල වෙලා පිළ
මත සාදුකාර දෙන්නට
බුදුන් වඩින තුරු
මඟබලා හාමතේ
මැලවූ මට්ටකුණ්ඩලී

පහර දී ගේ වටේ දුවනා
"කපනවා උඹෙ ඇඟිල්ලක්"
දමාගන්නට වාගේ දූගේ
සැමියා අංගුලිමාලේ

පැතිර යන වකුගඩු
අමාරුව හින්දා වතුර
ගැන විමසුමක්
ආණ්ඩුවෙනුයි මාව එව්වේ
නොවේ මම බුදුන්
නොවේ මම සක් දෙවුන්
වෙන දොරකින් මං
අබ හොයන්නං
සාමාවෙයං මාමේ

**නදූෂ මදුරංග**

## හඳ පළුව තනි තරුව

මදහසේ සුදු සේද අන්දා
හදවතේ රුදු තැවුල් බින්දා
ගනඳුරේ නෙක හැඟුම් හංගා
සඳට තරුවක් තනි රකින්නා...

**තත්සරණී කාරියවසම්**



## තුන්කොන් ප්‍රේමය

පොළොව අහසට
පෙම් කරද්දි
ඉර පොළොව
බදාගෙන

**තුෂාරි ජයසිංහ**

## මඟ බලා සිටීම කොහොමත් කළ හැක

කාලෙකට පසු
හිතාගන්නවත් බැරි මොහොතක
මොන තරම් සුපුරුදුද
එහා ගෙදරින් නැඟෙන
පිච්ච මල් කට හඬ

ඉර බැස යන මොහොතක
ඇස් දෙක බලාගෙන
"පිච්ච මල් වැටක කාරිය
වැටෙන් එහාටත් සුවඳ දෙන එකය"
ඔබ කීවා මතකද?
ඇත්තටම
දේදුන්නෙන් අප වෙන් කළ
මොහොතත් එතනය

අතීතෙ එමල පෙති
එකින් එක අරගෙන
වැටෙන් එහා කෙනකුට
සුවඳ පුද දෙන එකත්
බොහොම චමත්කාරය

එනමුදු කම් නැත.
පසුතැවී කුමටද?
දරුවන් තිදෙනකු ඈ හට
සිටින වග දැනගෙන
සුපරීක්ෂාකාරීව
එදවස ඔබ කියු වදනට
අරුතක් දිය හැක
නිට්ටාවට සුවවෙන රෝගෙට
මඟ බලා සිටීම කොහොමත් කළ හැක

**ධනංජය බණ්ඩාර**

## යෝධ ගස් යට කුඩා පැළ ගස්

අඳුරු වැසි වනයක
විසල් තුරු ගොමුවක
දෑත් විදලූ යෝධ මවු ගස්
උරා බී ගෙන හොඳම හිරු රැස්
ඌන වර්ධිත ළදරුවන් දැක
නඟයි මැසිවිලි ලතාවන් හා

**ඉමල්ක විජේසේකර**



## ස්මාර්ට් ෆෝන් නෑ සමා දෙනවද ටීචර්

මහ උඩින් නියෝගය පොඩි උන්ට    ඉගෙනුමට
ඔන්ලයින් පාඩමක් ඇත පුතේ අද    රෑට
ලින්ක් එකක් එවලා ඇති බලාපං    ගෲපයට
අමාලියි අශේනුයි නෑ ඇයිද    පේන්නට

අරන් හනිකට ඇමතුමක් ඇහුව්වේ මං    සද්දයට
ඇහුණු මගේ ඉකිබිඳුම පපුව මගේ    දවනකොට
අනේ පොඩි ෆෝන් එක ගත්තේද අපි    ණයට
"ස්මාර්ට් ෆෝන් නෑ සමා දෙනවද ටීච    මට"

ඉකිලලා ඉරිතළපු පපු කුහර තද    කරන්
වැලපුනා මගේ පුතේ උඹලාගේ හෙට    හිතන්
ජීවිතය දිනිය යුතු මේ කැකුළු මල්    තරන්
තැළේවිද වෙන එකෙක් ඇති-නැතිය මතු    කරන්

**නිලුෂා දිල්රුක්ෂි**


## දීගෙක ගිය සොකරිට....

තුට්ටු දෙකකට ගත්ත
ඔසරියෙ හැට්ටකද
ඇත දිය වෙලා
සිද්ධ පත්තිනි වැන්න
හැඩ රුව කුස්සි මුල්ලක
හිර වෙලා

සොකරි උඹ ඇඬුවා ඇතියි
දැන්, අඳුන් සේරම දිය වෙලා
වන්නමුත් අමතක උනාදෝ
තොට්ලි දහඅත පද්දලා

කාලෙ යනකොට නෑඹුලේ
සවුදමත් ටික ටික හිඟවෙලා
පෑළ දොර ළඟ ඉඳන් කාටද
අතවනද්දිං අහුවුණා.
රෙද්දෙ පල්ලෙන් කඳුළු පිහ පිහ
උඹ හුඟක් කල් ඉවසුවා.
මදැයි දැන් නිවපන් පහන්
වැට, දෙයියො නෑ බං වැඩමලා

**අමාදි සංජනා දසනායක**



ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

සඳට අයිති රෑ යාමේ එපා අහස ගුගුරුවන්න
වැසි වැටිලා මහ පොළවට එපා කඳුළු වගුරවන්න
තනි යහනේ තනියක් නෑ එපා සීත මට දැනෙන්න
තුරුල් වෙන්න අවසර නෑ වැස්ස වලාහක දුවන්න...

තටු සිඳලා තුඩු කඩලා රොන් සිඹින්න නොකිය ඉන්න
හිත බිඳලා නෙතු තෙමලා සිනාසෙන්න නොකිය ඉන්න
හිර කරලා වළකාලා පියාඹන්න නොකිය ඉන්න
මල නොතලා හිස සිඹලා ඉන්නට මට ඉඩ හරින්න...

**රුවින්ද තාරක**

## නිදන සිහින

සයනය පුරා    වැතිරෙන්න
ආසයි මටත්    සැතපෙන්න
කිසිදා දෑස්    නොහරින්න
සිහිනයක ගුළි වී    නිදන්න.....

**ඩිල්ෂා හර්ෂණී**

# පින්ලන්තෙ හොඳම නෙවෙයි...




අධ්‍යාපනය වූ කලී සියලු දෙනාටම පොදුවේ ලැබෙන දෙයකි. ඒ අතරින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව තුළ දක්නට ලැබෙන දෙයක් වන්නේ නිදහස් අධ්‍යාපනය යි. එනම් මුදල් ගෙවීමකින් තොරව අපට ඉගෙන ගැනීමට අවකාශ සැලසීමයි. ලංකාවේ දරුවකු අවුරුදු හතරේ සිට අධ්‍යාපන සඳහා යොමු කරයි.

පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරන දරුවකු එතැන් පටන් නොකඩවා අවුරුදු දහතුනක් අධ්‍යාපනය හැදෑරීමට පටන් ගනියි. පින්ලන්තය ලොව සාක්ෂරතාව අතින් ඉහළින් ම තැනක සිටිනා රටකි. එම රට තුළ දරුවන්ගේ අධ්‍යාපන ක්‍රමය ඉතා ම වෙනස් ය. ඔවුන් පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරන්නේ වයස අවුරුදු හතේදී ය. කුඩා කාලයේ ඔවුන්ගේ ළමා කාලය විඳීමට ඉඩ දෙන අතර තරග විභාගවලින් ඔබ්බට ගිය විෂය ක්‍රමයක් එරට තුළ දක්නට ලැබේ. මානසික පීඩනයකින් තොරව දරුවාට අධ්‍යාපන කටයුතු කරගෙන යා හැකිය. ඔවුන්ට ජාතික මට්ටමේ විභාගයක් ලෙස පවත්වන්නේ උසස් පෙළ සිසුන් සඳහා වන අවසාන විභාගය පමණකි. තමන්ට කැමති විෂය පථයක් ඔස්සේ ඉගෙනීමේ හැකියාව ඔවුන්ට ලැබී තිබේ.

මේ ක්‍රමය හා සාපේක්ෂව බලන කල ලංකාවේ දරුවන් කුඩා කාලයේ සිටම අධ්‍යාපනයට යොමු කරයි. ඒ අතරතුර ශිෂ්‍යත්වය, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ආදියට මුහුණ දීමට සිදු වෙයි. විශාල පීඩනයකින් යුක්තව දරුවන් අධ්‍යාපනයේ නිරත වන ආකාරයක් දක්නට ලැබේ. අවුරුදු 10 ක දරුවා යනු තවමත් සෙල්ලම් වයසේ පසුවන්නෙකි. නමුත් අද වන විට අප විඳි ළමා ලෝකයේ ඔවුනට ඉඩක් නැත. එයට හේතුව වන්නේ ඔවුන් ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දීමයි. විභාගය සමත් කරවීමට මවුපියෝ අපමණ වෙහෙසක් දරති. එබැවින් මෙය මවුපියන්ගේ විභාගය ලෙස ද හඳුන්වයි. ලංකාව තුළ මෙවැනි විභාග ක්‍රමයක් පැවැත්වීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? බොහෝ දෙනාගේ බලාපොරොත්තුව හොඳ පාසලක් තෝරා ගැනීමයි. ඉහළ පිළිගැනීමක් ඇති පාසලකට තමන්ගෙ දරුවා යොමු කිරීමයි. නමුත් දරුවාට සිදු වන මානසික පීඩනය ගැන ඔවුන් නොසිතයි. දරුවාගේ ළමා කාලය විභාගයක් වෙනුවෙන්ම කැප කරයි.

දකුණු ආසියාවේ ඉහළම සාක්ෂරතාවක් ඇති රට ලෙස හංවඩු ගැසෙන ශ්‍රී ලංකාව තුළ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා ලක්ෂ තුනකට අධික සිසුන් ප්‍රමාණයක් මුහුණ දෙයි. එයින් සමත් වන්නේ සුළු පිරිසකි. විභාගයෙන් පසු හැළෙන සිසුන් ගැන කවුරුත් කතා නොකරති. ගණිතය විෂය නැතිව උසස් පෙළ හැදෑරීමට නොහැකිව සිටින විශාල ප්‍රමාණයක් සිටී. ඒ අතර චිත්‍රවලට දක්ෂ නැටුම් සංගීතය නව නිපැයුම් ආදිය සඳහා දක්ෂ පිරිස් කොතරම් සිටීද? විෂයක් නිසා ඔවුන්ගේ මුළු අනාගතයම අඳුරු වෙයි. එලෙසම පොතේ දැනුම නැති වුවත් විවිධ නිපැයුම්, නව අදහස් ඇති වූවෝ වෙති. එවැනි දරුවන් ප්‍රායෝගික මට්ටමින් ඉහළට ගෙන යෑමට වෘත්තීය අධ්‍යාපනයක් දිය යුතුයි. රටට වැඩදායී පුද්ගලයන් ලෙස ඔවුන්ගෙන් ගත හැකි උපකාරයන් අතිමහත්ය. එබැවින් එවැනි දරුවන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ඔවුන් වෙනුවෙන් ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රමයක් සකස් කළ යුතුය.

සාමාන්‍ය පෙළ සමත් වෙලා උසස් පෙළට මුහුණ දෙන සිසුන් ප්‍රමාණය ලක්ෂ තුනකට අධිකයි. නමුත් එයින් වසරකට විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබන්නේ හතළිස් පන්දහසක් වැනි ඉතාම සුළු පිරිසකි. නමුත් එතැනින් හැළෙන පිරිස් ගැන අවධානය යොමු වීමක් දක්නට නොලැබෙයි. දශම ගණනකින් විශ්වවිද්‍යාලය අහිමි වන සිසුන් බොහොමයකි. යම් පිරිස් විදේශගතව හෝ පෞද්ගලික විශ්වවිද්‍යාල වෙත යොමු වේ. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ලංකාවේ සියලු දෙනාටම එක හා සමාන වත්කමක් නැති බැවින් එලෙස පෞද්ගලිකව අධ්‍යාපනය හැදෑරීමට ඇති අවස්ථා ද ගිලිහෙයි. එවැනි පිරිස කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ට වෘත්තීයම කුසලතාව දිය යුතුය. ස්වයං රැකියාවක් වෙත යොමු කිරීමට ප්‍රතිපාදන වෙන් කොට ඔවුන් දිරිමත් කිරීමක් කළ හැකිය.

විශ්වවිද්‍යාලයට පැමිණීම යනු සියල්ල ලබා ගැනීම හා සමාන නොවේ. විශ්වවිද්‍යාල තුළ අවුරුදු තුනක් හතරක් අධ්‍යාපනය ලබා ඉන් එළියට ගිය පසු රැකියා දියව් කියා බෝඩ් ඔසවාගෙන සිටිය යුතුද? අද වන විට උපාධියක් යනු එක් සුදුසුකමක් පමණි. එය තිබූ පමණට රැකියා ලබා ගත නොහැකිය. එසේ නම් කළ යුත්තේ වෘත්තීය සුදුසුකම් සපුරා ගැනීමයි. උපාධියත් සමගම රැකියාවකට ගැළපෙන ආකාරයට වෘත්තීය සුදුසුකම් එක්කර ගැනීම තුළින් රැකියා දියව් කියා බෝඩ් අල්ලා සිටීමේ අවශ්‍යතාවක් ඇති නොවෙයි.

නමුත් ලංකාව තුළ පවතින්නා වූ මේ ඒකාකාරි අධ්‍යාපන රටාව යම් වෙනස්කම්වලට භාජන කළ යුතුය. මන්ද යත් කටපාඩම් කර විභාගවලට ලිවීම යන ක්‍රමය තුළින් බිහි වන්නේ පොත්ගුල්ලන් පිරිසකි. ඊට පරිබාහිරව සිසුන්ට අනාගත තාක්ෂණය සමඟ ගැටෙන ආකාරයට නව විෂය මාලා ක්‍රම, ප්‍රායෝගික අධ්‍යාපනික ක්‍රම රට ඇති කළා නම් ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් යන ලේබලයෙන් ද ගැලවීමට ඇති ඉඩකඩ වැඩිය.

**සවින්ද්‍යා මධුෂාණි කැකුලාවල**
**ජන සන්නිවේදන අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

# අපේ රටටත් ශක්තිමත් තාරුණ්‍යයක්



තාරුණ්‍යය ගැන අද කතාබහ ඇත්තේ විවේචනයන්ට බරවය. තාරුණ්‍යය සෑම පුද්ගලයාටම පාහේ ජීවිතයට අලුත් පිටුවක් පෙරළන යුගයකි. අභියෝග රැසකට මුහුණ දීමට සිදු වන අවධියක්. කඩඉම් විභාග, ප්‍රථම ආදරය, ප්‍රථම රැකියාව වගේ ජීවිතේ හරි හරියට පටන්ගන්න දණ ගාන්නෙ මේ කාලේ. ඉතින් මේ හැමදේම අස්සේ ජයග්‍රහණ වගේම පරාජයනුත් සෙවණැල්ලක් වගේ පස්සෙන්ම ඉන්න කාලයක් තමයි මේ තාරුණ්‍ය.

තරුණ විසේ අස්සෙ අවිවේකය, අනාගතය පිළිබඳ ඇති දෙගිඩියාව, විවිධ පාර්ශ්ව වෙතිල් එල්ල වන පීඩනය නිසා මානසික රෝගයන් බෝවන රෝගයන් බවට පත්ව ඇත. මෙවැනි අභියෝග නිසා ශාරීරිකව, මානසික සෞඛ්‍ය පිළිබඳව සොයා නොබලා කටයුතු කරන තත්ත්වයකදී ඔබට, ඔබ මහා සාගරය මැද අතරමං වී පෙනෙනතෙක් මානයක උදවු ඉල්ලීමට පුද්ගලයකු හෝ නැවක් නොපෙනෙන අයකු ලෙස හැඟෙනු ඇත. මෙවැනි තත්ත්වයන් කාංසාව ලෙස මනෝවිද්‍යාවේදී හඳුන්වයි.

ඉක්මනින් විඩාවට පත් වීම, මානසික ඒකාග්‍රතාව නොමැති වීම, කලබලකාරී හැසිරීම් රටාව යනාදිය මෙහි රෝග ලක්ෂණ වේ. මෙය සැණෙකින් හට ගන්නා මානසික තත්ත්වයක් නොවේ. දීර්ඝ කාලයක් සිට පවතින මානසික දුර්වලතාවයක ප්‍රතිඵලයකි.

තරුණ බව තුළ ශාරීරික ශක්තිය මැනවින් පිහිටා තිබුණ ද කාංසා තත්ත්වය ප්‍රතිශක්තිකරණයට පවා අභියෝග එල්ල කරනු ලබයි. වර්තමානයේ පවතින කොවිඩ්19 වැනි සමාජ ගැටලු අවස්ථාවලදී ඒවා වැඩි වශයෙන් බලපානු ලබන්නේ තාරුණ්‍යයටයි. ඉදිරි අනාගතය පිළිබද අනියත බියකින් කලයක් තිස්සේ සිටීමට සිදු වීම නිසා ඉච්ඡාභංගත්වයට පත් වන්නන් කටුක මානසික තත්ත්වයකට මුහුණ දේ.

මෙසේ කාංසාව බලපෑම් ඇති කරනවා සේම අපට යම් කටයුත්තක් වඩාත් හොඳින් කිරීමට ඍජුව උනන්දු කරවන සාධකයක් වන අවස්ථාද ඇති විය හැකිය. තම අනාගතය පිළිබඳව ඇති විය හැකි බිය සම්බන්ධයෙන් සිතමින් සිටින විට එයට හොඳින් මුහුණ දීමට පෙර සූදානම් වීම මීට කදිම නිදසුනකි.

අප සමහර විටෙක ඉවතලන දෑ තවත් වේලාවක බෙහෙතට අවශ්‍ය වන බව සිංහල ජනප්‍රවාදයේ පැවත එන ඔවදනකි. එසේ කාංසාවද ඔබට ඔබගේ ජයග්‍රහණයේ මූලික සලකුණ වන අවස්ථා ඔබට අත්විඳීමට හැකිවීම ඉතා සුලබ කරුණක් වනු ඇත.

කාංසාව ඔබ රෝගියකු හෝ නරක පුද්ගලයකු ලෙස සලකණු ලැබීමට තුඩු දෙන කරුණක් නොවේ. එය ඔබට ඔබගේ මනස හරි මගට ගැනීමට ලැබෙන අනතුරු ඇඟවීමකි. දැනට රටේ තිබෙන තත්ත්වය සෑම පුද්ගලයකුටම මෙම අවස්ථාවේදී සමානව අත්විඳීමට සිදු වන ගැටලුවකි. එය අප තේරුම් ගත යුතුය. මෙම මානසික තත්ත්වය තමා තුළින්ම පහසුවෙන්ම කෙටි කාලයක් තුළ නිරාකරණය කර ගත හැකිය. නමුත් එය පාලනය කර ගත නොහැකි බව වැටහුන හොත් මෙම මානසික තත්ත්වය පිළිබඳව තම පවුලේ අය, සමීපතම යහළුවකු හෝ මනෝ උපදේශකයකුගෙන් උපදෙස් පැතීම යෝග්‍ය වේ.

කෙසේ වෙතත් කොවිඩ්19 පමණක් නොව ජීවිතයට මොනයම් ආකාරයේ වුව අභියෝගයකට, ගැටලුවකට මුහුණ දීමට තරම් අප රටේ තාරුණ්‍ය ශක්තිමත් ය. එබැවින් මේ ගෙවෙන කාලය තුළ කාංසාවට පරාජය නොවී බලාපොරොත්තු ඉටු කර ගන්න පියවරක් ඉදිරියට තබමු.

**ටී. එන්. නිලක්ෂි**

# හඳට පොළු ගහන්න එන්න



දේශ ගවේෂකයකු වූ වස්කෝද ගාමා ක්‍රි.ව. 1498දී වනමලින් සැරසීගෙන ලෝකයට වහන් වී සිටි "ඉන්දීය යුවතිය" සොයාගත් තැන් පටන් ඇගේ පරිණාමය හරි අපූරුය...

කැලිකට් නගරය මුවදොර කොටගෙන සමස්ත ලෝකයේ ම ඇසට නිරාවරණ වූ ඉන්දියාව පසු කලකදී පෘතුගීසි - ඉංග්‍රීසි ආගමනයන් ඔස්සේ ගත කළ කාල පරිච්ඡේදයන්ගේ අසීරුතාව සුළුපටු නොවේ. එනමුත් විසිඑක් වන සියවස වන විට "ඉන්දියාව" තම ස්වාධීන ගමන්මග මොනවට එළිපෙහෙළි කර ගනිමින් ස්වයංපෝෂිත ජීවන අර්ථ ක්‍රමයකට කාලයාගේ ඇවෑමෙන් ගමන්කොට තිබේ...

TATA, Mahindra, Airtel, බජාජ් වැනි ලෝ පතළ සන්නාමයන්ගේ සිට මුකේෂ් අම්බානි ආසියාවේ මහා ධන කුවේරයා ලෙස ලෝක ධනවතුන් අතරට එකතු වීම, ඉන්දියාවේ නැඟී සිටීම පිළිබඳ ජීවමාන උදාහරණ සපයයි.

යටත්විජිතයක්ව පැවති සමයේ අධිරාජ්‍යවාදීන්ගේ භාණ්ඩ අමුද්‍රව්‍ය ප්‍රවාහනය පිණිස ඉන්දියාව තුළ ස්ථාපනය කරන ලද මංමාවත් පද්ධති - දුම්රිය ගමනාගමනය ඇතුළු තාක්ෂණ - සන්නිවේදන අනුභූතීන් ඔස්සේ නිර්මාණය වෙමින් පැතිර ගියේ "මහත්මා ගාන්ධිගේ" "සුරේන්ද්‍රනාත් බැනර්ජි" ගේ ස්වදේශික චින්තනයයි.... දේශීය නිෂ්පාදන දිරිමත් කළ යුතු බවට උපන් උදාර ගීත රාවයයි...

කපු රෙදි කඩක් ගත දවටාගත්, ගතින් වයෝවෘද්ධ මුත් මාහැඟි ජීවයක් මනසින් දරා සිටි ගාන්ධිතුමන්ගේ ස්වදේශික නිෂ්පාදන ඇගයීමේ චින්තනය බලගැන්වීමේ ව්‍යාපාරය දූරදර්ශී දැක්මක් ලෙසින් ක්‍රියාත්මක වූයේ අනාගත භාරත මාතාවට පවා සෙවණ සැලසෙන ආකාරයටයි.

හිරු නොබසිනා අධිරාජ්‍යයේ "හිරු රැසින්" තම ජාතික චින්තනයේ සියපත් පුබුදුවාගත් ඉන්දියාව අද වන විට මෙවැනි සදාහරිත ශක්තිමත් රාජ්‍යයක් බවට පත්ව තිබීම එසේ හෙයින් විස්මය දනවන්නක් නොවේ...

චකිතය ඇති වන්නේ කලාපීය හිතවතුන් ලෙස සමාන දුක්මුසු කාලයන් - වාලුකාවන් පසුකර ආ නමුත් සැලකිය යුතු පිම්මකින් නව ලොව ජයගත් ආසියාව අබියස ලංකාව පමණක් අදට ද සංවර්ධනයේ අත්පොත් කියවමින් ඉඳුල් කටගාමින් සිටීම පිළිබඳවයි....

සාක්ෂරතාව විෂයෙහි ඉහළ මිනුම් අගයක සලකුණ සහිතව වුවත්, අතිශය මන්දගාමී ලෙසින් සිදුවන සමාජ- ආර්ථික විකාශනයක කොටස්කරුවන් ලෙස දුක්බිත ස්ථානයක අප තවමත් නතර වී සිටී.

රට තුළ නිබඳවම පවතින දේශපාලනික ආර්ථික අස්ථාවරභාවය සිය නුවණින් නොඉවසන උගතුන්ගේ බුද්ධිගලනයත්, දැක්මක් සහිත ප්‍රතිභාපූර්ණ මිනිසුන් ජරාජීර්ණ සමාජ ක්‍රමය තුළ සක්‍රිය වීමට දක්වන පැකිළීමත් හේතුවෙන් කරළිය මත දක්නට ලැබෙන්නේ ද ගලන ගඟෙන් දිය දෝතක් බොන්නට සූදානම් අවස්ථාවාදීන්ම මිස උඩුගං ගලා පිහිනීමට වෙර දරන්නන් නොවේ.

1969 වර්ෂයේදී අභ්‍යවකාශගාමීන් වූ නීල් ආම්ස්ට්‍රෝංග්, මයිකල් කොලින්ස්, එඩ්වින් ඕල්ඩ්‍රින් සඳ තරණය කිරීමේ මෙහෙයුමක නිරත වනුද, නීල් ආම්ස්ට්‍රෝංග් ලොව ප්‍රථම සඳගාමියා ලෙස ඉතිහාසයට එක්වෙනුද ට්‍රාන්සිස්ටර රේඩියෝවෙන් හෝ කැසට් ටේප් රෙකෝඩරයෙන් එදා අසා දැනගත් අප, අද වන විට චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ එසැණ රූප ලෙස මුළු විශ්වයම කාලයේ බාධාවෙන් පවා තොරව අපගේ ඇස් මායිමට කැඳවා ගැනීමට තරම් භාග්‍යවන්තයන් බවට පත්ව ඇත....

අන්තර්ජාලය - ස්මාට් දුරකතනය වෙතට ලෝක තාක්ෂණය මඟින් අපගේ සන්නිවේදන කර්තව්‍යය විතැන් කොට ඇත.

ඇපලෝ 11 යානයේ සඳගමනය ට්‍රාන්සිස්ටර රේඩියෝවෙන් දැන හැඳිනගත් අප අද STS - 51 යානය අභ්‍යවකාශගතවනු අන්තර්ජාලය ඔස්සේ වඩාත් තීව්‍ර හා සියුම්ව දැන ගනී, දැක ගනී.

ඒ ලෝක තාක්ෂණයේ දායාදයයි. එනමුත් ලෝකයට දෙන්නට හෝ පෙන්වන්නට රටක් වශයෙන් අප කිසියම් හෝ දියුණුවක් පරිචයක් ලබාගෙන ඇති මානය කුමක්ද? ඉසව්ව කොතනද?

ආර්ථික - සමාජ විද්‍යාත්මක - භෞතික හෝ ආධ්‍යාත්මික වශයෙන් අපගේ මිනුම් අගය සැලකිය යුතු විපර්යාසයකට බඳුන් වී ඇත්දැයි යන්න සොයා බැලීමට විපරමක් අවශ්‍ය නොවන්නේද?

සුප්‍රසිද්ධ ගුණදාස මලලසේකර ශබ්දකෝෂයේ ඩොලරය යන්නට හැඳින්වීම සඳහා "ලංකා රුපියල් පහක පමණ වටිනාකමකි"යන්න වරහන් කොට සඳහන් කර තිබීමේ සිට දශක කිහිපයකට පසු අද දවස වන විට ලංකා රුපියල් එකසිය අනූඅටක අගයක් දක්වා ඩොලරය සිය ආර්ථික අරමුණු දික්විජය කොටගෙන තිබේ.

එහෙත් අපි තවම කොතැනද,

සමකාසන්න රටක් වීම තුළ පරිසර පද්ධතියෙන් නිතර ලැබෙන සහයෝගාත්මක අතහිත දීමත්

- ගිනිකඳු - අනවරත ජල ගැලීම් - භූමිකම්පා - සෘතු විපර්යාසයන්ගෙන් තොර වීමෙන් ලැබෙනා සැනසිලිදායක ඉසිඹුවත් සලකා බලමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය තුළ පවතින අඛණ්ඩ මන්දගාමීත්වය පිළිබඳව සිතා බැලීමේදී සිහියට නැඟෙන්නේ සම්මානලාභී කවියකු වන රුවන් බන්දුජීවයන්ගේ කවියකින් උපුටනය කොට ගත් පහත වදන් ඇමිණුමයි.

"සුබ ප්‍රාර්ථනා තුඩුවේදිත් නැව් ගිලෙන බව ඇත්තයි"

හතර වටින් සමුද්‍ර දායාදය ඇතුළුව භූ විෂමතාවයෙන් පවා වරදාන වරප්‍රසාද ලද මුත් එකතැන පල්වන ලංකාව වනාහි සුබ ප්‍රාර්ථනා තුඩුවෙහිදී පවා ගිලී යමින් පවතින නෞකාවක් ම නොවන්නේද?

■ චාමිකා අරවින්දි



2021 මැයි 08 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.